


අපි නිරතුරුව ප්‍රගතිය කරා පිය නගමු

நாம் தொடர்ந்தும் தினமும் வளர்ச்சிப் பாதையில்

WE CONTINUE TO GROW EACH DAY



# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT
# 2015





NLDB

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

தேசிய கால்நடை வன அபிவிருத்தி சபை

National Livestock Development Board



වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

# ANNUAL REPORT 2015















## WE CONTINUE TO GROW EACH DAY

*It is with great esteem that we approach our 43rd year as the leading producer and manufacturer of livestock in Sri Lanka. NLDB manages 30 livestock and crop integrated farms*

*having built a reputation for revamping and preserving the livestock industry with coconut plantations.*

*A training centre was established to impart knowledge and educate farmers on the theoretical and practical aspects of farming. At NLDB we take growth seriously and continue to incorporate the finest business ethics and maintain stringent standards as an industry leader.*

*Therefore it with great ambition, unshakable focus and unparalleled positivity, that we continue to grow each day.*

## පටුන


| | |
|---|---|
| දර්ශනය, මෙහෙවර | 06 |
| ඇමතිතුමාගේ පණිවිඩය | 09 |
| නියෝජ්‍ය අමාත්‍යතුමන්ගේ පණිවිඩය | 11 |
| සභාපතිතුමන්ගේ පණිවිඩය | 13 |
| නියෝජ්‍ය සභාපතිතුමන්ගේ පණිවිඩය | 15 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 17 |
| කළමණාකාර මණ්ඩලය | 18 - 19 |
| ගොවිපල පිහිටි ස්ථාන | 20 |
| විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව | 21 |
| මෙහෙයුම් සමාලෝචනය | 22 -31 |
| මූල්‍ය ප්‍රකාශන | 32 - 125 |
| මානව සම්පත් ක්‍රියාකාරකම් | 126 - 129 |




වාර්ෂික වාර්තාව 2015

## உள்ளடக்கம்


| | |
|---|---|
| தொலைநோக்கு,குறிக்கோள் | 132 |
| அமைச்சரின் செய்தி | 135 |
| பிரதித் அமைச்சரின் செய்தி | 137 |
| தலைவரின் அறிக்கை | 139 |
| பிரதித் தலைவரின் அறிக்கை | 141 |
| பணிப்பாளர் சபை | 143 |
| முகாமைத்துவ அணியினர் | 144 - 145 |
| பண்ணைகள் அமைந்துள்ள இடங்கள | 146 |
| ஆய்வறிக்கை மற்றும் முகாமைத்துவ குழு | 147 |
| செயற்பாட்டு மிளாய்வு | 148 -157 |
| நிதி அறிக்கை | 158 - 255 |
| ஆண்டிற்கான மனிதவள செயற்பாடுகள் | 256 - 259 |










## CONTENTS


| | |
|---|---|
| Vision, Mission | 260 |
| Message from Minister | 263 |
| Message from Deputy Minister | 265 |
| Chairman's Statement | 267 |
| Deputy Chairman's Statement | 269 |
| Board of Directors | 271 |
| Management Team | 272 - 273 |
| Location of the Farms | 274 |
| Report of the Audit & Management Committee | 275 |
| Review of Operation | 276 - 285 |
| Financial Report | 286 -379 |
| Human Resourse Activities | 380 - 383 |


අපි නිරතුරුවම
ප්‍රගතිය කරා පියනගමු





## දර්ශනය

ජනතාවගේ සමාජ හා ආර්ථික තත්වයන් වැඩි දියුණු කිරීම සදහා ගුණාත්මක අභිජනන ද්‍රව්‍ය හා කෘෂි නිෂ්පාදන නිපදවන ශ්‍රී ලංකාවේ හොදම ස්ව පැවැත්මක් ඇති ආයතනය බවට පත් වීම.

## මෙහෙවර

- පශු සම්පත් හා කිරි නිෂ්පාදනයෙන් රට ස්වයංපෝෂිත කිරීමේ අරමුණු ඇතිව ගොවීන් වෙත බෝ කිරීම සදහා සතුන් නොකඩවා නිකුත් කිරීමට සාධාරණ කාල පරිච්ඡේදයක් තුල දී පශු සම්පත් කටයුතු දියුණු කිරීම.

- ආයතනයේ පිරිවැටුම හා ලාභදායිතාවය වර්ධනය කිරීම සදහා නව තාක්ෂණය උපයෝගි කර ගනිමින් පශු සම්පත් හා ක්ෂිර නිෂ්පාදන සංවර්ධන කිරීම.

- රටේ කෙටිකාලීන භෝග නිෂ්පාදන වැඩසටහනට අනුබල දෙනු පිණිස තෝරාගත් ගොවිපොල වල කෙටිකාලීන භෝග වගාකිරීම.

- පශු සම්පත් හා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ප්‍රශස්ත නිෂ්පාදන මට්ටම ළගාකර ගැනීම.

- පශු සම්පත් හා භෝග ඒකාබද්ධ ගොවිපල ක්‍රමය තුලින් උපරිම ඵලදායීතාවයක් ලබා ගැනීමට හා පරිසර හිතකාමී වගා ක්‍රම අනුගනය කිරීම.

- තෘප්තිමත් ශ්‍රම බලකායක් ඇතිව විවිධ කෘෂි දේශගුණික කලාප තුල ස්ව පැවැත්මකින් යුතු පශු සම්පත් හා භෝග ඒකාබද්ධ ගොවිපල සමූහයක් පවත්වාගෙන යෑම.



## පොදු අභිමාතාර්ථ

- පොල් මුලාශ්‍රිත කර්මානත වලින් ලැබෙන අතිරික්ත මුදල් උපයෝගී කර ගනිමින් එහි පැවැත්ම සදහා ගොවිපලවල් වල සියලුම ක්‍රියාකාරකම් ප්‍රශස්ත මට්ටමකින් පවත්වා ගෙන යාම.
- සාර්ථකව වෙළදපොල තරග කිරීම සදහා පිරිවැය අඩු කිරීමට හා නිෂ්පාදනය දියුණු කිරීමට වඩා හොද කළමනාකරණ ප්‍රතිපත්ති සමග නව තාක්ෂණය විශේෂඥ දැනුම සහ ප්‍රාග්ධනය හදුන්වා දීම.
- පුද්ගලික අංශයේ සහභාගිත්වය ඇතිව මෙම ගොවිපල ඒකක ලාභදායි ව්‍යාපාර බවට පත් කිරීම සදහා වඩා හොද අලෙවි උපාය මාර්ග සමග නව වෙළදපොලක් ඇති කිරීමේ හැකියාව සොයා බැලීම.

## ප්‍රධාන ක්‍රියාකාරකම්

- පශු සම්පත් අභිජනනය හා සංවර්ධනය.
- බෝ කිරීම සදහා හොද තත්ත්වයේ සතුන් සාධාරණ මිලකට ගොවීන්ට නිතුක් කිරීම.
- උපරිම ලාභයක් ඉපයීම සදහා ප්‍රශස්ත මට්ටමින් පොල් වගාව පවත්වාගෙන යාම.
- හැකියාව ඇති ස්ථානවල පශු සම්පත් භෝග ඒකාබද්ධ ගොවිපලවල් ක්‍රියාත්මක කිරීම.
- ගොවින්ට, පාසල් සිසුනට, කෘෂි කර්මාන්තයේ නියැලි නිළධාරින්ට සහ විශේෂයෙන් කුඩා පරිමාණයේ සතුන් ඇති කරන්නන් හට පුහුණු වැඩසටහන් හා ප්‍රදර්ශන පැවැත්වීම.
- සාධාරණ මිලකට හොඳ තත්වයෙන් ගොවිපල නිෂ්පාදන සැපයීම සඳහා අලෙවිසැල් පවත්වාගෙන යෑම.
- ඉහළ ලාභ පරතරයක් ලබාගැනීම සඳහා ගොවිපලවල නිෂ්පාදන අමුද්‍රව්‍ය භාවිතා කරමින් වටිනාකම එකතු කරන ලද භාණ්ඩ නිපදවීම.
- ජනතාව අතර නැවුම් එළකිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම සඳහා ජනතාවට නැවුම් එළකිරි අලෙවි කිරීම.



**පී. හැරිසන්**
ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍ය

***"ශ්‍රී ලාංකේය ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය නගා සිටුවීම උදෙසා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය, පශු සම්පත් නිෂ්පාදනය වර්ධනය කිරීම මෙන්ම කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවර්ධනය වෙනුවෙන් කැපවෙමින් තිරසාර ගැමි ආර්ථිකය තුලින් ඉසුරුමත් දැයක් බිහි කරලීම මාගේ එකම අභිලාශයයි".***



වාර්ෂික වාර්තාව 2015

## ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය

ශ්‍රී ලාංකේය ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය නගා සිටුවීම උදෙසා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය, පශු සම්පත් නිෂ්පාදනය වර්ධනය කිරීම මෙන්ම කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවර්ධනය වෙනුවෙන් කැපවෙමින් තිරසාර ගැමි ආර්ථිකය තුලින් ඉසුරුමත් දැයක් බිහි කරලීම මාගේ එකම අභිලාශයයි.

ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය තුලින් ග්‍රාමීය ජීවනෝපාය නඟා සිටුවමින්ද පශු සම්පත් ක්ෂේත්‍රයන් සංවර්ධනය තුලින් නිෂ්පාදන ඵලදායීතාවයෙන් සමන්විත සත්ව ගහනයක් ඇති කරලීම මඟින් දේශීය සෞඛ්‍යාරක්ෂිතභාවය තහවුරු කිරීමද, කිරි ගොවියා ශක්තිමත් කරමින් කිරි නිෂ්පාදනයෙන් රට ස්වයංපෝෂිත කරලීමද, ආර්ථික මධ්‍යස්ථාන ජාලය සවිමත් කොට කෘෂිකාර්මික නිෂ්පාදන මිල තිරසාර මට්ටමක පවත්වාගෙන යාමත්, දේශීය වී නිෂ්පාදනය සඳහා ස්ථාවර මිලක් ලබා දෙමින් ගොවියා මෙන්ම රට සහලින් ස්වයංපෝෂිත කරලීම උදෙසා යහපාලන ආණ්ඩුව යටතේ නිසි තීන්දු තීරණ ලබා දෙමින් තිරසාර සංවර්ධනය වෙනුවෙන් කටයුතු කිරීමට මා ඔබ වෙනුවෙන් බැදී සිටිමි.

**පී. හැරිසන්**
ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍ය



**එම්.එස්.එස් අමීර් අලී**
ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය

***"පරිසර හිතකාමීව පොල්, කෙටිකාලීන භෝග නිෂ්පාදනය හා ගොවිපළ සංවර්ධනය තුළින් කිරි නිෂ්පාදනය වර්ධනය කර ගනිමින් ඵලදායී ශ්‍රම බලකායක් මැනවින් කළමණාකරණය කර ගනිමින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හෙට දිනයේ සඵලදායීම රාජ්‍ය ආයතනය වශයෙන් ඉදිරි පියවර තබනු ඇතැයි උදක්ම විශ්වාස කරමි."***





## ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය

2015 වාර්ෂික වාර්තාව සඳහා අදහස් දැක්වීමට ලැබීම මා ලද භාග්‍යක් සේ සලකමි. නව්‍ය තාක්ෂණය උපයෝගී කරගනිමින් යහපාලන රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව කිරි නිෂ්පාදන සංවර්ධනය තුළින් ශ්‍රී ලාංකීය ජාතිය ස්වයංපෝෂිත කිරීම සිය මෙහෙවර කර ගත් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, පශු සම්පත් ක්ෂේත්‍රයේ පුරෝගාමියා වශයෙන් සිදු කරනු ලබන අගනා මෙහෙවර පැසසිය යුතුය.

පරිසර හිතකාමීව පොල්, කෙටිකාලීන භෝග නිෂ්පාදනය හා ගොවිපළ සංවර්ධනය තුළින් කිරි නිෂ්පාදනය වර්ධනය කර ගනිමින් ඵලදායී ශ්‍රම බලකායක් මැනවින් කළමණාකරණය කර ගනිමින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හෙට දිනයේ සඵලදායීම රාජ්‍ය ආයතනය වශයෙන් ඉදිරි පියවර තබනු ඇතැයි උදක්ම විශ්වාස කරමි.

පශු සම්පත් ක්ෂේත්‍රයේ නිෂ්පාදනයන් වඩාත් ගුණාත්මක බවින් හා උසස් ප්‍රමිතියෙන් යුතුව වෙනස්වන පාරිභෝගික අවශ්‍යතා හඳුනා ගනිමින් තරගකාරී වෙළඳපළ ජයග්‍රහන අත්පත් කර ගනු පිණිස ගරු අමාත්‍යතුමන්ගේ මග පෙන්වීම යටතේ සභාපතිතුමන්ගේ නායකත්වයෙන් යුතුව දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති හා ඉදිරි ව්‍යාපෘති සියල්ල අතිශයින් සාර්ථකත්වය කරා ගෙන යාමට හැකිවෙනු ඇත.

ශ්‍රී ලාංකීය ජාතිය උදෙසා සිදු කරනු ලබන සුවිශාල කාර්ය භාර්ය උදෙසා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සභාපතිතුමන් අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමුඛ සමස්ථ කාර්ය මණ්ඩලය වෙත හෘද්‍යාංගම සුභාෂිංෂණය පතමි.

**එම්.එස්.එස් අමීර් අලී**
ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය



**මහාචාර්ය එච්.ඩබ්.සිරිල්**
සභාපති

***"ශ්‍රම වෙළඳපල තුල පවතින කම්කරු ශ්‍රමය හිග වීම මණ්ඩලීය ගොවිපලවල් හී දෛනික කටයුතු පවත්වාගෙන සෘජුව බලපාන සාධකයක්ව ඇත. එබැවින් එම අභියෝගතා ජය ගැනීම සදහා එළබෙන වසර තුල යන්ත්‍ර සූත්‍ර භාවිතය වැඩි කිරීම තුලින් මණ්ඩලීය කාර්යයන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව කර ගැනීමට අපේක්ෂා කෙරේ."***





## ගරු සභාපතිතුමාගේ පණිවිඩය

2015 වාර්ෂික වාර්ථාව අප මහත් අභිමානයෙන් යුතුව ඉදිරිපත් කරනෙමු. මෙරට පශු සම්පත් ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සිදු කරන්නාවු කාර්ය භාර්ය අති මහත්ය. ඒ අතර ඕස්ට්‍රේලියානු රජය හා එක්ව සිදුකල ප්‍රධාන ආයෝජන ව්‍යාපෘතියක් වන ඕස්ට්‍රේලියානු කිරි ගවයින් ගෙන්වීමේ දෙවැනි අදියර වන කිරි ගවයින් 2500 ක් රිදියගම ගොවිපල වෙත ආනයනය කල අතර එම ගොවිපල පරිසර සංරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූලව නවීන තාක්ෂණික ක්‍රම යටතේ පවත්වා ගෙන යනු ලබන රජය සතු නවීන ගොවිපලක් බව අභිමානයෙන් සදහන් කල යුතුය.

උසස් තත්වයේ තෘණ බීජ ඕස්ට්‍රේලියාවෙන් ආනයනය කර උඩරට ගොවිපලවල් වෙත හා රිදියගම ගොවිපලවල්හි ව්‍යාප්ත කර වඩා උසස් තත්වයේ තෘණ ආහාර දෙනුන් වෙත ලබා දීමට කටයුතු කර ඇත. මහා භාණ්ඩාගාරයේ සහාය ඇතිව කැනඩාවෙන් ආනයනය කරන ලද උසස් තත්වයේ සූකර මව් සතුන් අපගේ හොරකැලේ ගොවිපල වෙත ලබා දී ඇති අතර එමගින් උසස් වර්ගයේ ඌරන් මෙරට ව්‍යාප්ත කිරීමට සැළසුම් කර ඇත. ඉදිරියේදී මාටින් ගොවිපල වෙතද මෙම උසස් තත්වයේ ඌරන් ආනයනය කිරීමට සැළසුම් කර ඇත.

ශ්‍රම වෙළඳපල තුල පවතින කම්කරු ශ්‍රමය හිග වීම මණ්ඩලීය ගොවිපලවල් හී දෛනික කටයුතු පවත්වාගෙන  යාමට සෘජුව බලපාන සාධකයක්ව ඇත. එබැවින් එම අභියෝගතා ජය ගැනීම සදහා එළබෙන වසර තුල යන්ත්‍ර සූත්‍ර භාවිතය වැඩි කිරීම තුලින් මණ්ඩලීය කාර්යයන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව කර ගැනීමට අපේක්ෂා කෙරේ.

ඒ අනුව එළබෙන වසරේ සිට මණ්ඩලීය ගොවිපල වලින් යන්ත්‍රානුසාරයෙන් දොවනු ලබන කිරි යන්ත්‍රානුසාරයෙන් මුදවා පාරිභෝගිකයින් වෙත ඉතාම සෞඛ්‍යාරක්ෂිත මට්ටමකින් ලබා දීමට සැලසුම් කර ඇත. ඒ සදහා මණ්ඩලීය පොළොන්නරුව ගොවිපලෙහි යන්ත්‍රානුසාරයෙන් මී කිරි, පානීය යෝගට් , යෝගට් හා චීස් නිෂ්පාදනය කිරීම සදහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට දිගු කාලයක් තම ශ්‍රමය කැප කල අභ්‍යාසලාභී හා දෛනික වැටුප් පදනම මත සේවය කල සේවකයන් 13 දෙනෙකුට මණ්ඩලීය ස්ථිර සේවයට අනියුක්ත කිරීමට කටයුතු සිදු කරන ලදි.

ගරු අමාත්‍යතුමාගේ නියෝජ්‍ය අමාත්‍යතුමාගේ හා අප අමාත්‍යාංශයේ මගපෙන්වීම හා මෙහෙයවීම යටතේ සිදු කලා වු දැවැන්ත කාර්ය්‍ය භාර්යයන් සදහා අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු කළමණාකාරිත්වයේත් සමස්ථ කාර්යය මණ්ඩලයේත් සාමුහික දායකත්වය පැසසිය යුතුය.

කවදත් දේශිය නිෂ්පාදනය අගය කරනු ලබන ශ්‍රී ලාංකීය ජනතාවට ඉදිරි වසර තුළදී වඩාත් පෝෂ්‍යදායී සෞඛ්‍යාරක්ෂිත පශු නිෂ්පාදන ලබා දීම සදහා ගරු අමාත්‍යතුමා ඇතුළු අප සියළු දෙනා ම ඇප කැප වී සිටින බව අභිමානයෙන් සනිටුහන් කරමු.

**මහාචාර්ය එච්.ඩබ්.සිරිල්**
සභාපති - ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය



**චන්න ප්‍රබෝධ පලන්සූරිය**
නියෝජ්‍ය සභාපති

*" පාරිභෝගික ජනතාව වෙත ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලීය නිෂ්පාදන සෞඛ්‍යාරක්ෂිතව ලබා දීමේ අරමුණින් යන්ත්‍රානුසාරයෙන් දොවනු ලබන කිරි යන්ත්‍රානුසාරයෙන්ම මුද්‍රවාපු කිරි ,යෝගට් හා චීස් බවට පත් කිරීම සඳහා පොළොන්නරුව ගොවිපලෙහි කිරි සැකසීමේ යන්ත්‍ර ස්ථාපිත කිරීමට මෙම වසරේදී පියවර ගනු ලැබීය. ඉතාම කෙටි කාලයක් තුලදී එම ප්‍රථිලාභ පාරිභෝගික ජනතාවට ලැබෙනු ඇත. "*





# නියෝජ්‍ය සභාපතිතුමාගේ පණිවිඩය

2015 වසරේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්ථාව සඳහා පණිවිඩයක් නිකුත් කරන්නේ මහත් සතුටිනි.

ශ්‍රී ලංකාව කිරි නිෂ්පාදනයෙන් ස්වයං පෝෂිත කිරීම සඳහාත් ගොවි ජනතාව වෙත වඩාත් දියුණු අභිජනන ද්‍රව්‍ය ලබා දෙමින් පශු සම්පත් කේෂ්ත්‍රය ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හරහා අභිනව රජයේ වැඩ පිළිවෙල ගණනාවක් දියත් කරන ලදි.

එම වැඩපිළිවල අතරින් ප්‍රථම වරට ශ්‍රී ලංකාව තුල පරිසර පාලන ස්ථානගත කරමින් ශ්‍රීත දේශගුණයන්ට ආවේණික කිරි ගවයින් 2500 ක් අම්බලන්තොට රිදියගම ගොවිපලේ ස්ථානගත කර අභිජනන කටයුතු සඳහා යොදා ගැනීම පශු සම්පත් කේෂ්ත්‍රයේ සිදු කරන ලද විප්ලවීය වෙනසක් බව අභිමානයෙන් සනිටුහන් කරමි.

පාරිභෝගික ජනතාව වෙත ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලීය නිෂ්පාදන සෞඛ්‍යාරක්ෂිතව ලබා දීමේ අරමුණින් යන්ත්‍රානුසාරයෙන් දොවනු ලබන කිරි යන්ත්‍රානුසාරයෙන්ම මුදවාපු කිරි ,යෝගට් හා චීස් බවට පත් කිරීම සඳහා පොළොන්නරුව ගොවිපලෙහි කිරි සැකසීමේ යන්ත්‍ර ස්ථාපිත කිරීමට මෙම වසරේදී පියවර ගනු ලැබීය. ඉතාම කෙටි කාලයක් තුලදී එම ප්‍රථිලාභ පාරිභෝගික ජනතාවට ලැබෙනු ඇත.

වසා දැමීම සඳහා පිඹුරුපත් සකසා තිබූ ශ්‍රී ලංකා ලිබියා කෘෂිකාර්මික සමාගම සහ මහවැලි සත්ව නිෂ්පාදන සමාගම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කළමණාකාරිත්වය යටතේ නැවත ලාභ ලබන ආයතන බවට ජනතාව වෙත සුරක්ෂිත කර දීමට හැකිවීම රාජ්‍ය ප්‍රතිපත්ති යටතේ ගරු අමාත්‍යතුමාගේ නායකත්වයෙන් අමාත්‍යාංශයේ හා අධ්‍යක්ෂක මණ්ඩලයේ නිසි මගපෙන්වීමත් කාර්යය මණ්ඩලයේ කැපවීමත් නොවන්නට මෙම ජයග්‍රහන යථාර්ථයක් නොවනු ඇත.

අප සභාපතිතුමන්ගේ ඉදිරි මග පෙන්වීම යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය තව තවත් ශක්තිමත්ව ඵලදායීව සිය සාර්ථකත්වය කරා පියනගිනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

**චන්න ප්‍රබෝධ පළන්සූරිය**
නියෝජ්‍ය සභාපති - ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය









# අධ්‍යක්ෂ මණ්ඩලය



මහාචාර්ය එච්. ඩබ්ලිව්. සිරිල්
සභාපති



චන්න ප්‍රබෝධ පලන්සූරිය
නියෝජ්‍ය සභාපති



ඒ. ජී. නිශාන්ත
අධ්‍යක්ෂක



ඒ. පුංචිහේවා
අධ්‍යක්ෂක



සුමිත් වීරසූරිය
අධ්‍යක්ෂක



කේ.කේ වසන්ජි
අධ්‍යක්ෂක

# කළමණාකරන මණ්ඩලය



**ඩී.යු ජයවර්ධන**
සාමාන්‍යාධිකාරී



**එන්.පී.සී ඒකනායක**
සහකාර සාමාන්‍යාධිකාරී
මූල්‍ය



**එම්.ඩී කරුණාතිලක**
සහකාර සාමාන්‍යාධිකාරී
සැලසුම් හා අහාර ප්‍රවර්ධන



**අයි.බී.ඩබ්.එල් ගුණවර්ධන**
සහකාර සාමාන්‍යාධිකාරී
කලාප I



**කේ.ඒ.පී පද්මසිරි**
සහකාර සාමාන්‍යාධිකාරී
කලාප II



**ඩී.බී.ඩබ්. ධර්මරත්න**
සහකාර සාමාන්‍යාධිකාරී
කලාප III



වාර්ෂික වාර්තාව 2015

කළමණාකරන මණ්ඩලය



**ඒ.එම්.පී.ඒ අධිකාරී**
සහකාර සාමාන්‍යාධිකාරී
කලාප IV



**පී.ඒ.අයි. ගනේපොල**
සහකාර සාමාන්‍යාධිකාරී
කලාප V



**එම්.එම්. ෆාරිස්**
සහකාර සාමාන්‍යාධිකාරී
කලාප VI



**කේ.ජී.ජේ.එස් දිස්නක**
සහකාර සාමාන්‍යාධිකාරී
පශු



**එස්.ඒ.එස් තෙවරප්පෙරුම**
පරිපාලන කළමණාකාරිණී



**එම්.ආර් රුවන් තිලකසිරි**
කළමණාකරු
අභ්‍යන්තර විගණන

# ගොවිපල පිහිටි ස්ථාන








# විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව.

විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයන් අධ්‍යක්ෂ මණ්ඩලය අතරින් පත්කෙරෙන අතර එහි කමිටු සමාජිකයින් සමන්විත වනුයේ රාජ්‍ය ව්‍යාපාර සදහා වූ යහපාලන මාර්ග උපදේශන සංග්‍රහයේ 7.4.1. වගන්තියට අනුකූලව, විධායක නොවන අධ්‍යක්ෂකවරු තුන් දෙනෙකුගෙන් යුත් කමිටු සමාජිකයන් ගෙන් වන අතර,එහි සභාපති ලෙස කටයුතු කරනුයේ මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂකවේ .

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම සදහා; විගණකාධිපති දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් විගණන නියෝජිතයකුද, අමාත්‍යාංශය නියෝජනය කරමින් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකද කමිටුවේ නිරීක්ෂකයන් ලෙස සහභාගී වන අතර එය කැදවීම මණ්ඩලයේ අභ්‍යන්තර විගණක විසින් සිදු කරනු ලබයි.

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම සදහා අවස්ථානුකූලව අවශ්‍ය පැහැදිලි කිරීම් ලබාගැනීම , යෝජනා ලබා ගැනීම සහ ක්‍රමවේද නිවැරදි කර ගැනීමට අවශ්‍යය උපදෙස් හා දැනුවත් කිරීම සදහා සාමාන්‍යාධිකාරී ඇතුලු මණ්ඩලයේ අංශ ප්‍රධානින් සහභාගි කරවා ගැනීම සිදු කරනු ලබයි .

## විගණන හා කළමනාකරණ කමිටුවේ ප්‍රධාන කාර්යයභාරය සහ වගකීම.

1. අභ්‍යන්තර විගණන අංශයේ කාර්යයන් හා වගකීම් සමාලෝචනයට ලක් කිරීම.
2. මුල්‍ය හා මුල්‍ය නොවන ක්‍රියාකාරකම් සදහා වන පාලන ක්‍රම ඇගයීමට ලක් කිරීම හා සමාලෝචනය කිරීම සහ එය වැඩි දියුණු කිරීමට අදාල නිර්දේශ ඉදිරිපත් කිරීම.
3. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන වාර්තා සහ අභ්‍යන්තර විගණන වාර්තාවල සදහන් විශේෂිත විගණන කරුණු සම්බන්ධයෙන් කරුණු සමාලෝචනය කිරීම.
4. ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මුල්‍ය වාර්තා ඉදිරිපත් කරන්නේද යන්න සමාලෝචනය කිරීම.
5. මුල්‍ය හා මුල්‍ය නොවන ක්‍රියාකාරකම් පවතින නීති රීති හා චක්‍ර ලේඛන වලට එකග වේද යන්න සමාලෝචනය කිරීම.
6. පිරිවැය හා නාස්තිය අවම කර ගනිමින් කාර්යය සාධනය වැඩි කිරීමට මග පෙන්වමින් අදාල කරුණු කළමණාකාරිත්වයට වාර්තා කිරීම .
7. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සහ අභ්‍යන්තර විගණන අංශයේ වාර්තා මගින් අනාවරණය වන කරුණු සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියා මාර්ග හා ඉදිරියේදී එවැනි දෑ ඇති නොවීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම .

## 2015 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්ය සාධනය.

ආයතනයේ කාර්යක්ෂමබව සහ ඵලදායිත්වය වර්ධනය කිරීමට හැකිවන අයුරින් අභ්‍යන්තර පාලනක්‍රම ඇගයීමට ලක්කර, එම පාලන ක්‍රම නිවැරදි කර ගැනීමෙන් පිරිවැය හා නාස්තිය අවම කර ගැනීමට හැකිවන ආකාරයට යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කල අතර අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තාවල ප්‍රධාන කරුණු සමාලෝචනයට ලක් කරමින් එවැනි දෑ ඇතිවීමට හේතු වූ කරුණු සොයාබලා නැවත එවැනි දෑ ඇතිවීම වැලක්වීමට හා අවම කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග නිර්දේශ කර ඇත. තවද අධක්ෂක මණ්ඩලයට මෙම කරුණු වාර්තාකර එමගින් කළමණාකාරිත්වයට සහය දක්වා ඇත .තවද 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා විගණකාධිපති විසින් ඉදිරිපත් කල විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග අධ්‍යක්ෂක මණ්ඩලය වෙත නිර්දේශ කර ඇත .

2015 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම සහ එම කාර්යයන් කර ගෙන යෑම සදහා සභාපතිතුමන්, උප සභාපතිතුමන් සහ අධ්‍යක්ෂ මණ්ඩලයද, සාමාන්‍යාධිකාරී ඇතුලු අනෙකුත් කාර්යය මණ්ඩලය දැක් වූ සහයෝගය කමිටුව වෙනුවෙන් ඉතා අගය කොට සලකමි.

**ඒ .පී .නිශාන්ත**
විගණන හා කළමනාකරණ කමිටු සභාපති.



# 2015 දී සිදු කළ ප්‍රධාන සංවර්ධන ක්‍රියාකාරකම්

# 2015 දී සිදු කළ ප්‍රධාන සංවර්ධන ක්‍රියාකාරකම්

**1) කිරි ගවයන් ආනයනය කිරීම.**

ශ්‍රී ලංකා කිරි නිෂ්පාදන සංවර්ධන ව්‍යාපෘතියේ දෙවන අදියරේ, දෙවන පියවර යටතේ යුරෝපීය ජර්සි(Jersey) සහ J x F දෙමුහුන් සම්භවයක් ඇති ගර්භණී කිරි දෙනුන් 2500ක් රිදීයගම ගොවිපළට 2015 ජුලි සහ ඔක්තෝම්බර් මාස වල දී ආනයනය කරනු ලැබීය.

2015 වසර අවසන් වන විට මෙම ව්‍යාපෘතිය යටතේ රිදීයගම ගොවිපළ නවීන කිරි ගොවිපළක් වශයෙන් සංවර්ධනය කළ අතර ඒ සඳහා ආසන්න වශයෙන් ඇමරිකන් ඩොලර් මිලියන 21ක් පමණ ආයෝජනය කෙරිණි. දැනට සියලුම ආනයනික සතුන් සහ අලුත උපන් පැටවුන්ව විශේෂිත පරිසර තත්ව යටතේ පාලනය කර ගෙන යනු ලැබේ. කිරි ලබා ගැනීම. ප්‍රජනනය සහ පෝෂණය ආදී ගොවිපළ තුළ සිදුවන ප්‍රධාන ක්‍රියාකාරකම් විශේෂිත පරිගණක වැඩසටහන් හරහා අධීක්ෂණය කරනු ලබයි.





මණ්ඩලය ගොවිපළෙන් දිනකට කිරි ලීටර් 36,000ක් නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වන අතර ඉදිරියේ දී සාමාන්‍යයෙන් එක් කිරි එළදෙනෙකුගෙන් දිනකට කිරි ලීටර් 18ක් ලබා ගැනීමට බලාපොරොත්තු වෙයි.

**2) පොල් ත්‍රිකෝණයට අයත් ගොවිපළවල් වල කිරි නිෂ්පාදන ධාරිතාව වැඩි දියුණු කිරීම.**

මණ්ඩලය විසින් දැනට කිරි ගොවිපළවල් වල තිබෙන කිරි නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා ආනයනික ගවපට්ටි වල ඉපදුණු යුරෝපීය සම්භවයක් ඇති එළදෙනුන් කඳුකර සහ රිදීයගම ගොවිපළවල් වලටත් පොල් ත්‍රිකෝණයේ ගොවිපළවල් වලටත් හඳුන්වා දීමට තීරණය කර තිබේ. 2015 වසර අවසන් වන විට සතුන් 115ක් පොල් ත්‍රිකෝණය තුළ තිබෙන ගොවිපළවල් වලට මාරු කර යවා තිබෙන අතර ඔවුන් මේ වන විට හොඳින් හැදෙමින් සිටියි. ඉදිරියේ දී යුරෝපීය ගව පැටවුන් පොල් ත්‍රිකෝණය තුළ අපි ගොවිපළවල් වල හොඳින් රැකබලා ගැනීම සඳහා දැනට පවතින යටිතල පහසුකම් ද වැඩි දියුණු කර තිබේ.

**3) Bovine ශුක්‍රාණු ආනයනය**

2015 දී, ප්‍රවේණිගත bovine ශුක්‍රාණු 6000ක ප්‍රමාණයක් ස්වීඩනයේ දෙමුහුන් ජර්සි (Jersey) සහ ෆර්සියන් (Frision) ගවයන්ගෙන් ලබාගෙන ආනයනය කිරීමට මණ්ඩලයට හැකි විය. ඒවා ආනයනය කළ ගවයින් හට කෘතිම සිංචනය කිරීමේ අරමුණ ඇතිව ආසන්න වශයෙන් රුපියල් මිලියන 8.7ක් වැය කොට මෙම වැඩසටහන යටතේ ආනයනය කරන ලදී.





**4) තෘණ සංවර්ධනය**

ශ්‍රී ලංකා කිරි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පවත්වාගෙන යන උඩරට හා දකුණු පළාත් වල ක්‍රියාත්මක ගොවිපළවල් සඳහා 2015 වසර තුළ දී 2800කට තෘණ හා ආහාර සඳහා බීජ ඕස්ට්‍රේලියාවේ සිට ආනයනය කරන ලදී. මේ සඳහා මණ්ඩලය ආසන්න වශයෙන් රුපියල් මිලියන 3ක් වැයකර ඇත.

**5) සුකර (ඌරු) සංවර්ධනය**

දේශීය ඌරු ගොවීන්ගේ ඉහළ ඉල්ලීම සපුරාලීම සඳහා මණ්ඩලය මගින් 2015 වසරේ දී කැනඩාවේ සිට දෙමුහුන් ඌරන් 21ක් ආනයනය කර ඇත. එම ආනයනය කරන ලද ඌරන් ආරක්ෂාකාරීව සංරක්ෂණය කර පවත්වාගෙන යනු ලබයි. මෙම ව්‍යාපෘතිය සඳහා ඌරන් ආනයනය සඳහා මණ්ඩලය විසින් රුපියල් මිලියන 10ක් වැය කර ඇත.

ආනයනය කරන ලද මුහුන් ඌරන් පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ:

| වර්ගීකරණය | පිරිමි | ගැහැණු |
|---|---|---|
| ඩියුරොක් | 01 | 11 |
| ලාර්ජ් වයිට් | - | 05 |
| ලෑන්ඩ් රේස් | - | 05 |
| එකතුව | 1 | 21 |







## 6) කිරි හා මස් සැකසුම් සංවර්ධනය

### 6.1. මී කිරි සැකසුම් නිෂ්පාදනය හඳුන්වා දීම.

අනාගතයේ දී මී කිරි නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා මී ගවයන් 1000කින් සමන්විත මී ගව ගොවිපළක් ලෙස පොළොන්නරුව ගොවිපළ 2015 වසරේ සිට පවත්වාගෙන යාමට මණ්ඩලය තීරණය කොට ඇත. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා පැයකට මී කිරි ලීටර් 1000කින් යුත් ධාරිතාවක් යොදා ගනිමින් මී කිරි නිෂ්පාදනාගාරයක් සැකසීම සඳහා මණ්ඩලය මගින් මිල ගණන් කැඳවන ලදී. මෙම යෝජිත නිෂ්පාදනාගාරය ඉදිකිරීමේ සියලු කටයුතු 2015 වසර අවසානයේ අවසන් කර ඇත.




### 6.2. කිරි ටොෆි යන්ත්‍ර හඳුන්වා දීම.

2015 තුළ දී කිරි ටොෆි වල ගුණාත්මකභාවය හා විකුණුම් ප්‍රමාණය ඉහළ නැංවීමේ අරමුණින් මණ්ඩලය මගින් ගල්පොකුණ ගොවිපළ සඳහා කිරි ටොෆි සැකසුම් යන්ත්‍ර මිල දී ගැනීමට අදාළ සැපයුම් කරුවන්ගේ මිල ගණන් කැඳවීමට තීරණය කරන ලදී.




### 6.3. මස් සැකසුම් නිෂ්පාදනය හඳුන්වා දීම.

NLDB අලෙවි මධ්‍යස්ථාන හරහා තරගකාරී දේශීය වෙළඳ පොළක් සඳහා ඌරු මස් නිෂ්පාදනය ලබාදීමේ අදහසින් මාර්ටින් ගොවිපළ ආශ්‍රිතව මස් සැකසුම් නිෂ්පාදනාගාරයක් ස්ථාපිත කිරීමට රජය තීරණය කර ඇත. 2015 වසර අවසන් වන විට යෝජිත සැකසුම් නිෂ්පාදනාගාරය ඉදිකිරීමේ කටයුතු අවසන් කර ඇති අතර අවශ්‍ය යන්ත්‍ර හා උපකරණ මිල දී ගැනීම සඳහා අදාළ සැපයුම්කරුවන් වෙතින් මිල ගණන් කැඳවා ඇත.

## 7) සත්ව ආහාර නිෂ්පාදනය

රිදීගම ගොවිපළේ සිටින ආනයනය කරන ලද ගවදෙනුන් සඳහා අවශ්‍ය වන ගව ආහාර සඳහා යන වියදම අවම කර ගැනීමට 2015 වසරේ දී මණ්ඩලය විසින් සත්ත්ව ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා වීරවිල ගොවිපළ ආශ්‍රිතව ගව ආහාර මෝලක් හඳුන්වා දී ඇත.








## 8) නව විශේෂ පශු සම්පත් හඳුන්වා දීම

2015 වසරේ දී ජනතාවගේ ඉහළ ඉල්ලුම සපුරාලීම සහ පශු සම්පත් නිෂ්පාදනය වැඩි දියුණු කිරීමේ අදහසින් NLDB ගොවිපළවල් මගින් පහත සඳහන් සත්ත්ව විශේෂ හදුන්වා දී ඇත.






| අනු අංකය | ගොවිපල | සත්ව කාණ්ඩ |
|---|---|---|
| 1. | සිරිංගපාත | කළුකුමා |
| 2. | රොසිටා | හාවා |
| 3. | මැල්සිරිපුර | තාරාවා |
| 4. | ගල්පොකුණ | වලි කුකුළා |
| 5. | රුක්කත්තන | යාපනය බැටළුවන් |
| 6. | හාරගම | වටු කුරුල්ලා |

## 9) පොල් වගා සංවර්ධනය

ඉදිරි වසර පහ තුළ දී ක්‍රියාත්මක වන පරිදි NLDB වගා කිරීමේ වැඩ සටහන් යටතේ පොල් වගාව සඳහා, වසර පහක සැලැස්මක් සකස් කිරීමට හා අනාගතයේ දී NLDB සතු සියලු පොල්වතු මෙම වැඩසටහන යටතේ පොල් නිෂ්පාදනය පවත්වාගෙන යාමට මණ්ඩලය විසින් අපේක්ෂා කර ඇත. අනාගතයේ දී 93%න් සාරවත් පොල් වගාවක් වැඩි දියුණු කර ගැනීමට NLDB මගින් 2015 වසරේ දී තීරණය කොට ඇත.














| අංකය | ගොවිපල | පොල් ගස් සඳහා පොහොර යෙදීම් ක්‍රියාවලියේ ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|
| | | එලදරණ ශාක | % | නොපීදුනු ශාක | % |
| 1 | කොවුල් වැව | 25478 | 101% | 7895 | 83% |
| 2 | හොරකැලේ | 34000 | 87% | 5672 | 38% |
| 3 | නාරංගල්ල | 6733 | 111% | 6431 | 116% |
| 4 | ගල්පොකුන | 18815 | 107% | 3412 | 31% |
| 5 | රුක්කත්තන | 14663 | 98% | 14240 | 98% |
| 6 | ආඬිගම | 24674 | 107% | 16878 | 119% |
| 7 | සිරිංගපාත | 17934 | 91% | 5990 | 42% |
| 8 | මරඳවිල | 23000 | 100% | 8846 | 35% |
| 9 | මැල්සිරිපුර | 12514 | 100% | 10253 | 63% |
| 10 | බෙලිගම | 9667 | 66% | 10727 | 100% |
| 11 | මිරිස්වත්ත | 1583 | 100% | 0 | 0% |
| 12 | මහබේරියතැන්න | 2369 | 59% | 0 | |
| 13 | හාරගම | 500 | 100% | 400 | |
| 14 | පොළොන්තලාව | 6218 | 105% | 4000 | 75% |
| 15 | මාර්ටින් | 4600 | 93% | 821 | 30% |
| 16 | රිදියගම | 0 | 0% | 0 | |
| 17 | කරඳගොල්ල | 300 | 85% | 0 | |
| | එකතුව | 203,048 | 93% | 95,565 | 66% |

## 2011 - 2015 අතර පශු සම්පත් හා වගා කාර්ය සාධනය

| ක්‍රියාකාරකම් | ඒකක | ප්‍රමාණය | ප්‍රමාණය | ප්‍රමාණය | ප්‍රමාණය | ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|
| **කිරි ගවයින්** | | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
| මුළු පට්ටිය | No. | 8068 | 7755 | 7295 | 7406 | 10556 |
| වසර දෙකට වැඩි වැස්සියන් | No. | 1318 | 965 | 1070 | 831 | 942 |
| වසර 0 - 2 දක්වා වැස්සියන් | No. | 1987 | 1432 | 1910 | 1547 | 2856 |
| වසර 1ට අඩු පිරිමි පැටවුන් | No. | 1102 | 746 | 439 | 445 | 476 |
| මුළු උපත් | No. | 2380 | 2646 | 3410 | 3078 | 3894 |
| බෝ කිරීම සඳහා මුළු නිකුත් කිරීම | No. | 1328 | 1997 | 2682 | 2002 | 1837 |
| මරණ ලද මුළු සංඛ්‍යාව | No. | 349 | 860 | 738 | 337 | 179 |
| මුළු මරණ සංඛ්‍යාව | No. | 980 | 1047 | 743 | 707 | 1155 |
| මුළු වැළදෙනුන් සංඛ්‍යාව | No. | 3443 | 3406 | 3787 | 4196 | 5057 |
| මුළු කිරිදෙනුන් සංඛ්‍යාව | No. | 1404 | 1339 | 2124 | 2410 | 3154 |
| කිරි ගන්නා දෙනුන් සංඛ්‍යාව % | % | 53 | 51 | 59 | 57 | 57 |
| දළ නිෂ්පාදනය කිරි දෙනකගේ දිනකට | ලීටර් | 5.6 | 7 | 11.2 | 11.4 | 11.0 |
| දල කිරිදෙන කාල සීමාව | දින | 425 | 420 | 431 | 427 | 434 |
| කිරි නිෂ්පාදනය | ලීටර් | 2.8 | 3.4 | 8.6 | 10.0 | 10.2 |
| දල පළමු පැටියා බිහි කිරීමේ දළ වයස | දින | 41 | 38 | 47 | 39 | 40 |
| දළ පැටවුන් බිහි කිරීමේ විරාමය | දින | 425 | 420 | 431 | 427 | 434 |
| සිංචනය කළ සතුන් සංඛ්‍යාව | | 3064 | 2759 | 6260 | 6844 | 8442 |
| මී ගවයින් | | | | | | |
| මුළු පට්ටිය | No. | 2534 | 2403 | 2080 | 2368 | 2408 |
| වසර 2කට වැඩි වැස්සියන් | No. | 527 | 527 | 468 | 482 | 622 |
| වසර 0 - 2 දක්වා වැස්සියන් | No. | 489 | 465 | 464 | 516 | 638 |
| පිරිමි පැටවුන් සංඛ්‍යාව | No. | 422 | 443 | 190 | 253 | 250 |
| මුළු උපත් | No. | 576 | 627 | 601 | 743 | 821 |
| බෝ කිරීම සඳහා මුළු නිකුත් කිරීම | No. | 185 | 124 | 285 | 301 | 438 |
| මරණ ලද මුළු සංඛ්‍යාව | No. | 9 | 119 | 125 | 110 | 63 |
| මුළු මරණ | No. | 380 | 299 | 304 | 279 | 245 |
| මුළු දෙනුන් සංඛ්‍යාව | No. | 939 | 959 | 943 | 982 | 1109 |
| මුළු කිරි දෙනුන් සංඛ්‍යාව | No. | 394 | 427 | 432 | 492 | 475 |
| කිරි දෙන සංඛාව % | % | 49 | 43 | 48 | 49 | 50 |
| කිරි දෙනකගේ දෛනික කිරි නිෂ්පාදනය | Ltrs. | 4 | 4 | 3.9 | 3.8 | 3.8 |
| කිරිෙ දන කාල සීමාව | days | 281 | 314 | 251 | 266 | 248 |
| කිරි නිෂ්පාදනය | Ltrs (m). | 0.63 | 0.68 | 0.70 | 0.70 | 0.8 |
| පළමු පැටියා බිහි කිරීමේ දළ වයස | Months | 58 | 48 | 50 | 52 | 50 |
| දළ පැටවුම බිහි කිරීමේ විරාමය | Days | 432 | 434 | 503 | 416 | 451 |
| සිංචනය කරන ලද සතුන් සංඛ්‍යාව | No. | 51 | 0 | 0 | 0 | 0 |
| කුකුළු | | | | | | |
| බ්‍රොයිලර් මව් පිය සතුන් | | | | | | |
| මුළු රංචුව | No. | 32,878 | 20,610 | 19,585 | 23,422 | 30,250 |
| ආනයනය/ මා පිය සතුන් මිලට ගැනීම | No. | | | | | |
| පිරිමි | No. | 1,889 | 2,380 | 2,487 | 2,613 | 3,278 |
| ගැහැනු | No. | 12,810 | 15,223 | 16,540 | 18,402 | 23,188 |
| මුළු බිත්තර නිෂ්පාදනය | No. | 3,574,459 | 2,530,031 | 2,537,320 | 2,532,014 | 2,737,073 |
| මුළු රැක්කවිය හැකි බිත්තර සංඛ්‍යාව | No. | 4,284,521 | 2,738,691 | 2,281,182 | 2,340,452 | 2,537,350 |



වාර්ෂික වාර්තාව 2015

| ක්‍රියාකාරකම් | ඒකක | ප්‍රමාණය 2011 | ප්‍රමාණය 2012 | ප්‍රමාණය 2013 | ප්‍රමාණය 2014 | ප්‍රමාණය 2015 |
|---|---|---|---|---|---|---|
| පැටවුන් බෝ වීමේ ප්‍රතිශතය | % | 78 | 81 | 74 | 80 | 85% |
| බිත්තර දමන මාපිය සතුන් | | | | | | |
| මුළු රංචුව | No. | 7260 | 2743 | 6165 | 5627 | 5912 |
| සතුන් ආනයනය | | | | | | |
| පිරිමි සතුන් | No. | 1798 | 375 | 750 | 375 | 375 |
| ගැහැනු සතුන් | No. | 14103 | 3120 | 6240 | 3120 | 3120 |
| මුළු බිත්තර නිෂ්පාදනය | No. | 1,915,251 | 1,052,873 | 823,829 | 1,281,707 | 994,462 |
| මුළු රැක්කවිය හැකි බිත්තර සංඛ්‍යාව | No. | 1,755,556 | 924,012 | 667,149 | 926,682 | 745,594 |
| පැටවුන් බිහි වීමේ ප්‍රතිශතය | % | 75 | 70 | 74 | 60 | 64 |
| මුළු කුකුළු පැටවුන් නිශ්පාදනය | No. | 1,141,007 | 330,850 | 460,486 | 569,154 | 439,811 |
| වාණිජ මට්ටමින් බ්‍රොයිලර් නිෂ්පාදනය | | | | | | |
| මුළු රංචුව | No. | 5400 | 0 | 0 | 0 | 10,399 |
| බ්‍රොයිලර් නිෂ්පාදනය | පක්ෂීන් | 37161 | 0 | 0 | 1812 | 15,412 |
| වාණිජ මට්ටමේ බිත්තර නිෂ්පාදනය | | | | | | |
| මුළු රංචුව | No. | 7541 | 10016 | 7535 | 5096 | 6,443 |
| කිකිළියන් මුළු සංඛ්‍යාව | No. | 7944 | 6499 | 6230 | 5012 | 3,900 |
| බත්තර නිෂ්පාදනය | Mn | 2,095,328 | 2,530,031 | 1,241,936 | 1,261,226 | 1,057,935 |
| ඌරන්ගේ කාර්යසාධනය (බෝ කිරීමේ සතුන්) | | | | | | |
| මුළු පට්ටිය | No. | 1439 | 1716 | 764 | 727 | 1090 |
| උපන් ඌරු පැටවුන් | No. | 3571 | 3466 | 2776 | 3075 | 3347 |
| මුළු ඊරි පැටවු රොත්ත | No. | 8 | 8.5 | 9 | 8 | 9 |
| මුළු ඌරු පැටවු රොත්ත | No. | 8 | 9 | 10 | 8 | 7 |
| පැටව් මැරුණු සංඛ්‍යාව | No. | 313 | 423 | 245 | 170 | 184 |
| එළුවන්ගේ කාර්යසාධනය | | | | | | |
| මුළු සතුන් ගණන | No. | 945 | 759 | 776 | 762 | 794 |
| උපන් එළුපැටවුන් සංඛ්‍යාව | No. | 374 | 292 | 408 | 401 | 309 |
| සජීවී පැටව් අනුපාතිකය | No. | 0.61 | 0.64 | 0.64 | 0.74 | 0.57 |
| මරණ සංඛ්‍යාව (වැඩුනු සතුන් සහ පැටව්) | No. | 355 | 190 | 235 | 131 | 220 |
| බෝ කිරීම සඳහා නිකුත් කිරීම | No. | 503 | 245 | 21 | 138 | 97 |
| බැටළු කාර්යසාධනය | | | | | | |
| මුළු පට්ටිය | No. | 3411 | 615 | 4358 | 4890 | 4626 |
| උපන් පැටවු සංඛ්‍යාව | No. | 1294 | 1327 | 1887 | 1827 | 1378 |
| සජීවී පැටව් අනුපාතිකය | No. | 0.76 | 0.86 | 1.2 | 0.8 | 1.4 |
| මරණ සංඛ්‍යාව (වැඩුණු සතුන් සහ පැටව්) | No. | 323 | 133 | 195 | 434 | 770 |
| බෝ කිරීම සඳහා නිකුත් කිරීම | No. | 181 | 563 | 652 | 351 | 845 |
| ගොවි පුහුණු වැඩසටහන් කාර්යසාධනය | | | | | | |
| පාඨමාලා සංඛ්‍යාව | No. | 110 | 70 | 73 | 75 | 49 |
| සහභාගීවූවන්ගේ සංඛ්‍යාව | No. | 3945 | 2619 | 1806 | 2212 | 1214 |
| පොල් නිෂ්පාදනය | No. | 19,941,373 | 21,386,572 | 14,179,220 | 18,437,956 | 16,315,574 |
| කොප්පරා නිෂ්පාදනය | M/Tons | 227.18 | 220.92 | 170.78 | 190.10 | 128.6 |



# 2015 දෙසැම්බර් 31 දිනට
# මූල්‍ය ප්‍රකාශන වාර්තාව

# ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

## පූර්විකාව

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS/LKAS) ප්‍රකාශයටපත් කිරීමත් සමගම 2012 ජනවාරි 01 වන දා සිට බල පැවැත්වෙන පරිදි ශ්‍රී ලංකාවෙහි ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (IFRS) අනුගමනය කිරීම ආරම්භ විය. ජාතික පශු සම්පත් මණ්ඩලය ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කළ යුතු නිරූපිත ව්‍යවසායක් වන බැවින්, ජාතික පශු සම්පත් මණ්ඩලය 2015 වසරේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා මෙකී ප්‍රමිතීන් පිළිගෙන ඒ අනුව කටයුතු කර ඇත.

## 1. හැඳින්වීම

1972 අංක 11 දරණ කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය( ජා. ප. ම.) 1973 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී. එහි ක්ෂේත්‍ර කටයුතු ආරම්භ කරන ලද්දේ 1974 වර්ෂයේ දීය.

මෙය පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. ජනතාවගේ සමාජ හා ආර්ථික තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහා ගුණාත්මක අභිජනන ද්‍රව්‍ය, පශු සම්පත් හා කෘෂි නිෂ්පාදන නිපදවන ශ්‍රී ලංකාවේ හොඳම ස්ව පැවැත්මක් ඇති ආයතනය බවට පත්වීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ දැක්ම හඳුනාගෙන ඇත. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපළවල් සහ එහි වතු සහ අනෙකුත් දේපළ දිවයිනේ සෑම ප්‍රදේශයක ම පාහේ විසිරී පැතිරී ඇත

### මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහතින් දැක්වේ

1) පශු සම්පත් අභිජනනය හා සංවර්ධනය.
2) බෝ කිරීම සඳහා හොඳ තත්ත්වයේ සතුන් සාධාරණ මිලකට ගොවීන්ට නිකුත් කිරීම.
3) උපරිම ලාභයක් ඉපයීම සඳහා ප්‍රශස්ත මට්ටමින් පොල් වගාව පවත්වාගෙන යාම.
4) හැකියාව ඇති ස්ථානවල පශු සම්පත් භෝග ඒකාබද්ධ ගොවිපොළවල් ක්‍රියාත්මක කිරීම.
5) ගොවීන්ට, පාසැල් සිසුන්ට කෘෂි කර්මාන්තයේ නියැලි නිළධාරීන්ට සහ විශේෂයෙන් කුඩා පරිමාණයේ සතුන් ඇති කරන්නන් හට පුහුණු වැඩසටහන් හා ප්‍රදර්ශන පැවැත්වීම.
6) සාධාරණ මිලකට හොඳ තත්ත්වයේ ගොවිපොළ නිෂ්පාදන සැපයීම සඳහා අලෙවිසැල් ස්ථාපනය කිරීම හා පවත්වාගෙන යාම.
7) ඉහළ ලාභ පරතරයක් ලබාගැනීම සඳහා ගොවිපොළවල නිෂ්පාදිත අමුද්‍රව්‍ය භාවිතාකරමින් වටිනාකම එකතුකරන ලද භාණ්ඩ නිපදවීම.
8) ජනතාව අතර නැවුම් එළකිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම සඳහා ජනතාවට නැවුම් එළකිරි අලෙවි කිරීම.

### 1.1 වත්මන් මූල්‍ය ප්‍රකාශනවල වගකීම

1971 අංක 38 දරණ මුදල් පනතේ 13 (1) ඡේදය යටතේ සහ 1972 අංක 25 දරණ රාජ්‍ය කෘෂිකාර්මික පනතේ 25 ඡේදය යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට බැඳී සිටියි. 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනතේ 13 (1) ඡේදය යටතේ මණ්ඩලය ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අනුව ක්‍රියාත්මක වේ. එම පනතේම 5 ඡේදය යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත නිකුත් කරනු ලැබේ. එම පනත යටතේම 5 වන ඡේදයේ උප ලේඛන අනුව "භාණ්ඩ විකිණීමේ හෝ සේවා සැපයීමේ යෙදී සිටින රාජ්‍ය සංස්ථා" නිරූපිත ව්‍යාපාර ව්‍යවසායන් වශයෙන් දක්වා ඇත. එබැවින් 2012 ජනවාරි පළවන දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඉදිරිපත් කිරීම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අනිවාර්ය වී ඇත.





ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට (IFRS) මාරුවීමේ අරමුණු වනුයේ,

- ඉහළ කාර්ය සාධනයක් හා ද්‍රවශීලී මූල්‍ය වෙළඳපොළක් ඇති කිරීම
- වඩාත් ඉහළ විනිවිදභාවයක් තුළින් ව්‍යාපාර ඇගැයීමට පහසුකම් සැපයීම

  මූල්‍ය ප්‍රකාශන වල සැසඳිය හැකි භාවය හා විනිවිදභාවය නිශ්චය කොට එමගින් ආකෘති වලට වඩා අඩංගු දේ ගැන අවධාරණය කරමින් පරිශීලකයන්ට දැනට වඩා වැඩි විස්තරාත්මක තොරතුරු සපයමින් කාර්යක්ෂම ප්‍රාග්ධන වෙළඳපොළක් සහතික කර ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත ගෝලීය වශයෙන් පිළිගෙන ඒ අනුව කටයුතු කිරීම අවශ්‍ය යැයි සැලකිණි. ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (IFRS) ලොව පුරා සීඝ්‍රයෙන් ප්‍රචලිත වෙමින් පවතී. යුරෝපා සංගමය 2005 වසරේ දී සිය සමාගම් කිහිපයට මෙම ප්‍රමිත අනුගමනය කළ යුතු බවට නියෝග කළ දින පටන් අන් රටවල් ද මෙම ප්‍රමිත අනුගමනය කිරීමට පටන්ගෙන තිබේ. නිදසුනක් වශයෙන් ඔස්ට්‍රේලියාව, නවසීලන්තය සහ ඊශ්‍රාලය ද IFRS අනුව දැනටමත් කටයුතු කර ඇත. වසර 2011 පටන් කැනඩාව සහ ජපානය ද මෙම ප්‍රමිත බලාත්මක කර ඇත. අතිරේක රටවල් ද IFRS අනුව කටයුතු කිරීමට සැලසුම් කරමින් සිටී.

### 1.2 මෙම වාර්තාවේ අරමුණ

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සිය මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) වලට පරිවර්තනය වීමේ දී අනුගමනය කළ ක්‍රියා මාර්ග සැකවින් මෙම වාර්තාවෙන් විස්තර කෙරේ. පළමුව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) සහ ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS) ලැයිස්තුගත කර ඇත. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අදාළ නොවන ප්‍රමිතීන් වෙනම ලේඛනගත කොට ඇත. ඉන්පසු එක් එක් ප්‍රමිතයන් හි උපයෝගී කරගත හැකියාව පිළිබඳව සාකච්ඡා කෙරේ. අනතුරුව ගිණුම්කරණ ප්‍රතිපත්තීන් වලට ඇති විය හැකි වෙනස්කම් හා එමගින් ඇති වෙන්නාවූ මූල්‍යමය බලපෑම ද පරීක්ෂා කෙරේ. මෙම වාර්තාවේ ඉස්මතු කරන ලද හෝ සාකච්ඡා කරන ලද කරුණු අනුව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කළමනාකාරීත්වය විසින් වසර 2015 හි දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඉදිරිපත් කිරීම කරනු ලැබේ

### 1.3 ඉදිරියේ දී ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS) යොදා ගැනීම

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කළමනාකාරීත්වය විසින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින් / ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS) උපයෝගීකර ගනිමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඉදිරිපත් කිරීම දිගටම කරනු ඇත. පෙර පැවැති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හෝ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම (SLFRS) යටතේ කෙරුණු ගණුදෙනු වල බලපෑම පිළිබඳව තක්සේරුවක් කිරීමට අවශ්‍ය වන්නේ ද නැත. බොහෝ අයිතමවල සාධාරණ වටිනාකම් මිනුම්කරණය පිළිබඳව සම්මුතියක් නැතත් අද ලොවපුරා ඇත්තේ සාධාරණ වටිනාකම් උපයෝගී කරගනිමින් ගිණුම් පිළියෙල කිරීමේ ප්‍රවණතාවයි.විශ්‍රාම ප්‍රතිලාභ සහ අනෙකුත් අදාළ ගෙවීම් වල ආයුගණක වටිනාකම තක්සේරු කිරීමට මණ්ඩලය සූත්‍ර ක්‍රමය දිගටම භාවිතා කරනු ඇත.

### අනාගතයේ දී SLFRS 1.4 අයදුම්

- NLDB මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීමේදී SLFRS/LKAS අඛණ්ඩව යොදා ගැනීමට කටයුතු කරනු ලැබේ.

## 2. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS) වලට පරිවර්තනය වීමේ වැදගත් අංගයන

### 2.1 ජීව විද්‍යාත්මක වත්කම්

**ජීව විද්‍යාත්මක වත්කම් යනු කවරේ ද ?**
ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 41 අනුව ජීව විද්‍යාත්මක වත්කමක් යනු ජීවත්වන සත්වයෙකු හෝ පැලයකි. කෘෂිකාර්මික පරිසරයක දී, ජීව විද්‍යාත්මක වත්කමක වැඩීම සහ මේරීම පාලනය කරනු ලබන ක්‍රියාවලි තුළින් ජීව විද්‍යාත්මක වත්කම් වල නිෂ්පාදනය, විකිණීම හෝ අතිරේක වත්කම් බවට පරිවර්තනය වීම සිදු කෙරේ. යන්ත්‍ර සූත්‍ර වැනි සම්ප්‍රදායික නිශ්චල දේපළ වලට හාත් පසින්ම වෙනස් ලෙසට ජීව විද්‍යාත්මක වත්කම් නිරන්තරයෙන් කාලයත් සමග වෙනස් වීමට භාජනය වනුයේ ඔවුන් ගේ වර්ධන චක්‍රය අනුව ජීව විද්‍යාත්මක පරිණාමය, වැඩීම, පරිහානිය, නිෂ්පාදනය හා ප්‍රජනන යන ක්‍රියාවලි නිසාය, ජීව විද්‍යාත්මක වත්කම් වල සිදුවන වෙනස්කම් විවිධාකාර විය හැකි අතර ඒවා සලකුණු කොට පරීක්ෂා කිරීම ද දුෂ්කර වන්නේ ඔවුන්ගේ වර්ධන චක්‍රයට කාලගුණය, වැඩිමේ ස්වාභාවික ප්‍රතිඵල, රෝග, වත්කම් පිළිබඳ පාලනය සහ පාරිසරික තත්ත්වයන් යනාදිය ද බලපාන බැවිනි

**ජීව විද්‍යාත්මක වත්කම් අගය කරනු ලබන්නේ කෙසේද ?**
ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 41 අනුව සාමාන්‍ය තත්ත්වයන් යටතේ ජීව විද්‍යාත්මක වත්කම් වල සාධාරණ වටිනාකම විශ්වාසදායි ලෙස තීරණය කළ හැකි බවට විශ්වාස කෙරේ. සමහර ජීව විද්‍යාත්මක වත්කම් වර්ග වල (සතුන් සහ මත්ස්‍යයන්) සඳහා එම සතුන්ම සඳහා නොවුනත් ඒ හා සමාන ජීව විද්‍යාත්මක වත්කම් සඳහා වෙළඳපොළක් පවතින අතර මෙම වෙළඳපොළවල් වල පවතින මිල ගණන් බොහෝ විට මෙම ජීව විද්‍යාත්මක වත්කම් වල සාධාරණ වටිනාකම තීරණය කිරීමෙහි ලා පදනමක් වනු ඇත. වෙළඳපොළ මිල ගණන් නොමැති අවස්ථා වල දී සාධාරණ වටිනාකම තීරණය කිරීම සඳහා මිනුම් ලකුණු සහ වත්කමෙන් අපේක්ෂිත ශුද්ධ මුදල් ප්‍රවාහයෙහි වර්තමාන අගය වැනි අනෙකුත් පිළිගත් ක්‍රමවේදයන් භාවිතා කෙරේ. සාධාරණ වටිනාකම විශ්වාසදායී ලෙස තීරණය කළ නොහැකි සමහර අවස්ථා ද ඇත. එවැනි අවස්ථාවල ලංකා ගිණුම්කරණ ප්‍රමිත (**LKAS**) 41 යෝජනා කෙරෙනුයේ ඓතිහාසික පිරිවැය ක්‍රමය දිගටම භාවිතා කරන ලෙසය

**වෙළඳපොළ ප්‍රවේශය**
ජීව විද්‍යාත්මක වත්කම් සඳහා සක්‍රීය වෙළඳපොළක් පවතීනම් එම ජීව විද්‍යාත්මක වත්කම් වල වටිනාකම වඩාත් විශ්වාසදායී ලෙස මිනුම්කරණය කළ හැක්කේ එකී වත්කම් භාවිතා කිරීමට හෝ විකිණීමට යොදා ගනු ලබන ස්ථානයේ පවතින වෙළඳපොළ මිල ගණන්ය. වෙනස් වර්ග සහ උප වර්ග වලට අයත් ජීව විද්‍යාත්මක වත්කම් පවතීනම් එම වර්ග සහ උප වර්ග නිසි ලෙස හඳුනාගැනීම වැදගත් වේ. එකම වර්ගයෙහි උප වර්ග වල වෙළඳපොළ මිල ගණන් වෙනස් විය හැක.

නියාමක, ප්‍රවාහන හෝ සෘතුමය හේතූන් නිසා වෙනස් වුණු වෙළඳපොළ පරිසරයෙහි තත්ත්වයෙන් හේතුකොට ගෙන එකම ජීව විද්‍යාත්මක වත්කමෙහි හෝ කෘෂිකාර්මික නිෂ්පාදනයෙහි වටිනාකම වෙනස් විය හැකි තත්ත්වයන් උදාවිය හැක. ජීව විද්‍යාත්මක වත්කම් වලට මිල ගණන් යෝජනා හැරුණු කොට වටිනාකම තක්සේරු කෙරෙන දිනට ප්‍රමාණය ද තීරණය කළයුතුය. තව ද ජීව විද්‍යාත්මක වත්කම් වල අයිතිකරු එම වත්කම් සම්බන්ධයෙන් නිසි තොරතුරු අඩංගු ලේඛන තබාගැනීම සහ සාධාරණ පාලනයක් සමග නඩත්තු ක්‍රියා පිළිවෙලක් යොදාගෙන තිබීම ද වැදගත්වේ. ජීව විද්‍යාත්මක වත්කම් වල ප්‍රමාණය පිළිබඳව පදනමක් ඇති කිරීම සඳහා තොරතුරු භාවිතා කිරීමට පෙර තොරතුරුවල අවංක භාවය හා විශ්වාසනීයභාවය නිශ්චය කර ගැනීම පිණිස පරීක්ෂණ කටයුතු, ක්‍රියා දාමයන් තහවුරු කර ගැනීම් සහ නොයෙකුත් නියැදියන් විශ්ලේෂණ කටයුතු යනාදිය කරනු ලැබේ

**ආදායම් ප්‍රවේශය**
ජීව විද්‍යාත්මක වත්කම් සඳහා පවතින වෙළඳපොළක් නැති අවස්ථාවලදී මෙම වත්කම් වල වටිනාකම අගය කිරීමේ විකල්ප ප්‍රවේශයක් වශයෙන් ආදායම් ප්‍රවේශය යොදා ගතහැකිය. ජීව විද්‍යාත්මක වත්කමක් අගය කිරීම සඳහා ආදායම් ප්‍රවේශය යොදා ගැනීමේ දී වටිනාකම රඳාපවතින්නේ මෙකී වත්කමෙන් ලැබීමට අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ වල වර්තමාන අගය මතයි. විශ්වාසනීය සහ සාධාරණ ප්‍රතිඵල අත්පත් කර ගැනීම පිණිස මෙම ප්‍රවේශයේ දී ඔවුන් ගේ භෞතික සහ ජීව විද්‍යාත්මක විශේෂ ලක්ෂණ පිළිබඳව





මනා අවබෝධයක් අවශ්‍ය කෙරේ. මෙම ගති ලක්ෂණ හා බාහිර සාධකයන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇතිකරන බැවින්, සමාලෝචනයට භාජනය වී ඇති වත්කමේ ජීව විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳව විශේෂඥ උපදෙස් සහය ලබා ගැනීම තුලින් වටිනාකම තක්සේරු කිරීමේ කාර්යයේ දී මහඟු උපකාරයක් වනු ඇත. උදාහරණයක් වශයෙන් පහත සඳහන් වනුයේ

ව්‍යාපාර අවශේෂ ක්‍රමය නැමැති වටිනාකම තක්සේරු කිරීමේ එක් ක්‍රම වේදයකි. මෙම ක්‍රමය යටතේ ජීව විද්‍යාත්මක වත්කම් වලින් ලබාගත් මෙහෙයුම් වල වටිනාකම තීරණය කෙරේ. ඉන්පසු මෙහෙයුම්වල වෙළඳපොළ වටිනාකමෙන් ඉඩම් උපකරණ හා යන්ත්‍ර සූත්‍ර, අනෙක් වත්කම්, (වර්ග නාම) වැනි හඳුනාගත හැකි අස්පෘශ්‍ය වත්කම් වල වටිනාකම අඩුකරනු ලබයි. ඒ අනුව ලැබෙන අවශේෂ වටිනාකම ජීව විද්‍යාත්මක වත්කමේ වෙළඳපොළ වටිනාකම වශයෙන් වෙන් කළ හැකිය

මෙම ක්‍රමය යටතේ, එක් ජීව විද්‍යාත්මක වත්කම් වලින් මෙහෙයුම වෙළඳපළ වටිනාකම තීරණය කරයි. එසේ නම්, ඉඩම්, උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර වටිනාකම වෙනත් වත්කම් අතර හඳුනා අස්පෘශ්‍ය වත්කම් (එවැනි වෙළඳ නාම ලෙස) මෙහෙයුම වෙළඳපළ වටිනාකම මුදලින් අඩුකර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් අවශේෂ වටිනාකම පසුව ජීව විද්‍යාත්මක වත්කම් වෙළඳපළ වටිනාකම ලෙස වෙන් කළ හැක.

වසර තුළ දී සැලකිල්ලට භාජනය වන **NLDB** වඩාත් යථාර්ථවාදී වෙළඳ පොළ වටිනාකම අනාවරණය කරන බව, ඒ එක් එක් හා සෑම වත්කම් එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය පරීක්ෂා කර ඇති අතර සුදුසු ක්ෂය අනුපාත ඉල්ලුම් කර තිබේ.

**නිගමනය**
ආයතනයක ජීව විද්‍යාත්මක වත්කම් වල සහ අනෙක් අස්පෘශ්‍ය වත්කම් වල සාධාරණ වටිනාකම ප්‍රමාණවත් ලෙස පිළිබිඹුවනවා ද යන්න නිශ්චය කරගැනීම සඳහා නව ගිණුම්කරණ ප්‍රමිතීන් හඳුන්වා දී ඇති අවස්ථාවක, මෙම වත්කම්වල වටිනාකම තක්සේරු කිරීමේදී මතුවිය හැකි අනන්‍ය ගැටලු සහ අභියෝග ගැන අපි සියලු දෙනාම සැලකිලිමත් විය යුතුය. විශ්වාස කළ හැකි ප්‍රතිඵල හා විශ්වාසනීය වටිනා මතයන් නිශ්චය කරගැනීම සඳහා පළපුරුද්ද, ප්‍රවීණතාවය සහ ස්වාධීනත්වය යන ප්‍රධාන ගුණාංගයන් අවශ්‍ය කෙරේ

### 2.2 ජීව විද්‍යාත්මක වත්කම් වල සාධාරණ වටිනාකම මිනුම්කරණය

ජතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ජීව විද්‍යාත්මක වත්කම් වල සාධාරණ වටිනාකම පහත සඳහන් නිර්ණායකයන් මත මිනුම්කරණය ඇත.

**i.** කුකුළන් හැර අනෙක් සතුන්

උදාහරණ: ගවයින්, මී ගවයින්

පහත සඳහන් කරුණු පදනම් කරගෙන අභිජනනය සඳහා වූ සතුන් මණ්ඩලීය චක්‍රලේඛ අනුව ප්‍රමිති මිල ගණන් යටතේ තක්සේරු කොට ඇත.

1. ජීව බර
2. කිරි මුර ප්‍රමාණය
3. කිරි නිෂ්පාදනය
4. ගැබ්බර භාවය
5. ප්‍රවේනි ජාන අගය

**අනෙක් සතුන්**
ජීව බර ප්‍රවේණි ජාන අගය හා ගැබ්බර බව පදනම් කරගෙන බැටළුවන් එළුවන් ඌරන් හා හාවුන් ප්‍රමිති මිල ගණන් යටතේ තක්සේරු කොට ඇත.
රැලට නුසුදුසු සියලුම සතුන් බර පදනම් කරගෙන ප්‍රමිති මිල ගණන් යටතේ තක්සේරු කර ඇත.

ii. **අභිජනන හා වාණිජමය කුකුළන්**

(අ) බිත්තර දමන කාණ්ඩය (බිත්තර දැමීම ආරම්භ වූ පසු පැටවුන්ගේ මිල හා විකිණීම සඳහා බිත්තර ලබාගැනීමට ඇති කිකිළියන්ගේ බිත්තර දැමීම ආරම්භය දක්වා වියදම, බිත්තර දැමූ කාලය අදාළ කොටස ලියා හැරීමෙන් පසුව ඉතිරිය දක්වා ඇත.

(ආ) අභිජනන හා වාණිජමය බිත්තර ලබාගන්නා වැඩෙන කුකුළු කාණ්ඩ ( බිත්තර දැමීම ආරම්භයට පෙර) නියමිත දින දක්වා මෙම කාණ්ඩ සඳහා දරන ලද වියදම සත්‍ය පිරිවැය වශයෙන් තක්සේරු කර ඇත.

iii. **අභිජනන බිත්තර ( රක්කන බිත්තර)**

පහත සඳහන් සූත්‍රය භාවිතා කරමින් අභිජනන බිත්තර පිරිවැය මත තක්සේරු කර ඇත.

මුළු පිරිවැය, දෙසැම්බර් මාසයේ හැකි නිෂ්පාදිත බිත්තර ප්‍රමාණයෙන් බෙදීම.

සත්ව ආහාර වල පිරිවැය සෘජු වේතන හා ක්ෂයවීම ඇතුලත් පොදු වියදම මෙහි සඳහන් කර ඇති මුළු පිරිවැය යන්නට ඇතුලත් ය.

**iv. වාණිජමය බිත්තර**

අලෙවි සැලෙහි උපලබ්ධි වූ මිලට වාණිජමය බිත්තර තක්සේරු කර ඇත.

**v. නොමේරූ බ්‍රොයිලර් සහ ලේයර් තොග**

එදිනට දරනලද පිරිවැය මත තොග අගය කර ඇත.

**vi. ශීත කාමරවල ඇති බ්‍රොයිලර්**

උපලබ්ධි වූ මිලට ශීත කාමරවල ඇති බ්‍රොයිලර් අගය කර ඇත.

vii. **පොල් හා කෘෂි නිෂ්පාදන**

උපලබ්ධි වූ මිලට පොල් හා කෘෂි නිෂ්පාදන තොග අගය කොට ඇත.

viii. **පොල් කටු අඟුරු**

උපලබ්ධි වූ මුදලෙන් 50% වටිනාකමට පොළව යට ඇති පොල් කටු අඟුරු අගය කොට ඇත.

**ix. අනෙක් තොග**

අවම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට අනෙක් තොග අගය කොට ඇත

**2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් වීම් ක්ෂය කිරීම්**

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ක්ෂය කිරීම් සම්බන්ධව පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම ක්‍රමය (GAAP) යටතේ වත්කමක් වෙනුවෙන් ක්ෂය කිරීම් එම වත්කම අත්පත් කළ කාලය තුළ දී නොකරන අතර වත්කම බැහැර කළ වසරේ වත්කමට අදාළ සම්පූර්ණ ක්ෂය අගය සැලකිල්ලට ගෙන ගිණුම් තැබීම කරන ලදී. මෙම ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්/ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS/ LKAS) යටතේ නොගැළපෙන බැවින් වත්කම භාවිතා කළ දින සිට අදාළ ක්ෂයකිරීම් කිරීමේ ක්‍රමවේදයකට ගිණුම් ප්‍රතිපත්ති මාරු කිරීමට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය තීරණය කර ඇත

**2.4 සේවක ප්‍රතිලාභ - ආයුගණක වටිනාකම තක්සේරු කිරීම සේවක ප්‍රතිලාභ**

**(අ) නිර්වචිත දායක සැලසුම් - සේවක අර්ථ සාධක සේවා නියුක්තිකයන්ගේ අරමුදල**

නිර්වචිත දායක සැලසුම් යනු පශ්චාත් සේවා සැලසුමක් වන අතර අස්තිත්වයක් විසින් ස්ථිර දායක මුදලක් වෙනත් අස්තිත්වයක් වෙත ගෙවනු ලැබේ. එමගින් තවදුරටත් කිසිම නෛතික හෝ වෙනත් ගෙවීමක් කිරීමට සිදු නොවේ. සේවකයින් වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට ගෙවියයුතු දායක මුදල් වියදමක් වශයෙන් වියදම සිදු වූ කාලවකවානුවේ හඳුනාගෙන ආදායම් ප්‍රකාශයේ පෙන්වනු ලබයි. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සේවකයින් ගේ මුළු ඉපයීමෙන් 12% ක් හා 3% ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක වේ.





**ආ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්**

නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක් යනු නිර්වචිත දායක සැලසුමක් හැර පශ්චාත් සේවා සැලසුමකි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS)16 - සේවක ප්‍රතිලාභ අනුව නිර්වචිත ප්‍රතිලාභ ගණනය කරනු ලබන්නේ එම ගිණුම් ප්‍රමිතිය විසින් අවසර දී ඇති පාරිතෝෂික සූත්‍රයක් උපයෝගී කරගනිමින් ය.

විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිලාභ සඳහා සේවකයෙකු සේවයට බැඳුනු පළමුවන සේවා වසරේ සිට සියලු සේවකයින් සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 16 - සේවක ප්‍රතිලාභ අනුව වෙන් කිරීම් කර ඇත. කෙසේ වෙතත් 1982 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ සේවකයෙකු වෙනුවෙන් වගකීම එළඹෙනුයේ සේවකයෙකු වසර පහක අඛණ්ඩ සේවාවක් සම්පූර්ණ කල විට දී පමණය.

පාරිතෝෂික ගෙවීම් සඳහා ගණනය කිරීම් කරන ලද්දේ එක්සෙල් වර්ක් ෂීට් වල සූත්‍ර ක්‍රමය භාවිතා කරමින්ය. පහත සඳහන් උපකල්පනයන් භාවිතා කරමින් එක්සෙල් වර්ක් ෂීට් 10ක විස්තර දක්වා ඇත.

නොකඩවා පැවැතීම : ජා. ප. ස. සං. මණ්ඩලය අඛණ්ඩව පවතින ආයතනයක්

| | |
|---|---|
| පොලී ප්‍රතිශතය | 11.5% |
| වැටුප් වර්ධක ප්‍රතිශතය | 5.5% |
| විශ්‍රාමික වයස | අවු 55 |
| සේවක පිරිවැටුම් ප්‍රතිශතය | 1.0% |

ගණනය කිරීම් වල සාරාංශයක් ඊළඟ පිටු දෙකෙහි දක්වා ඇත

## පාරිතෝෂික ගණනය කිරීමේ සංක්ෂිප්තය - 31.12.2014

| | ආරම්භක වෙන්කිරීම් | වසර සඳහා වන වියදම් | පොලිය | කරන ලද ගෙවීම් | ලාභය/පාඩුව | වසර අග. වෙන්කිරීම් |
|---|---|---|---|---|---|---|
| 1 | 15,957,265.64 | 846,340.56 | 1,835,085.55 | (426,100.34) | (306,868.75) | 17,905,722.66 |
| 2 | 11,711,615.72 | 847,893.67 | 1,346,835.81 | (2,731,149.60) | 1,297,368.03 | 12,472,563.63 |
| 3 | 14,036,740.69 | 1,003,667.39 | 1,614,225.18 | (1,165,337.60) | (641,913.93) | 14,847,381.73 |
| 4 | 16,794,373.37 | 996,001.03 | 1,931,352.94 | (1,560,944.64) | (1,235,613.18) | 16,925,169.52 |
| 5 | 13,965,275.41 | 942,787.46 | 1,606,006.67 | (2,954,437.78) | 684,279.83 | 14,243,911.58 |
| 6 | 9,755,299.42 | 824,690.63 | 1,121,859.43 | (2,049,822.00) | 388,020.08 | 10,040,047.56 |
| 7 | 15,926,317.71 | 931,114.92 | 1,831,526.54 | (1,152,250.96) | (3,215,173.81) | 14,321,534.39 |
| 8 | 12,942,473.19 | 955,542.77 | 1,488,384.42 | (1,542,604.15) | 2,819,249.35 | 16,663,045.58 |
| 9 | 18,340,593.10 | 1,027,031.09 | 2,109,168.21 | (3,000,843.88) | (2,234,196.57) | 16,241,751.95 |
| 10 | 23,047,657.97 | 1,406,405.29 | 2,650,480.67 | (2,689,948.14) | 925,448.87 | 25,340,044.65 |
| 11 | 1,773,387.52 | 470,312.01 | 203,939.56 | (1,400,047.55) | 3,864,769.82 | 4,912,361.35 |
| | 154,250,999.74 | 10,251,786.81 | 17,738,864.97 | (20,673,486.64) | 2,345,369.74 | 163,913,534.60 |





## පාරිතෝෂික ගණනය කිරීමේ සංක්ෂිප්තය - 31.12.2015

| | ආරම්භක වෙන්කිරීම් | වසර සඳහා වන වියදම් | පොලිය | කරන ලද ගෙවීම් | ලාභය/පාඩුව | වසර අග. වෙන්කිරීම් |
|---|---|---|---|---|---|---|
| 1 | 17,905,722.66 | 1,229,563.24 | 2,059,158.11 | (1,596,478.82) | 3,087,834.93 | 22,685,800.11 |
| 2 | 12,472,563.63 | 985,393.72 | 1,434,344.82 | (756,312.48) | 1,992,544.96 | 16,128,534.65 |
| 3 | 14,847,381.73 | 996,409.28 | 1,707,448.90 | (1,638,595.00) | 595,285.81 | 16,507,930.71 |
| 4 | 16,925,169.52 | 1,210,471.58 | 1,946,394.49 | (1,814,669.32) | 794,283.30 | 19,061,649.58 |
| 5 | 14,243,911.58 | 865,497.08 | 1,638,049.83 | (903,000.00) | (2,823,887.63) | 13,020,570.86 |
| 6 | 10,040,047.56 | 803,489.73 | 1,154,605.47 | (1,065,673.28) | 1,771,447.08 | 12,703,916.56 |
| 7 | 14,321,534.39 | 947,483.54 | 1,646,976.45 | (1,036,826.00) | (242,183.23) | 15,636,985.15 |
| 8 | 16,663,045.58 | 1,102,894.25 | 1,916,250.24 | (2,951,583.75) | 2,266,349.12 | 18,996,955.43 |
| 9 | 16,241,751.95 | 1,201,465.22 | 1,867,801.47 | (1,960,899.60) | 2,183,987.86 | 19,534,106.90 |
| 10 | 25,340,044.65 | 946,335.50 | 2,914,105.13 | (1,157,120.00) | (16,083,853.90) | 11,959,511.38 |
| 11 | 4,912,361.35 | 1,551,541.44 | 564,921.56 | (7,287,645.75) | 23,858,497.91 | 23,599,676.50 |
| | 163,913,534.60 | 11,840,544.56 | 18,850,056.48 | (22,168,804.00) | 17,400,306.20 | 189,835,637.84 |

# මූල්‍ය ප්‍රකාශ සදහා සටහන්

## වැදගත් මූල්‍ය ප්‍රතිපත්ති

### 1.1. සංස්ථාපිත තොරතුරු

**1.1.1. සමායතනික තොරතුරු**

| ගොවීන්ගේ භාරකාර අරමුදල | 88,812,700 | 93,612,700 |
| මහජන බැංකුව මි. 70 ණය | 56,000,000 | - |
| මහජන බැංකුව මි. 50 ණය | - | 12,500,000 |
| කිරි ගව ණය - අදියර 1 | 923,647,365 | 1,600,799,758 |
| කිරි ගව ණය - අදියර 2 | 2,643,431,905 | - |
| කල්බදු පහසුකම් | | |
| නව කැබ් රථ 05 | 23,289,948 | 33,223,940 |
| කිරි බවුසරය | 1,577,455 | 2,230,195 |
| අධිශීතකරණ ට්‍රක් රථය | 2,177,755 | 3,078,895 |
| හොණ්ඩා යතුරු පැදි | 118,688 | 598,800 |
| කැබ් රථ 05 | - | 2,697,975 |
| ට්‍රැක්ටර් 05 | 1,672,496 | 4,539,633 |
| මෝටර් රථ 02 | - | 2,422,680 |
| අවිනිශ්චිත පොලී | | |
| කැබ් රථ 05 | - | (68,090) |
| ට්‍රැක්ටර් 05 | (87,558) | (553,589) |
| මෝටර් රථ 02 | - | (110,354) |
| නව කැබ් රථ 05 | (2,957,803) | (5,630,260) |
| කිරි බිවුසරය | (237,541) | (455,181) |
| අධිශීතකරණ ට්‍රක් රථය | (327,937) | (628,402) |
| හොණ්ඩා යතුරු පැදිය | (2,308) | (44,213) |
| මාස 12 ක කාලය සදහා වූ අවිනිශ්චිත ණය | - | - |
| | 3,737,115,164 | 1,748,214,486 |
| වසර අවසානයේ ශේෂය | 3,737,115,164 | 1,748,214,486 |

## සටහන 13

| පොලී රහිත ණය | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| භාණ්ඩාගාර ණය | 50,000,000 | 50,000,000 |
| | 50,000,000 | 50,000,000 |

## සටහන 14

| විශ්‍රාම පාරිතෝෂික සදහා වෙන් කිරීම් | 2015 රු. | 2014 රු. |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | 163,913,534 | 154,251,000 |
| එකතු කළා - වර්ෂය තුළ වෙන් කිරීම් | 11,840,545 | 10,251,787 |
| ආරම්භක ශේෂය මත පොලී | 18,850,056 | 17,738,865 |
| ආයු ගණක (ලාභය) අලාභය | 17,400,306 | 2,345,370 |
| | 212,004,441 | 184,587,021 |
| අඩු කළා - වසර තුළ ගෙවූ මුදල | (22,168,804) | (20,673,487) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 189,835,637 | 163,913,535 |

## සටහන 15

| කල්බදු ආදයම් මත විලම්බිත අයභාර ආදායම | 2015<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| ඉදිරියට ගෙන ආ ශේෂය | 34,194,703 | 42,015,493 |
| අයභාර ගිණුමට මාරු කිරීම - ලැන් ලිබ් සමාගමේ කල්බදු | - | (6,908,670) |
| අයභාර ගිණුම්ට මාරු කිරීම - බිරැන්ඩික්ස් සමාගමේ කල්බදු | (666,666) | (666,666) |
| අයභාර ගිණුම්ට මාරු කිරීම - රජවැල්ල හෝල්ඩින්ග්ස් සමාගමේ කල්බදු | (245,455) | (245,455) |
| | 33,282,582 | 34,194,703 |

| සටහන 16 | | |
|---|---|---|
| ගෙවිය යුතු දෑ සහ වෙන් කිරීම් | 2015 රු. | 2014 රු. |
| කාර්‍ය මණ්ඩල ණයගිමියෝ | 17,916,832 | 16,067,875 |
| වෙළද සහ අනෙකුත් ණයගිමියෝ | 312,348,946 | 282,711,011 |
| උපචිත වියදම් | 18,439,969 | 21,325,991 |
| වෙන් කිරීම් | 124,655,081 | 66,451,873 |
| තැන්පත් | 21,053,226 | 14,368,288 |
| ගෙවිය යුතු සේවක අර්ථ සාධක අරමුදල | 8,465,568 | 6,065,715 |
| ගෙවිය් යුතු සේවා නියුක්තකයින්ගේ භාරකාර අරමුදල | 1,139,590 | 775,972 |
| | 504,019,212 | 407,766,725 |
| ගෙවිය යුතු එකතුකළ අගය මත බද්ද | 9,121,213 | 12,316,522 |
| කෙටිකාලීන ණය | - | - |
| ගෙවිය් යුතු රක්ෂණ ගෙවීම් | 2,616,014 | 1,143,050 |
| අත්තිකාරම් මුදල් S L P D | 140,000,000 | 140,000,000 |
| | 655,756,439 | 561,226,298 |

| සටහන 17 | | |
|---|---|---|
| කෙටිකාලීන ණය | 2015 රු. | 2014 රු. |
| මහජන බැංකුව - 100153693183 | 41,024,261 | 40,956,423 |
| මහජන බැංකුව - 100153694880 | 779,879 | - |
| මහජන බැංකුව - 873 | - | - |
| මහජන බැංකුව - 228 | - | - |
| Farm Shop 1001 6369 4865 | - | - |
| බඩ ඉරිඟු ව්‍යාපෘති | 1 | 1 |
| ගොවිපොළ ජංගම ගිණුම | (169,601) | 25,154,997 |
| | 41,634,540 | 66,111,421 |

| සටහන 18 | | |
|---|---|---|
| ඉදිරි මාස 12 තුළ ගෙවි යුතු ණය | 2015 රු. | 2014 රු. |
| මහජන බැංකු ණය මි. 50 | 12,500,000 | 16,666,667 |
| මහජන බැංකු ණය මි. 70 | 14,000,000 | - |
| කිරි ගොවි ණය - අදියර 1 | 710,494,212 | 42,341,819 |
| කිරි ගොවි ණය - අදියර 11 | 11,332,993 | - |
| මෝටර් රථ සඳහා ගෙවිය යුතු කල්බදු | 2,401,041 | 2,907,216 |
| පැරණි කැබ් රථ සඳහා ගෙවිය යුතු කල්බදු | 2,673,879 | 6,475,140 |
| ට්‍රැක්ටර් සඳහා ගෙවිය යුතු කල්බදු මුදල් | 2,867,136 | 2,867,136 |
| අධිශීතකරණ ට්‍රක් රථය සඳහා ගෙවිය යුතු කල්බදු මුදල් | 901,140 | 901,140 |
| යතුරු පැදි සඳහා ගෙවි යුතු කල්බදු මුදල් | 474,751 | 479,040 |
| නව කැබ් රථ සඳහා ගෙවිය් යුතු කල්බදු මුදල් | 9,637,220 | 9,724,080 |
| කිරි බවුසරය සඳහා ගෙවිය යුතු කල්බදු මුදල් | 652,740 | 652,740 |
| යතුරු පැදි සඳහා අවිනිශ්චිත පොලිය | (41,905) | (89,325) |
| නව කැබ් රථ සඳහා අවිනිශ්චිත පොලී | (2,672,457) | (3,376,367) |
| අධිශීතකරණ ට්‍රක් රථය සඳහා අවිනිශ්චිත පොලිය | (294,571) | (370,671) |
| කිරි බවුසරය සඳහා අවිනිශ්චිත පොලිය | (213,372) | (268,496) |
| මෝටර් රථ සඳහා අවිනිශ්චිත පොලිය | (110,354) | (378,666) |
| ට්‍රැක්ටර් සඳහා අවිනිශ්චිත පොලිය | (476,193) | (834,623) |
| කැබ් රථ සඳහා අවිනිශ්චිත පොලිය | (68,090) | (600,850) |
| | 764,058,171 | 77,095,980 |





## 2015 වසරෙහි පශු සම්පත් කාර්ය සාධනය

| ජීව විද්‍යාත්මක වත්කම් | සතුන් ප්‍රමාණය | 2015/01/01 දිනට සතුන් ප්‍රමාණය | එකතුකිරීම | | | | | සතුන් ප්‍රමාණය | අඩුවීම | | | | සතුන් ප්‍රමාණය | 2015.12.31ට සතුන් ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සතුන් ප්‍රමාණය | උපත් | සතුන් ප්‍රමාණය | මිළදී ගත් සතුන් ප්‍රමාණය | වැඩි වූ සතුන් ප්‍රමාණය | | මරණ ප්‍රමාණය | සතුන් ප්‍රමණය | විකුණුම් | අඩුවීම | | |
| ගවයින් හා මී හරක් | 9076 | 924,873,606 | 4536 | 14,594,888 | 4271 | 1,105,073,631 | 540,821,433 | 1446 | | 3688 | 54,719,298 | 298,359,564 | 12749 | 2,161,027,096 |
| එළුවන් | 776 | 6,568,390 | 269 | 187,403 | 235 | 439,195 | 3,019,832 | 200 | 706,944 | 278 | 1,341,065 | 465,426 | 802 | 7,701,385 |
| ඌරන් | 1068 | 7,933,665 | 3837 | 1,317,173 | 223 | 4,195,616 | 25,571,128 | 215 | 697,949 | 3567 | 9,936,962 | - | 1346 | 28,382,671 |
| බැටළුවන් | 4929 | 41,001,540 | 1665 | 1,943,034 | 351 | 2,352,710 | 21,986,307 | 987 | 4,047,316 | 1276 | 9,739,375 | - | 4682 | 53,496,900 |
| හාවන් | 0 | - | 0 | - | 44 | 62,663 | 3,115 | 6 | 9,813 | 3 | 1,152 | - | 35 | 54,813 |
| වටු කුරුල්ලා | 0 | - | 0 | - | 2422 | 415,134 | - | 462 | 32,340 | 951 | 73,109 | - | 1009 | 309,685 |
| තාරාවා | 6 | 732 | 0 | - | 301 | 38,910 | 439 | | - | 0 | - | - | 307 | 40,081 |
| කළුකුමා | 406 | 162,182 | 0 | - | | - | - | | - | 144 | 66,482 | 61,717 | 262 | 33,983 |
| බිත්තර සඳහා ඇති කරන කිකිළියන් | 3217 | 1,676,801 | 0 | - | 8893 | 3,875,432 | - | 215 | 18,020 | 4715 | 1,821,365 | 978,693 | 7180 | 2,734,155 |
| මස් සඳහා ඇති කරණ කුකුළන් | 29049 | 31,804,122 | 0 | - | 47141 | 33,599,675 | 24,725,354 | 2216 | 432,690 | 32443 | 23,845,890 | 19,841,026 | 41531 | 46,009,546 |
| වෙනත් | 2 | 220,000 | 0 | - | 0 | - | - | 0 | - | 0 | - | - | 2 | 220,000 |
| **එකතුව** | 48529 | 1,014,241,038 | 10307 | 18,042,497 | 63881 | 1,150,052,966 | 616,127,608 | 5747 | 77,202,670 | 47065 | 101,544,698 | 319,706,426 | 69905 | 2,300,010,315 |

## දැනට ක්‍රියාත්මක වන SLFRS / LKAS ප්‍රමිත (එලදායී 2012)

| SLFRS/ LKAS No. | **විස්තරය** | |
|---|---|---|
| SLFRS 1 | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS/ LKAS මුල්වරට සම්මත කර ගැනීම | |
| SLFRS 2 | කොටස් පාදක ගෙවීම් | අදාල නොවේ |
| SLFRS 3 | ව්‍යාපාර සංයෝජන | |
| SLFRS 4 | රක්ෂණ ගිවිසුම් | අදාල නොවේ |
| SLFRS 5 | විකිණීම සඳහා තබාගෙන ඇති ජංගම නොවන වත්කම් සහ ආයතනික මෙහෙයුම් | |
| SLFRS 6 | ඛණිජ සම්පත් සඳහා ගවේෂණය | අදාල නොවේ |
| SLFRS 7 | මූල්‍ය සාධන පත්‍ර හෙළිදරව්ව හා වගකීම | |
| SLFRS 8 | මෙහෙයුම් අංශය | |
| SLFRS 13 | ගිණි අගය මැනීම | |
| LKAS 1 | මුදල් ප්‍රකාශන ඉදිරිපත් කිරීම | |
| LKAS 2 | භාන්ඩ තොග | |
| LKAS 7 | මුදල් ප්‍රවාහ ප්‍රකාශන | |
| LKAS 8 | ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම හා වැරදි | |
| LKAS 10 | වාර්තා කරන කාලපරිච්ඡේදයට පසු සිදුවීම | |
| LKAS 11 | ඉදිකිරීම් කොන්ත්‍රාත් | අදාල නොවේ |
| LKAS 12 | ආදායම් බදු | |
| LKAS 16 | දේපල පිරියත හා උපකරණ | |
| LKAS 17 | කල් බදු | |
| LKAS 18 | අයභාරය | |
| LKAS 19 | සේවක ප්‍රතිලාභ | |
| LKAS 20 | රජයේ ප්‍රතිපාදන සඳහා ගිණුම්කරණය සහ වාර්ථාකරණය | |
| LKAS 21 | විදේශ විනිමය අනුපාතික වෙනස්කම්වල බලපෑම | අදාල නොවේ |
| LKAS 23 | ණය ගැණුම් පිරිවැය | අදාල නොවේ |
| LKAS 24 | සම්බන්ධිත පාර්ශවයන් හෙලිදරව් කිරීම | |
| LKAS 26 | විශ්‍රාම ප්‍රතිලභ සැලසුම් පිළිබඳ ගිණුම්කරණය හා වාර්තාකරණය | අදාල නොවේ |
| LKAS 27 | ඒකාබද්ද හා වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන | |
| LKAS 28 | ආශ්‍රිතයන්ගේ ආයෝජන | අදාල නොවේ |
| LKAS 29 | අධි උද්දමන ආර්ථිකවල මූල්‍ය වාර්තාකරණය | අදාල නොවේ |
| LKAS 31 | බද්ධ ව්‍යාපාරයන්හි හිමිකම් | |
| LKAS 32 | මූල්‍ය සාධන පත්‍ර ඉදිරිපත් කිරීම | |
| LKAS 33 | කොටසක ඉපයුම් | අදාල නොවේ |
| LKAS 34 | අතුරු මූල්‍ය වාර්ථාකරණය | අදාල නොවේ |
| LKAS 36 | වත්කම් හානිකරණය | |
| LKAS 37 | අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම් | |
| LKAS 38 | අස්පෘශ්‍ය වත්කම් | අදාල නොවේ |
| LKAS 39 | මූල්‍ය සාධන පත්‍ර හදුනාගැනීම හා මැනීම | |
| LKAS 40 | ආයෝජන දේපල | |
| LKAS 41 | කෘෂිකර්මය | |





# ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අදාල ප්‍රමිති

**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අදාළ ප්‍රමිති ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරන ප්‍රමිති - පළමු වරට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිති භාවිතා කිරීම.**

**ශ්‍රී.ලං.මු.වා.ප්‍ර.** 1 හී අරමුණ ආයතනයක් ප්‍රථම වරට මුදල් ප්‍රකාශන සකස් කිරීමේදී, **ශ්‍රී.ලං.මු.වා.ප්‍ර.** මුලින්ම භාවිතා කරන ක්‍රමවේදයක් සකස් කිරීමයි. **ශ්‍රී.ලං.මු.වා.ප්‍ර.** අරමුණ කිසියම් ආයතනයක පළමු එම ප්‍රමිති මුදල් ප්‍රකාශන හා එහි අදාළ කාලසීමාව තුළ අන්තර් මුදල් වාර්තාවද උසස් මට්ටමින් තොරතුරු අන්තර්ගතවන බව තහවුරු කිරීමයි. එනම්, භාවිතා කරන්නන්ට විනිවිද භාවයෙන් යුක්තද හා ඉදරිපත් කරන සියලුම කාලසීමා වලදී සන්සන්දනාත්මකද යන්න: අන්තර් ජාතික මුදල් වාර්තාකරණ ප්‍රමිතීන් යටතේ ගිණුම්කරණය සඳහා සුදුසු ආරම්භක ලක්ෂයක් සපයන්නේ ද සහ භාවිතා කරන්නන්ට ඇති ප්‍රතිලාභ ඉක්මවා නොයන වියදම දරන බවට සහතික විය හැකි ද: කලින් භාවිතා කළ ප්‍රමිතීන් (උදා : GAAP) ප්‍රමිතීන් අතහැර **ශ්‍රී.ලං.මු.වා.ප්‍ර.** වලට සංක්‍රමණය වීමේදී එය ආයතනයක මුදල් තත්ත්වය, මුදල් කාර්ය සාධනයට හා මුදල් ප්‍රවාහ වලට බලපාන්නේ කෙසේ ද යන්න අරම්භක ශේෂයට එකඟව විස්තර කිරීමට ආයතනයක් සමත් විය යුතු ය.

**ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. ව්‍යාපාර ඒකාබද්ධතා.**

**ශ්‍රී.ලං.මු.වා.ප්‍ර.** අරමුණ වාර්තාකරණ ආයතනයක් එහි ව්‍යාපාර ඒකාබද්ධතා එහි ප්‍රතිඵල පිළිබඳ සපයන මුදල් ප්‍රකාශනයේ එන තොරතුරු වල අදාළ භාවය , විශ්වසනීයත්වය හා සන්සන්දනාත්මක බව වැඩි දියුණු කිරීමයි. මෙය ඉටුකර ගැනීම සඳහා මෙම **ශ්‍රී.ලං.මු.වා.ප්‍ර.** මගින් ප්‍රතිපත්ති හා අවශ්‍යතා ස්ථාපිත කර දෙයි. අදාළ ආයතනය අත්පත් කර ගන්නාට එමගින් පහත කරුණු පැහැදිළි කර දෙනු ඇත. අත්පත්කර ගත් දේපල වත්කම් ගෙවීමට ඇති ණය වගකීම් හා කිසියම් පාලනයක් කළ නොහැකි අරමුණක් හඳුනා ගැනීම හා ඒ පිළිබඳව ගතයුතු ක්‍රියා මාර්ග : අත්පත් කර ගත් ව්‍යාපාරය සම්බන්ධ හොඳ හිත හෝ කේවල් කර වෙළෙඳාමෙන් ලබා ගත් ලාභය හඳුනා ගැනීම හා ඒ පිලිබඳ ක්‍රියා මාර්ග සහ මුදල් ප්‍රකාශ භාවිතා කරන්නන් ට ව්‍යාපාර සම්බන්ධ මුදල් ප්‍රතිඵල වල ස්වභාවය තක්සේරු කිරීමට හැකිවන බවට කුමන තොරතුරු අනාවරණය කරන්නේ ද යන්න තීරණය කිරීම.

**ප්‍රධාන අර්ථ විවරණය : ව්‍යාපාර සම්බන්ධතා.**

ව්‍යාපාර සම්බන්ධතාවක් යනු අත්පත් කර ගන්නා පුද්ගලයා ව්‍යාපාරයක හෝ කිහිපයක පාලනය ලබා ගනිමින් කරන ගනුදෙනුවක් හෝ අවස්ථාවකි. ව්‍යාපාරයක් යනු ඒකාබද්ධ වූ ක්‍රියාකාරකම් සමුදායක් සමග වත්කම් ලෙස අර්ථකතනය කර තිබේ. එම වත්කම් හෝ ක්‍රියාකාරකම් එහි ආයෝජකයන් හෝ වෙනත් අයිතිකරුවන්ට, සාමාජිකයින්ට හෝ සහභාගි වන්නන්ට සෘජුවම ආපසු ප්‍රතිලාභ ලැබෙන පරිදි මෙහෙයවීමට හෝ පාලනය කිරීටම හැකි ය.

**SLFRS 1 : ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS මුල්වරට සම්මත කරගැනීම**

මෙම SLFRS 1 හි අරමුණ අස්ථිත්වයක විසින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් මුල් වරට උපයෝගී කරගනිමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඉදිරිපත් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය නියම කිරීමයි. මෙම SLFRS හි අරමුණ අස්ථිත්වයක පළමු මූල්‍ය ප්‍රකාශන සහ එම මූල්‍ය ප්‍රකාශන ආවරණ කරන කාල පරිච්ඡේදයේ කොටස් සඳහා වූ එහි අතුරු මූල්‍ය වාර්තා ඉහළ ගුණාත්මක භාවයකින් යුක්ත තොරතුරු ඇතුලත් ව පරිශීලකයන්ට විනිවිදභාවයකින් යුක්ත සහ ඉදිරිපත් කරන සියලුම කාල පරිච්ඡේදයන් පුරා සංසන්දනය කිරීමේ හැකියාව සහ **ශ්‍රී.ලං.මු.වා.ප්‍ර.** ප්‍රකාර ගිණුම්කරණය සඳහා යෝග්‍ය ආරම්භක ලක්ෂයක් සලසා දීම සහ ප්‍රතිලාභ ඉක්මවා නොයන පිරිවැයකට ජනනය කිරීමට හැකියාව තහවුරු කිරීමයි.

SLFRS 3 : **ව්‍යාපාර සංයෝජන**

මෙම SLFRS 3 හි අරමුණ වන්නේ ව්‍යාපාර සංයෝජන සහ එහි බලපෑම පිළිබඳව වාර්තාකරණය කරනු ලබන අස්තීත්වයක් විසින් එහි මූල්‍ය ප්‍රකාශනයන් හි සපයනු ලබන තොරතුරු වල අදාලත්වය

විශ්වාසදායකවත් සහ සංසන්දනාත්මක බව වඩා යහපත් තත්වයකට පත් කිරීමයි. මෙය සම්පූර්ණ කරගැනීමට මෙම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා ප්‍රමිතය අත්පත් කරනු ලබන්නාගේ කටයුතු කළයුතු ආකාරය සඳහා මූලධර්ම හා අවශ්‍යතාවන් ප්‍රතිෂ්ඨානය කරයි. එහි මූල්‍ය ප්‍රකාශනයන් අත්පත්කර ගත් හඳුනාගන්නාගේ වත්කම් පවරාගන්නා ගේ වගකීම් සහ අත්පත් කරගැනීමට භාජනය වන්නාගේ පාලනයට යටත් නොවන හිමිකම් හඳුනාගැනීම සහ මිනුම් කිරීම සහ ව්‍යාපාර සංයෝජනයක දී අත්පත් කරගන්නා කීර්තිනාමය හෝ කේවල් කර මිල දී ගැනීමක් මගින් වන ප්‍රතිලාභ හඳුනාගැනීම සහ මිනුම් කිරීම සහ ව්‍යාපාර සංයෝජනයකදී ස්වභාවය සහ මූල්‍ය බලපෑම් අගැයීමට, මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන්ට හෙළිකළ යුතු තොරතුරු මොනවා දැයි නිශ්චය කිරීම ප්‍රතිෂ්ඨනය කරනු ලබන මූලධර්ම හා අවශ්‍යතාවන් වේ.

**ප්‍රධාන නිර්වචනය - ව්‍යාපාර සංයෝජනය**

ව්‍යාපාර සංයෝජනය යනු පවරා ගන්නෙකු විසින් ව්‍යාපාර එකක හෝ ඊට වැඩි ගණනක පාලනය ලබා ගැනීමේ අදහසින් කරනු ලබන ගනුදෙනුවක් හෝ සිදුවීමකි. ව්‍යාපාරයක් යනු ආයෝජකයින්ට හෝ අනිකුත් අයිතිකරුවන්ට හෝ සාමාජිකයින්ට හෝ සහභාගිවන්නන් හට සෘජුවම ලාභාංශ, පිරිවැය අවම කිරීම හෝ වෙනත් ආර්ථික ප්‍රතිලාභ ස්වරූපයෙන් ප්‍රතිලාභයක් ලබාදීමේ අරමුණින් මෙහෙයවීමේ සහ පාලනය කිරීමේ හැකියාව ඇති එකිනෙකට සම්බන්ධ වූ ක්‍රියාකාරකම් සහ වත්කම් සමූහයකි.

**SLFRS 7 : මූල්‍ය සාධන පත්‍ර හෙළිදරව් කිරීම**

මෙම SLFRS 7 අනුව පහත සඳහන් හෙළිදරව් කිරීම් අවශ්‍ය කෙරේ.

අ) අස්ථිත්වයේ මූල්‍ය තත්වය සහ කාර්යය සාධනය සඳහා මූල්‍ය සාධන පත්‍රවල වැදගත්කම

ආ) මූල්‍ය සාධන පත්‍ර අවදානමට නිරාවරණයවීම පිළිබඳව ණය අවදානම, ද්‍රවශීලතා අවදානම සහ වෙළඳපොළ අවදානම යන නියමිත අවම හෙළිදරව් කිරීම් ඇතුළත්ව ගුණාත්මක සහ ප්‍රමාණාත්මක තොරතුරු හෙළිදරව් කිරීම්

ඇ) අස්ථිත්වයක් විසින් සිය මූල්‍ය සාධන පත්‍ර සමාන පන්ති වලට කාණ්ඩ කළයුතු වන අතර හෙළිදරව් කිරීම් අවශ්‍ය වන විට පන්තින් අනුසාරයෙන් හෙළිදරව් කිරීම් කළ යුතුය. එම වර්ග පහත සඳහන් ය.

අ) ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකම් අගය මත තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් වෙන් වෙන් ව දක්වමින්

1. මුලින් ම හඳුනාගත් වශයෙන් නම් කරන ලද සහ
2. LKAS 39 අනුව වෙළඳ කටයුතු සඳහා රඳවාගෙන ඇති වත්කම් වශයෙන් වර්ගීකරණය කර ඇති මූල්‍ය වත්කම්

ආ) කල් පිරීම සඳහා ඇති ආයෝජන

ඇ) ණය සහ ලැබිය යුතු දෑ

ඈ) විකිනීම සඳහා ඇති මූල්‍ය වත්කම්

ඉ) ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකම් අගය මත තක්සේරු කරන ලද මූල්‍ය වගකීම් වෙන් වෙන් ව දක්වමින්

1. මුලින්ම හඳුනාගත් වශයෙන් නම් කරන ලද සහ
2. LKAS 39 අනුව වෙළඳ කටයුතු සඳහා රඳවාගෙන ඇති වත්කම් වශයෙන් වර්ගීකරණය කර ඇති මූල්‍ය වගකීම්

ඊ) ක්‍රමක්ෂය කරන ලද පිරිවැය මත මිනුම්කරණ ලද මූල්‍ය වගකීම්

## LKAS 1 : මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිත LKAS 1 මගින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ පදනම විසතර කිරීම කෙරේ. මෙම ප්‍රමිතය මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ සමස්ත අවශ්‍යතාවන් මූල්‍ය ප්‍රකාශ වල ව්‍යුහය සඳහා මඟපෙන්වීම සහ මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගතයෙහි අඩංගු අවම අවශ්‍යතාවන් විස්තර කරයි. LKAS 1 මගින් ශේෂපත්‍ර සහ විස්තීර්ණ ආදායම් ගිණුම්වල මුහුණත මත දැක්විය යුතු අවම විස්තර මට්ටම නියම කෙරේ. තව ද, සාධාරණ ඉදිරිපත් කිරීම, උපචිත පදනමින් ගිනුම්කරණය ඉදිරිපත් කිරීමේ සංගත භාවය, සැලකිය යුතු භාවය, සම්මුචිත භාවය හා සංසන්දනාත්මක භාවයෙන් තොරතුරු සැපයීම වැනි සමස්ත අවශ්‍යතාවයන් නිර්වචනය කෙරේ. මූලික මූල්‍ය ප්‍රකාශ වල අඩංගු විය යුතු මූලිකාංග හතරක්





LKAS 1 මගින් නිර්වචනය කෙරෙන අතර ඒවායේ අවම ව්‍යුහය හා එක් එක් අංගයන් හි අන්තර්ගතය ද නියම කෙරේ

- කාල පරිච්ඡේදය සඳහා වන මූල්‍ය තත්ත්වය දක්වන ප්‍රකාශය (ජංගම සහ ජංගම නොවන වශයෙන් වෙන් කරන ලද)
- කාල පරිච්ඡේදය සඳහා වන විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
- කාල පරිච්ඡේදය සඳහා වන ස්කන්ධයෙහි වෙනස්වීම් දක්වන ප්‍රකාශය
- කාල පරිච්ඡේදය සඳහා වන මුදල් ප්‍රවාහය දක්වන ප්‍රකාශය (LKAS 7)

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සඳහා අස්ථිත්වයක් විසින් හඳුනාගත් සියලු අදායම් හා වියදම් අයිතමයන් පහත සඳහන් පරිදි ඉදිරිපත් කළ යුතුය.

අ) විස්තීර්ණ ආදායම් ප්‍රකාශය වශයෙන් තනි ප්‍රකාශයකින් හෝ

ආ) ප්‍රකාශන දෙකකින් : ලාභාලාභ සංරචක දැක්වෙන ප්‍රකාශයකින් (වෙනම ආදායම් ප්‍රකාශයක්) සහ අනෙක් විස්තීර්ණ ආදායම් වල සංරචක දක්වමින් ලාභය හෝ අලාභ ශේෂයන්ගෙන් ආරම්භ වන දෙවන ප්‍රකාශයකින් (විස්තීර්ණ ආදායම් ප්‍රකාශය) කාල පරිච්ඡේදයක් සඳහා වන ලාභය හෝ අලාභ ශේෂයන් සමග එම කාලය සඳහා වන අනෙකුත් හඳුනාගත් ආදායම් අයිතමයන් විස්තීර්ණ ආදයම් ප්‍රකාශයක් තුළ අඩංගු විය යුතුය. අනෙකුත් විස්තීර්ණ ආදායම් වල සංරචක අතර පහත සඳහන් දේ ද අඩංගු වේ.

- ප්‍රත්‍යාගණන අතිරික්ත වල වෙනස්කම් (LKAS 16 හා LKAS 38)
- LKAS 19 හි 93 A ඡේදය අනුව හඳුනාගත් නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභ සහ අලාභ
- විදේශීය මෙහෙයුමක මූල්‍ය ප්‍රකාශන පරිවර්තනය කිරීම තුළින් පැන නගින ලාභ සහ පාඩු
- විකිණීම මෙහෙයුමක මූල්‍ය ප්‍රකාශන පරිවර්තනය කිරීම තුළින් පැන නගින ලාභ සහ පාඩු
- විකිණීම සඳහා තබාගෙන ඇති මූල්‍ය වත්කම් නාරත මිනුම්කරණයේ දී ඇතිවන ලාභ සහ පාඩු (LKAS 39)
- ඉදිරි රැකුම් මුදල් ප්‍රවාහයෙහි ඉදිරි රැකුම් සාධන පත්‍ර මත ඇතිවන ලාභ පාඩු වල ඵලදායී කොටස කාලයක් සඳහා ආදායමක් එම කාලය සඳහා ලැබූ ලාභය හෝ අලාභය සහ එම කාලය තුළ පිළිගත් වෙනත් ආදායම් ඇතුළත් වේ. වෙනත් ආදායමක් ඇති දේ ඇතුළත් වේ:
- ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙනස් (LKAS 16 සහ LKAS 38).
- LKAS 19 ඡේදය 93A අනුව පිළිගත් අර්ථ ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභ හා පාඩු
- ලාභ සහ විදේශ මෙහෙයුම් මූල්‍ය ප්‍රකාශන (LKAS 21) පරිවර්තනය වේ.
- නැවත මිනුම් ලබා ගත හැකි මූල්‍ය වත්කම් (LKAS 39) මත ලාභ සහ පාඩු.
- මුදල් ප්‍රවාහ (LKAS 39) ඇති උපදෙස් හෙජින් මත ලාභ හා පාඩු වූ ඵලදායී කොටසක්.

**LKAS 2 : තොග**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 2 මගින් ඓතිහාසික පිරිවැය ක්‍රමය යටතේ තොග සඳහා ගිණුම්කරණ ක්‍රම නියම කරනු ලැබේ. තොගවල පිරිවැය තීරණය කිරීම සඳහා හා ශුද්ධ උපලබ්ධි වටිනාකමට ලියා හරින ලද වටිනාකම ඇතුළුව පසුව වියදමක් වශයෙන් හඳුනාගැනීම සඳහා මග පෙන්වීමක් සැපයීම මෙම ප්‍රමිතයෙන් සිදු කෙරේ. තොග සඳහා පිරිවැය තීරණය කරන පිරිවැය සූත්‍ර පිළිබඳව මග පෙන්වීමක් ද මෙමගින් සැපයෙයි. සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කිරීමේ දී විකිණීම සඳහා තබා ඇති වත්කම් (නිම වූ භාණ්ඩ), සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කිරීමේ දී විකිණීම සඳහා නිෂ්පාදන ක්‍රියාවලියේ ඇති වත්කම් (නොනිමි භාණ්ඩ), සහ නිෂ්පාදන ක්‍රියාවලියේ දී උපයෝගී කරගනු ලබන ද්‍රව්‍ය සහ සැපයුම් (අමු ද්‍රව්‍ය) තොග ගණයට ඇතුලත් වේ. කෙසේ වෙතත්, සමහර තොග වර්ග මෙම ප්‍රමිතය මගින් සිය විෂය පථයෙන් නිදහස් කර ඇත

ඉදිකිරීමේ කොන්ත්‍රාත් තුළින් පැන නගින නොනිමි වැඩ (ඉදිකිරීම් කොන්ත්‍රාත් - (LKAS 11 බලන්න) මූල්‍ය සාධන පත්‍ර (LKAS 39 බලන්න - මූල්‍ය සාධන පත්‍ර) පශු සම්පත්, වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන, ඛණිජ සහ ඛණිජ ආශ්‍රිත නිෂ්පාදන ඒවා ශුද්ධ උප ලබ්ධි අගයට මැනීම කළ තොග වැනි නිෂ්පාදකයින් ගේ තොග ( පිරිවැයට ඉහළ හෝ පහළ) ස්ථාපිත කර්මාන්ත පිළිවෙත අනුව මැනීම් කළ තොග.

LKAS 2 හි මූලික  මූලධර්මය අනුව, පිරිවැයෙන් අඩු අගයෙන් සහ ශුද්ධ උප ලබ්ධි අගයට මිනුම් කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි අගය යනු විකුණුම් අගයෙන් තොගය වර්තමාන තත්ත්වයට ගෙන ඒමට සහ විකිණීමට දැරූ වියදම අඩු කළ පසු ලැබෙන අගයයි. පිරිවැය යනු තොගය  වත්මන් තත්ත්වයට සහ වත්මන් පිහිටි ස්ථානයට ගෙන ඒම සඳහා දරන ලද සියලු වියදම් ඇතුලත් වියදමකි. යම් නිශ්චිත පිරිවැයක් තීරණය කළ නොහැකි නම් මිනුම් ලකුණ ප්‍රතිකර්මය වනුයේ පළමු ගැනීමයි.

තොගයේ පිරිවැය වියදමක් වශයෙන් හඳුනාගනු ලබන්නේ සම්බන්ධිත ආදායම හඳුනාගනු ලබන කාල පරිච්ඡේදයේ දී ය. තොගයේ අගය ශුද්ධ උප ලබ්ධි අගයට ලියා හරිනු ලැබ අත්නම් . ලියා හරින ලද අගය වියදමක් වශයෙන් කරනු ලැබේ. පසු කාල පරිච්ඡේදයක දී එලෙස ලියා හරින ලද අගය ආපස්සට හැරෙව්වොත්, එම අගය විකුණූ භාණ්ඩ වල පිරිවැය අඩුකරමින් ආදායමට බැර කරනු ලැබේ. පහත සඳහන් විෂයන් අවශ්‍ය කරන හෙළිදරව් කිරීම් වලට ඇතුලත්ය.

- ගිණුම්කරණ ප්‍රතිපත්ති
- භාණ්ඩ අනුව තොග වල ධාරණ අගය
- ආපස්සට හරවන ලද ලියා හරින ලද අගයක්
- වගකීම් සඳහා ඇපයක් වශයෙන් තබන ලද තොගවල ධාරණ අගය
- කාල පරිච්ඡේදය සඳහා වියදමක් වශයෙන් හර කරන ලද තොගයේ පිරිවැය

**LKAS 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශන**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 7 මගින් අස්ථිත්වයක් විසින් අස්ථිත්වයේ මුදල් සහ මුදල් වලට සමාන දෑ වල ඓතිහාසික වෙනස්වීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශන මාර්ගයෙන් කෙසේ තොරතුරු ඉදිරිපත් කළ යුතු ද යන්න නියම කරයි. කාල පරිච්ඡේදයක් තුළ මුදල් ප්‍රවාහයන් වල ගලා යෑම මෙහෙයුම් ආයෝජන සහ මූල්‍ය වශයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් වර්ගීකරණය කරයි. මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් මුදල් සහ මුදල් වලට සමාන දෑ වල කාල පරිච්ඡේදයක් තුළ සිදුවන්නා වූ වෙනස් වීම් විස්තර කරයි. කාල පරිච්ඡේදයක් තුළ මුදල් ප්‍රවාහයන්වල ගලායෑම මෙහෙයුම් ආයෝජන සහ මූල්‍ය ක්‍රියාකාරකම් වශයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් වර්ගීකරණය කළයුතුයි.

- මුදල් වලට සමාන දෑ කෙටි කාලීන වන අතර සැලකිය යුතු නොවන වටිනාකමෙහි අගය වෙනස් වීමේ අවදානම් වලට භාජනය වන ඉහළ ද්‍රවශීල ආයෝජනයකි. මෙහෙයුම් ක්‍රියාකාරකම් : සෘජු හා සෘජු නොවන ක්‍රම යොදාගෙන ඉදිරිපත් කළ හැක. සෘජු ක්‍රමය තුළින් ගණුදෙනුකරුවන්ගෙන් ලැබෙන ලැබීම් පෙන්නුම් කරන අතර සැපයුම් කරුවන්  සේවකයින් රජයේ බදු ගෙවීම යනාදිය පෙන්නුම් කෙරේ. වක්‍ර හෙවත් සෘජු නොවන ක්‍රමය තුළින් උපචිත පදනම අනුව ශුද්ධ ලාභාලාභයෙන් ආරම්භවන අතර මුදල් නොවන අයතමයන් සඳහා ගැළපීම් සිදුකරනු ලබයි.

- ආයෝජන ක්‍රියාකාරකම් : අත්පත් කරගැනීමෙන් හෝ දේපළ පිරියත හා උපකරණ විකිණීමෙන් ඇති වන මුදල් ලැබීම් සහ ගෙවීම් වෙන් වෙන් වශයෙන් හෙළිදරව් කිරීම්: ස්කන්ධය හෝ අනෙක් ආයතන වල ණය සාධන පත්‍ර අත්පත් කරගැනීමෙන් හෝ විකිණීමෙන් (පරිපාලිතයන් අත්පත් කරගැනීම හෝ විකිණීම අතුලත්ව): තුන් වන පාර්ශවයන්ට දුන් අත්තිකාරම් සහ ණය හෝ තුන් වන පාර්ශවයන්ගෙන් ආපසු ලැබුණ අත්තිකාරම් සහ ණය

- මූල්‍ය ක්‍රියාකාරකම් : කොටස් හෝ අනෙක් ස්කන්ධ ආරක්ෂණ නිකුත් කිරීමෙන් ඇතිවන මුදල් ලැබීම් සහ ගෙවීම් වෙන් වෙන් වශයෙන් හෙළිදරව් කිරීම් : එකී ඇප යනාදිය බේරා ගැනීම සඳහා කරන ලද ගෙවීම් : ණය ඔප්පු පත්‍ර, ණයකර පත්‍ර යනාදිය නිකුත් කිරීමෙන් ලැබුනා වූ මුදල්: සහ අනෙක් ශීර්ෂ දෙකින් එකක් යටතේ නිශ්චිතව හඳුනාගත නොහැකි නැවත ගෙවීම් ක්‍රියාකාරකම්, මුදල් ප්‍රවාහයන්ට හේතු නොවන ආයෝජන ක්‍රියාකාරකම් සහ මූල්‍ය ක්‍රියාකාරකම් මුදල් ප්‍රවාහ ප්‍රකාශන (ණය නිකුත් කිරීම් වලින් දේපළ අත්පත් කරගැනීම් වැනි මූල්‍ය නොවන ගණුදෙනු) වලින් බවත් කළ යුතු අතර ඒවා වෙනම පෙන්විය යුතුය.





LKAS 8 - **ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් හා වැරදි**

LKAS 8 සාමාන්‍ය කටයුතු හා අසාමාන්‍ය භාණ්ඩ වලින් ලැබෙන ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කළ යුතු ආකාරය දක්වයි. LKAS 8 ද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ඇස්තමේන්තුවල වෙනස්කම් දෝෂ හා වෙනස්කම් සඳහා ගිණුම්ගත කළ යුතු ආකාරය දක්වයි.

දෝෂ පවතින බව පෙර මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට තොරතුරු මත පදනම් පෙර කාලය මූල්‍ය ප්‍රකාශ, අලුතින් සොයා තවදුරටත් අතවරවලට ලක්වීමට හෝ සාවද්‍ය ලෙස අර්ථ නිරූපනය කර ඇත. සියලු ද්වරය වැරදි සියලු කලින් කාල ඉදිරිපත් අඟවා සිටියේ හා ඉදිරිපත් කරන ලද මුල්ම පෙර කාලය රදවා විවෘත ඉතිරි ගැලපීමෙන් විසින් වෙමින් පැවතිනි ගිණුම්ගත කළ ඇත. ආදායම හිමියේ සාමූහික බලපෑම, පිළිගැනීමක් තහනම් කරනු ඇත.

## LKAS 10 (ඉදිකිරීම් කොන්ත්‍රාත්)

මෙය මූලික වශයෙන් ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් වල ආර්ථික ප්‍රතිඵල හෙළිදරව් කරන කරුණකි.

LKAS 12 : (ආදායම් බදු)

මෙම ප්‍රමිතයේ අරමුණ වනුයේ ආදායම් බදු සඳහා ගිණුම්කරණ ක්‍රියාවලිය නියම කිරීමයි. පහත සඳහන් අවස්ථාවල දී වර්තමාන සහ ඉදිරි බදු වලින් පැන නගින ප්‍රතිඵල සම්බන්ධයෙන් ගිණුම්කළ යුත්තේ කෙසේ ද යන්න ගිණුම්කරණයේ දී ඇතිවන ප්‍රධාන ගැටලුවක් වන්නේ ය.

- අස්ථිත්වයක ශේෂ පත්‍ර දිනට හඳුනාගත් වත්කම් ( වගකීම්) වල ධාරණ අගයෙහි ඉදිරි අයකර ගැනීම් (ගෙවා නිම කිරීම) සහ
- අස්ථිත්වයක මූල්‍ය ප්‍රකාශවල වත්මන් කාල පරිච්ඡේදයේ හඳුනාගත් ගණුදෙනු සහ අනෙකුත් සිද්ධීන් ප්‍රධාන නිර්වචනය : ප්‍රවර්තන බදු : කාල පරිච්ඡේදයක් සඳහා බදු අයකළ හැකි ලාභ(බදු පාඩු) සම්බන්ධයෙන් වන ගෙවිය යුතු ආදායම් බදු ප්‍රමාණය (අය කරගත හැකි) විලම්භිත බදු වගකීම් : බද්දට යටත් වන තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් ඉදිරි කාල පරිච්ඡේදයන් තුළ ගෙවිය යුතු ආදායම් බදු ප්‍රමාණය විලම්භිත බදු වත්කම්: පහත සඳහන් අවස්ථා වල දී ඉදිරි කාල පරිච්ඡේදයන් තුළ අය කල හැකි ආදායම් බදු ප්‍රමාණය

අ)  අඩු කළ හැකි තාවකාලික වෙනස්කම්:
ආ) භාවිතා නොකරන ලද බදු බැරකම් වල ධාරණ අගය

LKAS 16 : **(දේපල පිරියත හා උපකරණ)**

මුලින්ම හඳුනාගැනීම සහ පසුව කරනු ලබන දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ගිණුම්කරනය විය යුතු ආකාරය මෙම LKAS 16 ප්‍රමිතය මගින් නියම කෙරේ. දේපළ පිරියත හා උපකරණ හඳුනාගත යුත්තේ පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙනය.

අ)  එම වත්කම් තුළින් ඉදිරි ප්‍රතිලාභ ගලා ඒමට ඉඩ ප්‍රස්ථාව ඇති විටෙක සහ
ආ) එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි විට මුලින්ම කරනු ලබන මිනුම්කරණය කළ යුත්තේ පිරිවැය මතය. දෙවනුව මිනුම් ලකුණු ප්‍රතිකර්මය යොදා ගත යුත්තේ ක්ෂය කරන ලද පිරිවැය මතය. එහෙත් අවසරලත් විකල්පය වනුයේ ප්‍රත්‍යාගණන මාදිලිය උපයෝගී කරගැනීමය. ( සාධාරණ වෙළඳ අගයට සමාන)

**ප්‍රධාන මූලධර්ම**
**ක්ෂය කිරීම්:**

- ඉඩම් නොවන දීර්ඝ ජීවිත කාලයක් ඇති වත්කම් එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ ක්‍රමානුකූල පදනමක් මත ක්ෂය කළ යුතුය

- ක්ෂය කිරීම් වල පාදකය වනුයේ වත්කමක ඇස්තමේන්තු කරන ලද අවශේෂ අගය පිරිවැයෙන් අඩු කල පසු ලැබෙන අගයයි. වත්කමක ආර්ථික ප්‍රතිලාභ අස්ථිත්වයක් විසින් පරිභෝජනය කරන ආකාරය යොදා ගනු ලබන ක්ෂය ක්‍රමයෙන් පිළිබිඹුවිය යුතුය.
- වත්කම් ප්‍රත්‍යාගණනයට භාජනය වී ඇත්නම් ක්ෂය කිරීම් පාදක විය යුත්තේ ප්‍රත්‍යාගණිත අගයෙනි
- වත්කමක ප්‍රයෝජනවත් ජීවිත කාලය අවශේෂ අගය සහ ක්ෂය කිරීම් ක්‍රමය වාර්ෂික පදනමක් මත සමාලෝචනය කළයුතු අතර එහි කරනු ලබන්නා වූ වෙනස්කම් පෙර දක්නා ලෙස පෙන්නුම් කළ යුතුය.
- වත්කමක ප්‍රයෝජනයත් ජීවිත කාලය අවසානායේ දී දැරීමට සිදුවන සැලකිය යුතු වියදම් වත්කමෙහි අවශේෂ අගය අඩු කොට පෙන්වීමෙන් හෝ එම පිරිවැය වත්කමෙහි ජීවිත කාලය ඇතුලත වියදමක් වශයෙන් සැලකිය යුතුය.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් අනුව, දැනට සම්පූර්ණයෙන් ම ක්ෂය කිරීම් වලට භාජනය කර ඇති මණ්ඩලයට අයත් ඉතා පැරණි වාහන දැන් රජයේ තක්සේරුකරු විසින් වටිනාකම තක්සේරු කරගෙන යන අතර වටිනාකම සම්බන්ධ තක්සේරු වාර්තා ලැබුන විගස, එයට අදාළ සටහන් ගිණුම් පොත්පත්වල තබනු ඇත.
- පිරිවැය ආකෘතිය භාවිතා කරන්නේ නම්, දේපළ පිරියත හා උපකරණ අයිතමන් හි මුළු පිරිවැයට සාපේක්ෂව දේපළ පිරියත හා උපකරණ වත්කම් වල එක් එක් අයිතමයන් හි කොටස් වල පිරිවැය සැලකිය යුතු ප්‍රමාණයක් නම්, අයිතමයේ පිරිවැය වෙනමම ක්ෂය කළ යුතුය. ( සංරචක ප්‍රවේශය 11
- එසේම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පහත සඳහන් ක්ෂය අනුපාත අනුගමනය කර තිබේ.

| අයිතමය | ක්ෂය අනුපාතය |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| යන්ත්‍ර හා උපකරණ | 10% |
| වතු උපකරණ | 5% |
| කාර්යාල උපකරණ | 20% |
| ලීබඩු හා සවිකිරීම් | 10% |
| ව්‍යුහ | 5% |
| මෝටර් වාහන | 10% |

වත්කම් ගේ මුදල් අයකර ගැනීමට එහි ඉසිලුම් ප්‍රමාණය අඩු නම්, පහත වැටීම ආදායම (එය කොටස් වෙත මීට පෙරණය අන්තිම පුරුක් මිස) පිළිගත් හා චෝදනා කළ යුතුය. යම් අයිතමයක විශ්‍රාම යාම හෝ බැහැර මත ලාභ හෝ පාඩු ඉසිලුම් ප්‍රමාණය ඇසුරින් ගණනය කළ යුතුය. අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත්

ව්‍යාපාර ප්‍රතිසන්ධාන

**ව්‍යාපාර සංහිදියාව**

- ප්‍රාග්ධන කැපවීම්.
- ආරක්ෂාකාරී ලෙස භාණ්ඩ සුරක්ෂිතකිරීම.
- වත්කම් නැවත තක්සේරු කිරීම කරන්නේ නම්, ඓතිහාසික පිරිවැය ප්‍රමාණයක් අනාවරණය කිරීම.
- ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙනස්.

### LKAS 17 - **කල් බදු දීමනා කරුවෙකු සඳහා වන ගිණුම්කරණය**

කල් බදු දීමනාකරුවන් සඳහා මූල්‍ය කල් බදු ලැබිය යුතු දෑ වශයෙන් ගිණුම් තැබිය යුතු අතර කල් බදු ආදායම් හඳුනාගත යුත්තේ කාලයෙන් කාලයට ලැබෙන නියත ප්‍රතිලාභ අනුපාතිකය අනුවය. ඉදිරි අවම බදු කුලී සහ ශුද්ධ ලාභාලාභ ගිණුම් වල ඇතුලත් අසම්භාව්‍ය කුලි බදු පිළිබඳව තොරතුරු කල් බදු දීමනා කරුවන් විසින් හෙළිදරව් කල යුතුය. කල් බදු දීමනාකරුවන් විසින් මූල්‍ය ආදායම් වෙන් කිරීම සඳහා ශුද්ධ ආයෝජන ක්‍රමය භාවිතා කල යුතුය. ශුද්ධ මුදල් ආයෝජන ක්‍රමය සඳහා දැන් අවසර දෙනු නොලැබේ.



වාර්ෂික වාර්තාව 2015

**මූල්‍ය කල්බදු** (බදුකරු ගණකාධිකරනය)

- මෙම බදුකරු සාධාරණ අගය පහළ අවසන් සහ අවම බදු ගෙවීම් වර්තමාන වටිනාකම දී මූල්‍ය කල්බදු නෙලා යුතුය.
- කුලියට ගැනීම ගෙවීම්, (i) වගකීම අඩු, සහ (ii) එම වගකීම අනුකූලව අඩු කිරීමට සැලසුම් කරන ලද මූල්‍ය භාර බෙදී කළ යුතුය.
- මෙම බදුකරු අවසානයේ අයිතිය කිසිදු සාධාරණ නිශ්චිත නැත නම් මිස, ප්‍රයෝජනවත් ජීවිතය භාවිතා බදු වත්කම් මත ක්ෂය ගණනය කළ යුතුය. අග දී, ප්‍රයෝජනවත් ජීවිතයේ කෙටි හා බදු කාලීන භාවිතා කළ යුතුය.
- මෙම බදුකරු කුලියට වියදම් අනාවරණය, sublease කුලී, සහ කල් බදු කටයුතු පිළිබඳ විස්තරයක් ඇතුළත් විය යුතුය.
- මෙම බදුකරු මෙහෙයුම් බදු ගෙවීම් වියදම් ගලා යුතුය.

බදුහිමියා සඳහා ගිණුම්කරනය:

- බදු හිමියා සඳහා, ලැබිය සහ බදු ආදායම් නැවත නිරන්තර ආවර්තිතා අනුපාතය පදනම මත කළ යුතු බව ලෙස මූල්‍ය කල්බදු වාර්තා කළ යුතුය.
- බදු හිමියා අවිනිශ්චිත කුලී අනාගත අවම බදු කුලී, පමාණය ගැන අනාවරණය තොරතුරු ශුද්ධ ලාභය හෝ අලාභය ඇතුළත් කළ යුතුය.
- බදු හිමියා මූල්‍ය ආදායම වෙන් කිරීමට ශුද්ධ ආයෝජන ක්‍රමය භාවිතා කළ යුතු බව ශුද්ධ මුදල් ආයෝජන ක්‍රමය තවදුරටත් අවසර

### LKAS 18 : **අයභාර**

මෙම LKAS 18 ප්‍රමිතයේ අරමුණ වනුයේ භාණ්ඩ විකුණුම් සේවාවන් සැලසීම පොලී හිමිකම් සහ ලංභාංශ වැනි ගණුදෙනු සහ සිද්ධිවලින් ඇතිවන අයභාර පිළිබඳව අනුගමනය කල යුතු ගිණුම්කරණ ක්‍රමවේදය නියම කිරීමයි.

ප්‍රධාන නිර්වචනය : අයභාරය: අස්ථිත්වයක් තුළ සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන (භාණ්ඩ විකුණුම් සේවාවන් සැලසීම පොලී හිමිකම් සහ ලාභාංශ වැනි) දල ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම් (මුදල් ලැබිය යුතු දෑ සහ අනෙකුත් වත්කම්

**අයභාර මැනීම**

ලැබුණු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය මත අයභාර මැනිය යුතුය. අයභාර ජනිත කරන එක සමාන වටිනාකමෙන් සහ ස්වාභාවයෙන් යුක්ත භාණ්ඩ සහ සේවා හුවමාරු කර ගැනීම් ගණුදෙනු වශයෙන් සලකනු නොලැබේ. කෙසේ වෙතත් අසමාන අයිතමයන් හුවමාරු කර ගැනීම් අය භාර ජනිත කරන ගණුදෙනු වශයෙන් සලකනු ලැබේ. මුදල් හෝ මුදල් වලට සමාන දෑ වල ගලා ඒම විලම්භනය කලහොත් ලැබිය යුතු ප්‍රතිෂ්ඨාව ලැබීමට නියමිත මුදල් හෝ මුදල් වලට සමාන දෑ වල නාමික ප්‍රමාණයට වඩා අඩුවන අතර වට්ටම් දීම සුදුසු වනු ඇත. උදාහරණයක් වශයෙන් මෙය සිදුවිය හැක්කේ විකුණුම්කරු විසින් පොලී රහිත ණය පහසුකම් ගැණුම්කරුට විටක දී හෝ වෙළඳපොළට අඩු පොලී අනුපාතිකයක් අය කරන විටකදීය. වෙළඳපොල අනුපාතිකයන් අනුව පොලිය සැලකිල්ලට ගත යුතුය.

### LKAS 18 : **අයභාර ප්‍රමිතය අනුව පහත සඳහන් හෙළිදරව් කිරීම් අවශ්‍ය කෙරේ**

- අයභාර හඳුනාගැනීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති
- පහත සඳහන් එක් එක් අයභාර වර්ග වල ප්‍රමාණය
- භාණ්ඩ විකුණුම්
- සේවාවන් සැපයීම
- පොලිය
- හිමිකම්
- ලාභාංශ
- එම එක් එක් වර්ග තුළ භාණ්ඩ හෝ සේවා හුවමාරු කිරීම් වලින් ලැබුන අයභාර ප්‍රමාණය එක් එක් වර්ග වල අයභාර හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලීම සඳහා බණී 18 අයභාර ප්‍රමිතිය අනුව කටයුතු කිරීම වැදගත් වේ.

## LKAS 19 - සේවක ප්‍රතිලාභ

මෙම LKAS 18 ප්‍රමිතයේ අරමුණ වනුයේ සේවක ප්‍රතිලාභ හෙළිදරව් කිරීම සඳහා ගිණුම්කරණ ක්‍රමවේද නියම කිරීමයි ( සේවකයින් විසින් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් ව්‍යාපාරයක් විසින් දෙනු ලබන සියලුම ආකාරයේ වන්දි මුදල් ), මෙම ප්‍රමිතයේ සමස්ථ අවශ්‍ය විස්තර වල අවධාරණය කරනු ලබන මූලධර්මය වනුයේ සේවකයින්ට දෙනු ලබන ප්‍රතිලාභ වල පිරිවැය සේවකයා විසින් එම ප්‍රතිලාභ උපයන කාල පරිච්ඡේදයේම හඳුනාගත යුතු වන අතර එය ගෙවිය යුතු හෝ ගෙවූ කාල පරිච්ඡේදයේ නොවිය යුතු ය.

## LKAS 20 - රාජ්‍ය ප්‍රදාන සඳහා ගිණුම්කරණ සහ රාජ්‍ය අනුග්‍රහයන් හෙළිදරව් කිරීම

මෙම LKAS 20 ප්‍රමිතයේ අරමුණ වනුයේ රාජ්‍ය ප්‍රදාන සහ අනෙකුත් ආකාරයේ රාජ්‍ය අනුග්‍රහයන් හෙළිදරව් කිරීම සඳහා ගිණුම්කරණ නියම කිරීමයි. ජාතික පශු සම්පත් මණ්ඩලයේ රජයේ ප්‍රදානයන් කෘෂිකර්මය යටතේ ගිණුම්කොට ඇත.

## LKAS 27 - ඒකාබද්ධ සහ වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශනය

LKAS 27 ප්‍රමිතය පරිපාලිතයක සංකල්පය නිර්වචනය කරනු ලබන්නේ තවත් මව් ව්‍යාපාරයක් විසින් පාලනය කරනු ලබන සමාගමක් වශයෙනි. මව් ව්‍යාපාරයකට එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක පරිපාලිතයන් තිබෙන විට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම අවශ්‍ය වේ. LKAS 27 ප්‍රමිතයෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම පහත සඳහන් නිර්ණායකයන් ඉදිරිපත් කෙරේ

- සියලු පරිපාලිතයන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ වල ඇතුලත් කල යුතු වේ. පොදු නොවන සමහර අස්තීත්වයන් හට සීමා සහිත වූ ව්‍යතිරේකයක් ඇත.
- ඒකාබද්ධ පරිපාලිතයන් ගේ වාර්තාකරන දිනය හා මව් සමාගමෙහි වාර්තාකරන දිනය අතර වෙනස මාස තුනකට වඩා නොවැඩිය යුතු අතර මෙම කාලපරිච්ඡේදය තුල සිදු වූ වැදගත් හා සැලකිය යුතු ගණුදෙනු හෝ ගැලපීම් වාර්තාකොට තැබිය යුතුය.
- මව් සමාගමෙහි සහ පරිපාලිතයන් හි ඒකාකාර ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුගමනය කළ යුතුය.
- මව් සමාගමේ වෙන් වශයෙන් සකසන ලද මූල්‍ය ප්‍රකාශ වල LKAS 39 අනුව පරිපාලිතයන් පිරිවැය අගයෙන් හෝ සාධාරණ වටිනාකමේ අගයෙන් පෙන්විය හැකිය.
- පහත සඳහන් අයිතම අවශ්‍ය කරන හෙළිදරව් කිරීම් වලට ඇතුලත් වේ.
- එක් එක් සැලකිය යුතු පරිපාලිතයන් වල නම රට අයිතිය සහ ඡන්ද බල ප්‍රතිශතය
- පරිපාලිතයක් ඒකාබද්ධ නොකිරීමට හේතු
- ඒකාබද්ධ පරිපාලිතයක මව් සමාගමට සියයට පනහකට වඩා ඡන්ද බලයක් නැත්නම් සම්බන්ධතාවයේ ස්වභාවය
- ඒකාබද්ධ කිරීමෙන් බැහැර කල පරිපාලිතයක මව් සමාගමට සියයට පනහකට වඩා ඡන්ද බලයක් නැත්නම් සම්බන්ධතාවයේ ස්වභාවය
- මෙම කාලය තුළ පරිපාලිතයන් අත්පත් කිරීම් වල සහ විකිණීම් වල ප්‍රතිඵල

මව් සමාගමේ වෙන් වශයෙන් සකසන් ලද මූල්‍ය ප්‍රකාශ වල පරිපාලිතයන් සඳහා ගිණුම් තැබීම් ක්‍රමය විස්තර කළ යුතුය.

## LKAS 32 - මූල්‍ය සාධන පත්‍ර ඉදිරිපත් කිරීම

මෙම LKAS 32 ප්‍රමිතයේ අරමුණ වනුයේ ව්‍යවසායකයේ මූල්‍ය තත්ත්වය, කාර්යය සාධනය සහ මූල්‍ය ප්‍රවාහයට ශේෂ පත්‍රය මත සහ ශේෂ පත්‍රයෙන් බැහැර මූල්‍ය පත්‍ර වල වැදගත්කම පිළිබඳව පරිශීලනය කරන්නන් ගේ අවබෝධය තවදුරටත් වැඩි දියුණු කිරීමයි

## LKAS 33 : කොටසක ඉපැයුම්

කොටසක ඉපැයුම් වල මිනුම්කරණය හා හෙළිදරව් කිරීම් සම්බන්ධයෙන් මෙම **LKAS** 32 ප්‍රමිතය විස්තර





කරන අතර කිසිම නිශ්චිත ව්‍යවසාය සම්පත් සැලසුම් විසඳුම ක්‍රමයකින් මෙයට සහයක් නොලැබේ.

## LKAS 36 : වත්කම් හානිකරණය

මෙම **LKAS 36** ප්‍රමිතය මගින් ප්‍රධාන වශයෙන් අවධානය කෙරෙන්නේ කීර්ති නාමය, අස්පෘශ්‍ය වත්කම් සහ දේපළ පිරියත සහ උපකරණ  සම්බන්ධයෙන් වන ගිණුම්කරණය පිළිබඳවයි. හානිකරණයට පත් වත්කම් හඳුනාගැනීම්, එහි අය කරගත හැකි ප්‍රමාණය මැනීම, ඇතිවන ඇතිවන හානිකරණ අලාභයක් හඳුණාගැනීම් හෝ ආපස්සට හැරවීම සහ හානිකරණ අලාභයන් සම්බන්ධ තොරතුරු හෙළිදරව් කිරීම හෝ හානිකරණ අලාභයන් ආපස්සට හැරවීම පිළිබඳව ඇතුලත් කළ යුතු අවශ්‍යතා මෙම ප්‍රමිතය මගින් නියම කෙරේ.

මෙම **LKAS** 36 ප්‍රමිතය ව්‍යවසායක් විසින් සිය වත්කම් අධි වටිනාකමකින් සටහන් වී නැති බව තහවුරු කරගන්නේ කෙසේ ද, ව්‍යවසායක් විසින් වත්කමක අයකරගත හැකි මුදල තක්සේරු කරගන්නේ කෙසේ ද ( අයකර හැකි මුදල) සහ මෙම තක්සේරු කිරීම තුළින් හඳුනාගත් හානිකරණ අලාභයන් පිළිබඳව ව්‍යවසායක් විසින් ගිණුම්කරණය කරන්නේ කෙසේ ද යන්න විස්තර කරයි.

## LKAS 36 : ප්‍රමිතයෙහි අනෙකුත් ප්‍රධාන අවශ්‍යතා පහත සඳහන් පරිදිය.

- වත්කමක අයකරගත හැකි මුදල වුයේ එහි සාධාරණ වටිනාකමෙන් ඉහළ අගයෙන් විකිණීම 60 වෙනුවෙන් දරන ලද වියදම් සහ භාවිතයේ ඇති වටිනාකම (වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහයන් පදනම් කරගෙන) අඩු කිරීමෙන් පසුය.

- සාධාරණ වටිනාකම යනු කැමැත්ත ප්‍රකාශිත දැනුමැති පාර්ශයන් අතර අතේ දුරින් වූ ගණුදෙනුවක දී වත්කමක් විකිණීමෙන් ලද හැකි මුදල

- භාවිතයේ ඇති වටිනාකම යනු වත්කමක් එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ භාවිතයෙන් හා ඉන්පසු විකිණීමෙන් ලැබිය හැකි මුදල : භාවිතයේ ඇති වටිනාකම ගණනය කරනු ලබන්නේ තක්සේරු ඉදිරි මුදල් ප්‍රවාහයන් වල වාර්තමාන වටිනාකමෙනි. වට්ටම් අනුපාතිකය විය යුත්තේ වත්කමට නිශ්චිත වන අවදානම සහ කාලය සහ මුදලේ වටිනාකම සම්බන්ධයෙන් වෙළඳපොළෙහි වර්තමාන තක්සේරු පිළිබිඹු වන ආකාරයේ පෙර බදු අනුපාතිකයකිනි.

  හානිකරණය පිළිබඳව සටහන් තැබීම :

- පිරිවැය අගය මත දක්වන වත්කම් ආදායම් ප්‍රකාශයේ වියදමක් වශයෙන් හඳුනාගත යුතු අතර ප්‍රත්‍යාග ණන අගය මත දක්වන වත්කම් ප්‍රත්‍යාගණන අඩුවීමක් වශයෙන් සැලකිය යුතුය.

- අවසන් වරට හානිකරණ අලාභයන් හඳුනාගැනීමේ සිට වත්කමක අයකළ හැකි මුදල තීරණය කිරීමට භාවිතා කරනු ලබන තක්සේරුවල වෙනසක් වූ විට හානිකරණ අලාභයක් ආපස්සට හැරවිය යුතුය. (සහ හඳුනාගත් ආදායම්)කීර්ති නාමය මෙහි දී ව්‍යතිරේකයක් වන අතර කීර්ති නාම වල හානිකරණ අලාභයන් ආපස්සට හැරවීමට ඉඩදෙනු නොලැබේ.

- ආපස්සට හරවන හානිකරණ අලාභයන් ආදායම් ප්‍රකාශයේ අදායමක් වශයෙන් හඳුනාගත යුතු අතර ප්‍රත්‍යාගණිත අගය මත දක්වන වත්කම් ආදායම් ප්‍රකාශයේ ප්‍රත්‍යාගණන වැඩිවීමක් වශයෙන් සැලකිය යුතුය. හානිකර ආලාභයන් හඳුනාගන්නා විට දී හෝ ආපස්සට හරවන විට දී ව්‍යවසායක් විසින් තොරතුරු සමහරක් වත්කම් වර්ග අනුවත් වර්තා කල හැකි ඛණ්ඩ අනුවත් හෙළිදරව් කළ යුතුය. සමස්තයක් වශයෙන් හඳුනාගත් හෝ ආපස්සට හරවන ලද හානිකරණ අලාභයන් වාර්තාකරණ අස්තිත්වයක මූල්‍ය ප්‍රකාශ වලට සැලකිය යුතු සේ බලපායි නම් අතිරේක හෙළි දරව් කිරීම් කල යුතුය. යම් කිසි අවස්ථාවක වත්කමක් හානිකරණයට ගත් විමට ඉඩ ඇති බවට ඉඟියක් හෝ ඇති විටක වත්කමක අයකර ගත හැකි මුදල තක්සේරු කළ යුතුය. ශේෂ පත්‍ර දිනට හානිකර අලාභයන් ගැන සැලකිලිමත් විම සඳහා දර්ශක ලැයිස්තුවක් LKAS 36 ප්‍රමිතයෙහි ඇතුලත් ය.

## තනි වත්කම් හෝ මුදල් ජනිත කරන ඒකක

අනෙක් වත්කම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහ වලින් බොහෝ සෙයින් ස්වාධීනව වත්කමක් මුදල් ජනිත නොකරන විටක දී ව්‍යවසායක් විසින් වත් අයත් මුදල් ජනිත කරන ඒකකයේ අයකර ගත හැකි මුදල තීරණය කළ යුතු ය. අනෙක් වත්කම් වලින් හෝ වත්කම් කාණ්ඩයකින් ලැබෙන මුදල් ප්‍රවාහ වලින් බොහෝ සෙයින් ස්වාධීන ලෙස මුදල් ප්‍රවාහ ජනිත කරන කුඩාම හඳුනාගත හැකි වත්කම් කාණ්ඩයක් මුදල් ජනිත කරන ඒකකයක් වේ. මුදල් ප්‍රවාහ ජනිත කරන ඒකකයක හානිකරණ ආලාභයන් හඳුනා ගැනීමට සහ ආපස්සට හැරවීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන මූලධර්ම තනි වත්කමක් සම්බන්ධයෙන් වන මූලධර්මයෙන් මූලධර්මයට සමාන වේ. මුදල් ජනිත කරන ඒකක සංකල්පය බොහෝ විට භාවිතා කරනු ලබන්නේ හානිකරණය පිළිබඳව පරීක්ෂා කිරීමට වන අතර මෙයට හේතුව බොහෝ අවස්ථාවල වත්කම් ක්‍රියා කරනුයේ තනි පදනමට වඩා සාමුහික වීමය.

## LKAS 37 - ප්‍රතිපාදන අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාවය වත්කම්

LKAS 37 ප්‍රමිතය මූලික වශයෙන් ප්‍රතිපාදන සම්බන්ධයෙන් ක්‍රියා කරන අතර විශේෂ අවධානය යොමු කෙරෙනුයේ පසු ගිය සිද්ධීන්වල ප්‍රතිඵල නිසා වගකීම් වශයෙන් නිර්වචිත යුතුකම් හඳුනා ගැනීම්ය. මෙම ප්‍රතිපාදන උදාහරණ වශයෙන්, ආපසු ගෙවීමේ ප්‍රතිපාදන, වත්කම් විශ්‍රාම ගැන්වීමේ යුතුකම්, අසම්භාවය වගකීම් වැනි දේ ස්වයං ක්‍රියාව කළ නොහැක. එබැවින්,ගිනුම්කරණ පද්ධතියකට හැකි වනුයේ LKAS 37 සඳහා වක්‍ර ආකඅරයේ සහයක් ලබා දීමයි.

## LKAS 39 - මූල්‍ය සාධන පත්‍ර හඳුනා ගැනීම සහ මැනීම

LKAS 39 ප්‍රමිතය ලියාපදිංචි ලැයිස්තුගත සමාගම් සම්බන්ධයෙන් සැලකිය යුතු බලපෑමක් ඇති කරන අතර මෙම ප්‍රමිතය අනුව මෙකී සමාගම් විසින් සියලු මූල්‍ය සාධන පත්‍ර සාධාරණ වටිනාකමෙන් (වෙළඳ පොළ මිලෙන්) හඳුනා ගැනීම සහ මැනීම කළ යුතු බවට නියම කෙරේ. බොහෝ අවස්ථාවල විධිමත් භාණ්ඩාගාර කළමනාකරණ ක්‍රමයක් අවශ්‍ය කෙරේ. තවද මෙම ප්‍රමිතය අනුව සියලු ඉදිරි රැකුම් ලේඛනගත කොට තැබිය යුතු අතර එහි ඵලදායාතාව තක්සේරු කිරීම සඳහා නිතරම ඇගයීමට ලක් කළ යුතු ය. LKAS 39 ප්‍රමිතය යටතේ සියලුම ව්‍යුත්පන්න සාධන පත්‍ර ඇතුළුව සියලුම මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් ශේෂ පත්‍ර හඳුනා ගත යුතුය. ගෙවන ලද ප්‍රතිෂ්ඨාවේ මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් අත්පත් කර ගැනීමට ලැබුණ ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකම වන පිරිවැයෙන් ඒවා මුලින් මැනීම් කරනු ලැබේ. ව්‍යවසායක් විසින් වෙළඳපොළෙන් මිල දී ගනු ලබන ගැණුම් සහ මූල්‍ය වත්කම් විකුණුම් වෙළඳ දිනයේ දී ගනු ලබන ගැනුම් සහ මූල්‍ය වත්කම් විකුණුම් වෙළඳ දිනයේ දී හෝ පියවන ලද දිනයේ දී හඳුනා ගත යුතු ය. පියවන ලද දින හෝ සමථයකට පත් කළ දින ගිණුම්කරණ ක්‍රම භාවිතා කල හොත් වෙළඳ දින සහ පියවන දින අතර සමහර වටිනාකම් වල වෙනස්වීම් මිල දී ගැණුම් සඳහා හඳුනා ගනු ලැබේ. මූල්‍ය වත්කම් පහත සඳහන් පරිදි පන්ති ගත කරනු ලැබේ.

- ණය සහ ලැබිය යුතු දෑ
  මෙම ණය සහ ලැබිය යුතු දෑ ව්‍යවසායක් විසින් අරඹන ලද දෑ වන අතර මේවා වෙළඳ කටයුතු 62 සඳහා තබා ගනු ලබන වත්කම් නොවි. මෙසේ ව්‍යවසායක් විසින් අරඹන ලද ණය සහ ලැබිය යුතු දෑ ණය සහ ලැබිය යුතු දෑ පරිණත වන තෙක් රඳවා ගත් බවට ව්‍යවසායක් විසින් විදහා දැක්වීමට අවශ්‍යතාවක් නැත. මෙම වත්කම් සධාරණය කරනු ලබන්නේ ක්‍රමක්ෂය කළ අගය මත හෙවත් මුල් මුදල හා සඵල උචිත පොලී අනුපාතිකයක් සමගය.
- පරිණත වන තෙක් රඳවා තබා ගන්නා ආයෝජන ස්ථිර පරිණත ආයෝජන, උදාහරණයක් වශයෙන් ණය සුරැකුම් සහ ව්‍යවසායක් විසින් අදහස් කරන සහ පරිණත වන තෙක් රඳවා ගත හැකි අවශ්‍යයෙන්ම බේරා ගත යුතු වරණීය කොටස් වර්ගීකරණය රඳා පවතින්නේ කළමනාකාරීත්වයේ අදහස මත සහ හැකියාව මතය. මෙම මූල්‍ය වත්කම් ධාරණය කරනු ලබන්නේ ක්‍රමක්ෂය කළ අගය මතය.
- ලාභලාභ ගිණුම් තුළින් සාධාරණ වටිනාකම කෙටි කාලීන මිල උච්චාවචනය වලින් ලාභ ජනිත කිරීම සඳහා අත්පත් කරනු ලබන මූල්‍ය වත්කම් (වෙළඳ කටයුතු සඳහා ) ඉදිරි රැකුම් සාධන පත්‍ර වශයෙන් භාවිතා කරන්නේ නම් මිස ව්‍යුත්පන්න වත්කම් නිතරම වෙළඳ කටයුතු සඳහා රඳවා ගන්නා බව සැලකේ. මෙය තුළ උප වර්ගයක් ඇති අතර මෙම ශිල්ප ක්‍රමය ගිණුම්කරණය නොගැළපීමක් නිවැරදි කරන්නේ නම් හෝ ඓතිහාසික පිරිවැය වෙනුවට සමාගමක් විසින්.





- පවතින-දෙර-පාවිච්චි මූල්‍ය වත්කම්: සියලු මූල්‍ය වත්කම් නොව ඉහත සඳහන් කාණ්ඩ එක්.

## ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS/LKAS

සිය මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකම පදනම්කරගෙන කළමනාකරන්නේ නම් එමගින් සමාගම් වලට එහි මූල්‍ය සාධන පත්‍ර සාධාරණ වටිනාකමට සලකුණු කරන්නට මූලික වශයෙන් අවසර ලැබේ. මෙම සියලු මූල්‍ය වත්කම් ගිණුම්ගත කරනුයේ සාධාරන අගය මත වන අතර වෙනස්කම් ආදායම් වල හඳුනා ගැනේ.

විකුණුම සඳහා ඇති මූල්‍ය වත්තම් ඉහත දැක්වෙන ලැයිස්තු වල නැති සියලු මූල්‍ය වත්කම් මෙම ගණයට ඇතුලත්ය. ඇති වන වෙනස්කම් වෙන ස්කන්ධ සංරචකයක සටහන් කරමින් මෙම මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමෙහි අගයෙන් වාර්තා තබනු ලැබේ. LKAS 39 ප්‍රමිතය යටතේ යම් ව්‍යවසායක් අපේක්ෂාකළ නොහැකි තත්ත්වයක් තුළ පරිනත වෙන තෙක් රඳවා ගෙන ඇති ආයෝජන සුළු ප්‍රමාණයකින් හෝ විකුණයි නම් එහි අනෙක් සියලු පරිනත වෙන තෙක් රඳවා ගෙන ඇති ආයෝජන ඊළඟ සහ අනුගාමී වාර්තාකරණ වසර දෙක තුළ විකිණීම සඳහා ඇති වත්කම් වශයෙන් නැවත වර්ගීකරණය කළ යුතුයි. මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය සමහර අවස්ථා හැරෙන්ට ඉඩ දෙනු නොලැබේ. ප්‍රධාන නිර්වචනය : ඉදිරි රැකුම: ව්‍යුත්පන්නයක් හෝ ව්‍යුත්පන්නයක් නොවන මූල්‍ය සාධන පත්‍රයක් ශුද්ධ ලාභ හෝ අලාභයෙහි සම්පූර්ණයෙන් හෝ කොටස් වලින් හිලව් කිරීමක් වශයෙන් නම් කිරීමට (ශුද්ධ ආයෝජන ඉදිරි රැකුම් සඳහා පමණක්) ඉදිරි රැකුම් අයිතමයක සාධාරණ වටිනාකම හෝ මුදල් ප්‍රවාහ වටිනාකමෙහි වෙනස්වීම. LKAS 39 ප්‍රමිතය යටතේ ඉදිරි රැකුම් ගිණුම්කරණයට අවසර ලැබෙනුයේ යම් යම් අවස්ථාවල දී පමණක් වන අතර ඒ සඳහා ඉදිරි රැකුම් සම්බන්ධතාවය පැහැදිලිව නිර්වචනය කර තිබීම, මැනිය හැකි බව, ආරම්භයේ දී ඇති සඵලදායීත්වය සහ අඛණ්ඩතාවය යන තත්ත්වයන් පිහිටා තිබිය යුතුය. සමස්ත ශුද්ධ ශේෂ පත්‍ර තත්ත්වයක ඉදිරි රැකුමක් හෝ විශාල පරිමාණයේ ඉදිරි රැකුමක් වශයෙන් නොව සාධාරණ වටිනාකමකින් යුක්ත ඉදිරි රැකුමක් හෝ නිශ්චිත ඉදිරි රැකුම් අයිතමයක මුදල් ප්‍රවාහයක් නිශ්චිත ඉදිරි රැකුම් සාධන පත්‍රයක් වශයෙන් ව්‍යවසායක් නම් කරන විටදී පමණක් ඉදිරි රැකුම් ගිණුම්කරණ ක්‍රමය භාවිතා කිරීමට අවසර ලැබේ. කෙසේ වෙතත්, සමස්ත ශුද්ධ තත්ත්වයක යටත් ඉදිරි රැකුම් ගිණුම්කරණයේ ආසන්නතම ආදායම් ප්‍රකාශයේ ප්‍රතිඵල සමහර අවස්ථාවල දී ළඟාවිය හැක්කේ පාදක වන අයිතමයක කොටසක් ඉදිරි රැකුම් තත්ත්වයක් වශයෙන් නම් කිරීමෙනි. පුරෝකථනය කරන ලද ගනුදෙනු වල ඉදිරි රැකුම් සඳහා ඉදිරි රැකුම් සාදන පත්‍ර වල ලාභය හෝ අලාභය විසින් අත්පත් කරගත් වත්කම් හෝ වගකීම් වල පදනම (ධාරණ අගය) ගැලපේ.

## LKAS 40 ආයෝජනය දේපල

LKAS 40 ව්‍යවසායන් විසින් පවත්වන ආයෝජන දේපල ආවරණය කර ඇති අතර එහි ප්‍රධාන කටයුතු දේපල ආයෝජන සම්බන්ධ ව්‍යාපාර පමණක් සීමා වන්නේ නැත. ආයෝජන දේපල දේපල (ඉඩම් හෝ ගොඩනැගිල්ලක් - හෝ ගොඩනැගිල්ලක කොටසක් - හෝ දෙකම) ඇත කුලී උපයා හෝ ප්‍රග්ධන අගය හෝ දෙකම සඳහා පවත්වන (හිමිකරු විසින් හෝ මූල්‍ය බදු පදනම මත, බදුකරු විසින්). LKAS 40 යටතේ, ව්‍යවසාය හෝ තෝරා ගත යුතුයි:

- සාධාරණ අගය ආකෘතිය: ආයෝජන දේපල සාධාරණ වටිනාකම ගණනය කළ යුතුය හා සාධාරණ වටිනාකමක් වෙනස්කම් ආදායම් ප්‍රකාශයේ
- පිරිවැය ආකෘතිය (LKAS 16 මිණුම් දණ්ඩ ප්‍රතිකාර ලෙස එම පිළිගත යුතුය: දේපල, පිරියත හා උපකරණ): ආයෝජන දේපල) ක්ෂය වූ පිරිවැය (අඩු ඕනෑම සමුච්චිත ජබලහීනත පාඩු ගණනය කළ යුතුය. වියදම ආදර්ශ සචීසබඩ්ැඑපැබඑ දේපළ සාධාරණ වටිනාකමක් වියවසාය හෙළිකළ තෝරාගන්නේ ව්‍යවසාය එය එහි සියලු ආයෝජන දේපල තෝරාගන්නේ ආදර්ශ අයදුම් කළ යුතුය.

## LKAS 41 - කෘෂිකර්මය

LKAS 41 ප්‍රමිතය ජීව විද්‍යාත්මක වත්කම් සඳහා කෙසේ ගිණුම්කරණය විය යුතු ද යන්න විස්තර කරයි. ජීව විද්‍යාත්මක වත්කම් යනු පශු සම්පත්, වගාවන් යනාදිය වන අතර මෙම වත්කම් කෘෂිකර්ම නිෂ්පාදන බවට පරිවර්තනය කෙරේ.



# 2015 විගණකාධිපති වාර්තාව

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } එෆ්එල්එස්/සී/එන්එල්ඩීබී/ 1/15/10   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2017 ජුලි 28 දින

CHAIRMAN'S OFFICE RECEIVED 23 AUG 2017 NLDB

සභාපති

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

GM

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

පිටපත් - 1. ලේකම් - ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk





**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } එෆ්එල්එස්/සී/එන්එල්ඩීබී/ 1/15/10   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2017 ජුලි 28 දින

සභාපති

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මණ්ඩලයට පූර්ණ හිමිකාරිත්වය ඇති පරිපාලිත සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර පිළියෙල කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළයුතු නමුත්, මණ්ඩලය වෙනුවෙන් පමණක් පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.







විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

(i) ඡේද අංක 79 (ආ) අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.130,696,928 ක් වූ ප්‍රාග්ධන සංචිත, රු.44,529,422 ක් වූ අයභාර සංචිත හා රු.37,500,000 ක් වූ වක්‍රීය අරමුදල් ශේෂය පවත්වා ගෙන යාමට හේතු හා ඒවායේ ස්වභාවය පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

(ii) මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ගොවිපල 31 ක මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කර පිළියෙල කර තිබුණද එම ගොවිපල ගිණුම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව පිළියෙල කර නොතිබුණු අතර සංගත භාවයකින් හා පෙර වර්ෂයේ වටිනාකම් හා සැසඳිය හැකි වන ලෙස ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08

ඡේද අංක 42 අනුව ප්‍රමාණාත්මක පෙර කාලපරිච්ඡේද වැරදි වර්තමාන මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි වැරදි සිදු වූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල රේඛීය අයිතමයන් සඳහා නිවැරදි කළයුතු අගය, එම වරද සඳහා ප්‍රායෝගිකව ඉදිරිපත් කළ හැකි කාලපරිච්ඡේදයේ ආරම්භයට නිවැරදි කිරීමේ ප්‍රමාණය හෙළිදරව් කර නොතිබුණි. තවද ප්‍රමිත අංක 1 හි ඡේද අංක 40 (ආ) අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රවර්ථන, පෙර හා ආසන්නම සංසන්දනාත්මක කාලපරිච්ඡේදය වශයෙන් තීරු තුනක් ලෙසද ඉදිරිපත් කර නොතිබුණි.

AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10

---------------------------------

2015 ජුනි 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා 2016 පෙබරවාරි 10 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මණ්ඩලයේ සිරිංගපාත ගොවිපල භූමියෙන් මිල්කෝ ආයතනය වෙත නිදහස් කර ඇති අක්කර 35 ක භූමිය සම්බන්ධයෙන් ප්‍රමිතයේ ඡේද අංක 22 අනුව මූල්‍ය ප්‍රකාශන මගින් අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12

------------------------------------

ඡේද අංක 15 හා 24 අනුව මණ්ඩලය විසින් විලම්භිත ආදායම් බදු වත්කම් හෝ වගකීම් පවතිනවා ද යන්න හඳුනාගෙන ගැලපීමට කටයුතු කර නොතිබුණි. උදාහරණ ලෙස විලම්භිත බදු වගකීම යටතේ ගොඩනැගිලි රු.278,745 ක් හා යන්ත්‍ර උපකරණ රු.මිලියන 141ක් විය.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

----------------------------------

(i) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. මිලියන 163.5 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 11,502 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද ප්‍රමිතයේ 79 ඡේදය ප්‍රකාරව අක්‍රීයව පවතින ප්‍රයෝජනයට නොගන්නා වත්කම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ii) ඡේද අංක 73 (ඉ) (ii) අනුව සමාලෝචිත වර්ෂය අවසානයට විකුණා දැමීමට හෝ ඉවත් කිරීමට තීරණය කළ තක්සේරු අගය රු. 2,228,050 ක් වූ වත්කම් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.







AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(iii) ඡේද අංක 36 අනුව යම් වත්කම් කාණ්ඩයක් ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම් කාණ්ඩයට අයත් සියළු වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, මණ්ඩලය විසින් 2014 වර්ෂයේදී වාහන කාණ්ඩය ප්‍රත්‍යාගණනය කිරීමේදී පිරිවැය රු.60,960,579 ක් වූ වාහන 226 ක් අත්හැර ප්‍රත්‍යාගණනය කර තිබූ අතර ඒ මගින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම් විගණනයේදී අනාවරණය කරගත නොහැකි විය.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24

-----------------------------------

(i) අමාත්‍ය මණ්ඩල තීරණයක් පරිදි මහවැලි සත්ව ව්‍යාපාරික සමාගමේ සියලුම සම්පත්, වත්කම්, කොටස් හා කළමනාකාරීත්වය මණ්ඩලය වෙත පැවරීමට තීරණය කර තිබූ අතර එම සමාගමේ සභාපතිවරයා මණ්ඩලයේ සභාපතිවරයාම වුවද ප්‍රමිත 24 හි 19 ඡේදය ප්‍රකාරව ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව්කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ ප්‍රධාන කළමනාකරණ මණ්ඩලය වෙත ගෙවා තිබූ රු.1,141,876 ක් වූ සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල දීමනා හා නිර්වචිත දායකත්ව සැලසුම් වලට ඇති දායකත්වය පිළිබඳ තොරතුරු ප්‍රමිතයේ 17 වන ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශන මගින් වෙනම හෙළිදරව් කර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37

----------------------------------

ප්‍රමිතයේ 86 වන ඡේදය අනුව මණ්ඩලයට එරෙහිව ඇති නඩු අටක් සම්බන්ධයෙන් පවතින අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 40

---------------------------------

මණ්ඩලය සතු ඉඩම් හා ගොඩනැගිලි බාහිර ආයතනවලට දිගුකාලීන බදු දීම තුළින් සමාලෝචිත වර්ෂය තුළ රු.1,312,121 ක ආදායමක් උපයා තිබුණද, එම ආයෝජන දේපල ප්‍රමිතයේ 16 වන ඡේදය අනුව නිවැරදිව තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන තුළ වෙනම ආයෝජන වත්කමක් ලෙස පෙන්වා නොතිබුණි.

AGDSL විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41

ඡේද අංක 12 අනුව වෙලාඩ් ව්‍යාපෘතියේ II වන අදියර යටතේ රු.1,079,162,786 කට ආනයනය කරන ලද සතුන් ජීව විද්‍යාත්මක වත්කම් යටතේ ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගයට ගිණුම්වලට ගැලපීමට සමාලෝචිත වර්ෂය අවසානයේදී කටයුතු කර නොතිබුණි.

(ඒ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) 13

මූල්‍ය ප්‍රකාශනවලට අනුව ජීව විද්‍යාත්මක වත්කම් යටතේ පවතින මණ්ඩලයේ වාණිජ වගාවන් වූ රු.18,125,757 ක රබර්, රු.1,344,057 ක කජු හා රු. 1,099,325 ක වෙනත් වගාවන් අගය කර ඇති පදනම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) 13 හි 91 ඡේදය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක් සඳහා මණ්ඩලය වෙත මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වත්කම් සඳහා ලබාදුන් රු.142,650,321 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන, අයභාර ප්‍රදාන වශයෙන් ගිණුම් ගත කර තිබුණි.

(ආ) දෝෂසහගත ගණනය කිරීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය හා ක්ෂය වෙන්කිරීම් රු.2,882,830 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2012 වර්ෂයේ සිට පැවත එන රු.10,239,289 ක් වූ කිරි ව්‍යාපෘතියේ අවසන් තොග ඌනතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 760 ප්‍රකාර කටයුතු කර මූල්‍ය ප්‍රකාශනයන්හි අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදීද ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. මෙම තොග ඌනතාවය ගිණුම්කරණ පද්ධතියේ දෝෂයක් බව සභාපති විසින් පිළිතුරු ලෙස දක්වා තිබුණි.

(ඈ) ආනයනය කරන ලද ගවයින් අතුරින් සමාලෝචිත වර්ෂය තුළ මිය ගොස් තිබූ ගවයන් 43 ට අදාළ පිරිවැය වූ රු.18,661,613 ක් වර්ෂයේ ලාභයට ලියා හරිනු වෙනුවට රු.1,891,167ක්







AGDSL විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

පමණක් ලියා හැරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.16,770,446 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) පශු සම්පත් තොග ශේෂයේ ඇතුළත් ගොවිපළ 07 ක සත්ව කාණ්ඩ 06 කට අදාළ තොග වටිනාකම් ඊට අදාළ භෞතික සමීක්ෂණ වාර්තා අනුව අගය කරන ලද වටිනාකමට වඩා රු.30,902,013 ක් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් ශුද්ධ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන කාර්යාලයේ අලෙවි සැලේ රු.766,879 ක් වටිනා භාණ්ඩ අයිතම 663ක තොග ඌනතාවය සම්බන්ධයෙන් අවශ්‍ය ගැළපීම් කිරීමකින් තොරව වෙළඳ හා අනෙකුත් තොග යටතේ දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) පොත් අගය රු.148,172 ක් වූ වාහනයක් සමාලෝචිත වර්ෂය තුළ රු.378,000 කට අලෙවි කර තිබූ අතර එහි පිරිවැය රු.214,190 ක් අඩුවෙන් බැහැර කිරීමේ ගිණුමට මාරු කර තිබීම හේතුවෙන් වත්කම් හා බැහැර කිරීමේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් අවසන් තොග ඊට අදාළ භෞතික සත්‍යාපන ශේෂයට වඩා රු.1,711,840 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර ජීව විද්‍යාත්මක වත්කම් යටතේ දැක්විය යුතු රු.1,406,500 ක් වූ ඌරන්ගේ වටිනාකම වෙළෙඳ හා අනෙකුත් තොග යටතේ දක්වා තිබුණි.

(එ) එකතුව රු. 533,251 ක් වූ ගොවිපල වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදම් යටතේ ගිණුම්ගත කරනු වෙනුවට වෙළඳ හා වෙනත් ලැබිය යුතු ණයගැති ශේෂ යටතේ දක්වා තිබුණි.

(ඒ) පෙර වර්ෂවල සිට සමාලෝචිත වර්ෂය දක්වා කෘෂිකාර්මික වගාවන් නිසි පරිදි ඇගයීම් කර වෙළඳ තොග ලෙස හඳුනාගෙන නොමැති ගොවිපොල 04 ක පැවති තේක්ක ගස් විකිණීමෙන් ලද සම්පූර්ණ ආදායම රු 8,105,520 ක් සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි ආදායම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ඔ) අන්තර් ව්‍යාපෘති අතර ගනුදෙනු, පාලන ගිණුම් මගින් සිදු කිරීම වෙනුවට ණයගැති ගිණුම් හරහා සිදු කිරීම හේතුවෙන් ණයගැති වටිනාකම රු. 942,862 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු කඩකුලී ආදායම රු.44,862 ක් ගිණුම් වලින් අන්හැරී තිබුණි.

(ක) බඩ ඉරිගු ව්‍යාපෘතියේ වූ රු.3,517,579 ක් වටිනා විදුලි වැට 2011 වර්ෂයේදී මැණික් පාලම ගොවිපලේ සවිකර තිබුණද එය ගොවිපල ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණු එම වටිනාකම තවදුරටත් ක්ෂය කිරීමකින් තොරව බඩ ඉරිගු ව්‍යාපෘතිය යටතේ ගිණුම්ගතව පැවතුණි.

(ග) ගොවිපල සේවකයින් හා වාහන වෙනුවෙන් ප්‍රධාන කාර්යාලය වෙත මාස 6 කට පෙර ලැබී තිබූ රු.187,484 ක රක්ෂණ වන්දි මාර්ගස්ථ මුදල් ලෙස අවසන් ගිණුමේ දක්වා තිබුණි.

(ච) ප්‍රධාන කාර්යාලය, ගොවිපල 31ක් හා ව්‍යාපෘති 4ක් වෙනුවෙන් ඒකාබද්ධ ශේෂ පිරික්සුමක් පිළියෙල කර නොතිබුණි.

(ජ) මහබෙරියතැන්න ගොවිපල ගිණුමේ රු.280,000 ක් වටිනා ඌරුගාල සැකසීමේ වියදම ස්ථාවර වත්කම් ලෙස සටහන් කිරීම වෙනුවට ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ට) ආඩිගම ගොවිපොල සඳහා සහෝදර ගොවිපොල මගින් ලබාගත් කොප්පරා අවසන් තොගයෙහි වටිනාකම වූ රු.444,654 ක් තොග ගිණුමේ සටහන් කිරීම වෙනුවට උපචිත වියදම් ගිණුම හර කර තිබුණි.

(ඩ) රොසීටා ගොවිපල අවසන් ගිණුම්වල ජීව විද්‍යාත්මක වත්කම් වෙළඳ හා ජංගම නොවන තොග ලෙස නිවැරදිව වර්ගීකරණය කර නොතිබීම හා උපලබ්ධි නොවූ ලාභය නිවැරදිව ගණනය නොකිරීම හේතුවෙන් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනයේ ජංගම නොවන තොග රු.66,641ක් වැඩියෙන්ද උපලබ්ධි නොවූ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද සටහන් කර තිබුණි.

**2.2.4 නොසැසඳු පාලන ගිණුම්**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජංගම ගිණුම්

---------------

ප්‍රධාන කාර්යාලයේ පොත්වල එක් එක් ගොවිපලවල් වෙනුවෙන් පැවති අන්තර් ජංගම ගිණුම්වල ශුද්ධ අගය හා ගොවිපල පොත්වල පැවති අන්තර් ජංගම ගිණුම්වල ශුද්ධ අගයන් ශුන්‍ය විය යුතු නමුත්, ප්‍රධාන කාර්යාලයේ පැවති අන්තර් ජංගම ගිණුම්වල එකතුව රු.157,950,654 ක ශුද්ධ හර ශේෂයක්ද, ගොවිපල ගිණුම්වල අන්තර් ජංගම ගිණුම්වල එකතුව රු.157,349,362 ක ශුද්ධ බැර ශේෂයක්ද දක්වා







තිබුණු අතර එම ශේෂයන් පරීක්ෂා කොට ශුන්‍ය කිරීම සඳහා අවශ්‍ය ගැලපීම් නොකිරීම නිසා රු.601,292 ක නොසැසඳුණු ශේෂයක් විය.

(ආ) මුදල් හුවමාරු ගිණුම්

-------------------------

ප්‍රධාන කාර්යාලය හා එක් එක් ව්‍යාපෘති අතර පවත්වා ගෙන යන මුදල් හුවමාරු ගිණුම් සසඳා අවශ්‍ය ගැලපීම් සිදු නොකල බව පහත නිරීක්ෂණ මගින් වැඩිදුරටත් තහවුරු විය.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට ෆ්‍රැන්චයිස් ව්‍යාපෘති ලෙජරය තුළ ඩිලයිට් හා කිරි ව්‍යාපෘති සමඟ මුදල් හුවමාරු ගිණුම්වල පිළිවෙළින් රු. 1,621,530 ක හා රු. 1,352,800 ක හර ශේෂ වූ අතර, ඊට අනුරූපීව එම ව්‍යාපෘති ලෙජර තුළ මුදල් හුවමාරු ගිණුම් වල ශුන්‍ය අගයක් පැවතීම.

(ii) ප්‍රධාන කාර්යාලයේ පොත්වල ව්‍යාපෘති 4 ක එකතුව රු. 38,311,318 ක බැර ශේෂයන්ද, ඊට අදාල එම ව්‍යාපෘතීන්හි මුදල් හුවමාරු ගිණුම්වල රු.20,614,967 ක හර ශේෂයක්ද ලෙස රු.29,285,411 ක නොසැසඳුණු ශේෂයක් පැවතීම.

(ඇ) පාලන ගිණුම

--------------

ප්‍රධාන කාර්යාලය හා එක් එක් ව්‍යාපෘති අතර මුදල් නොවන ගනුදෙනු සම්බන්ධයෙන් පවත්වාගෙන යන පාලන ගිණුම් පරීක්ෂා කිරීමේදී පාලන ගිණුම් 05 ක රු. 42,220,302 ක හර ශේෂයක්ද, පාලන ගිණුම් 05 ක රු.24,429,596 ක බැර ශේෂයක්ද, ව්‍යාපෘති පාලන ගිණුම් 02ක හර ශේෂ එකතුව රු.11,775,341 ක්ද, පාලන ගිණුම් 05 ක බැර ශේෂ එකතුව රු. 14,749,542 ක් ද ලෙස පැවතුණු අතර ගිණුම් සසඳා අවශ්‍ය ගැලපීම් සිදු කර නොතිබුණි.

(ඈ) මුදල් තැන්පත් ගිණුම් හා මුදල් ප්‍රේෂණ ගිණුම්

------------------------------------------------

ප්‍රධාන කාර්යාලය මගින් ගොවිපලවල් වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන මුදල් තැන්පත් ගිණුම් 31 කට අදාල වූ එකතුව රු.29,788,851 ක බැර ශේෂය හා මුදල් ප්‍රේෂණ ගිණුම් 34 කට අදාල ශුද්ධ එකතුව වන රු.29,348,667 ක හර ශේෂය අතර වෙනස රු.440,185 ක බැර ශේෂයක් වූ අතර එය සමාලෝචිත වර්ෂයේ අවසානයට

මූල්‍ය ප්‍රකාශනයන්හි මාර්ගස්ථ මුදල් ලෙස දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රධාන කාර්යාලය මගින් ගොවිපලවල් සඳහා මුදල් ලබාදීමේදී ප්‍රධාන කාර්යාලයේ පොත්වල මුදල් තැන්පත් ගිණුම් වර්ෂ අවසානයේ ශූන්‍ය විය යුතු අතර, මාර්ගස්ථ මුදල් පවතී නම් එම ගිණුමෙහි හර ශේෂයක් පැවතිය හැකිය. එහෙත් මුදල් තැන්පත් ගිණුම් 13 කට අදාලව එකතුව රු. 13,988,777 ක් වූ හර ශේෂ හා ගිණුම් 19 කට අදාලව එකතුව රු. 46,581,126 ක බැර ශේෂයක් වූ අතර ශුද්ධ ශේෂය ලෙස රු 32,592,349 ක බැර ශේෂයක් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ii) ගොවිපල විසින් ප්‍රධාන කාර්යාලයට මුදල් ප්‍රේෂණය කිරීමේදී වර්ෂ අවසානයේ මාර්ගස්ථ මුදල් නොමැති නම් ශුද්ධ මුදල් ප්‍රේෂණ ගිණුම ශූන්‍ය විය යුතු වුවත් ප්‍රධාන කාර්යාලයේ පොත්වල ගොවිපල නමින් වූ මුදල් ප්‍රේෂණ ගිණුම් 12 ක එකතුව රු. 10,380,523 ක් වූ බැර ශේෂයක් හා ගිණුම් 19 ක එකතුව රු.36,088,244 ක් වූ හර ශේෂයක් ලෙස ශුද්ධ ශේෂය රු. 25,707,721 ක හර ශේෂයක් මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙතත් ගොවිපල පොත්වල ශූන්‍ය ශේෂයක් පැවතුණි.

(iii) ප්‍රධාන කාර්යාලයේ ගොවිපල ප්‍රේෂණ ගිණුම් වල සටහන් විය යුතු රු. 2,799,599 ක බැර ශේෂයක් වෙනත් ප්‍රේෂණ නම් වූ පොදු ගිණුමකට බැර කර තිබූ නිසා සැසඳීමෙන් තොරව මාර්ගස්ථ මුදල් යටතේ දක්වා තිබුණි.

### 2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනය වෙත ලබා දී තිබුණු ඉඩම් උපලේඛනය හා ස්ථාවර වත්කම් ලේඛනය අනුව ඉඩම් හෙක්ටයාර් 125.32 ක පැහැදිලි නොකරන ලද වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව අනෙකුත් ආදායම් ශේෂය සඳහා ඉදිරිපත් කල උපලේඛනය යටතේ දක්වා ඇති ලොරි ධාවන ආදායම ගොවිපල 08 කට අදාලව රු.5,334,336 ක් වූ







නමුත් එක් එක් ගොවිපල වෙනුවෙන් ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව එම ආදායම රු. 7,819,417 ක් විය.

(ඇ) විගණනයට ඉදිරිපත් කරන ලද ප්‍රධාන කාර්යාලයේ එකතු කල අගය මත බදු පාලන ලෙජර් ගිණුමේ ගෙවිය යුතු ශේෂය රු. 5,364,163 ක් වුවද, ඉදිරිපත් කරන ලද එකතු කල අගය මත බදු උපලේඛනයට අනුව එම ශේෂය රු.6,111,549 ක් වූයෙන් රු.747,386 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම්

----------------------------------

පහත සඳහන් ගිණුම් අයිතම් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | ගිණුම් අයිතමය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ඉඩම් - හෙක්ටයාර් 10,241.84 | 225,189,438 | අයිතිය සනාථ කිරීම සඳහා බදු ඔප්පු |
| (ආ) | ජීව විද්‍යාත්මක වත්කම් - වගාවන් | | |
| | (i)පොල් යටි /නව වගාව | 541,550,090 | සමස්ත ශේෂය සඳහා එක් එක් ගොවිපල වෙනුවෙන් උපලේඛන. |
| | (ii) කජු වගාව | 1,335,382 | |
| | (iv) රබර් වගාව | 14,396,652 | |
| (ඇ) | ජංගම නොවන වත්කම් - වර්ෂයේ එකතු කිරීම් | | |
| | (i ) ගොඩනැගිලි | 1,483,072 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ බව තහවුරු කර ගැනීමට අදාල ලිපිගොනු හා වියදම සත්‍යාක්ෂණය කිරීමට අදාල සාක්ෂි |
| | (ii ) යන්ත්‍ර උපකරණ | 2,462,967 | |
| | (iii ) වතු උපකරණ | 559,149 | |
| | (iv ) කාර්යාලීය උපකරණ | 1,659,310 | |
| | (v ) ලී බඩු උපකරණ හා සවිකිරීම් | 378,742 | |
| | (vi ) ව්‍යුහයන් | 8,622,341 | |
| | (vii ) වාහන | 1,686,900 | |

| | | | |
|---|---|---|---|
| (ඈ) | කෙරීගෙන යන වැඩ | 12,005,290 | |
| (ඉ) | ණයගැතියෝ | | |
| | (i) මහවැලි පශු සම්පත් සංවර්ධන සමාගම | 4,981,912 | ලැබිය යුතු ලෙස සනාථ කිරීමට අදාල ලිඛිත සාක්ෂි හා ශේෂ සනාථ කිරීම්. |
| | (ii) රේඛීය අමාත්‍යාංශය | 10,439,949 | |
| | (iii) කන්තලේ ලංකා බැංකු ශාඛාවෙන් අයවියයුතු - 2009 වර්ෂයේ සිට පැවත එන ශේෂය | 2,092,150 | |
| | (iv) කිරි ව්‍යාපෘති නියෝජිතයන් ගෙන් ලැබිය යුතු ශේෂය | 1,141,642 | විස්තරාත්මක උපලේඛන හා ශේෂ සනාථ කිරීම්. |
| | (iv) ෆාර්ම් ෂොප් (පැරණි) යටතේ වන ලැබිය යුතු ශේෂය | 2,770,757 | |
| | (v) වෙළඳ හා අනෙකුත් ණයගැතියන් | | |
| | ගොවිපල 8 | 4,608,399 | |
| | ව්‍යාපෘති 2 | 132,445 | |
| (ඊ) | පොල් තැරැව්කරුවන්ගේ ණයගැති ශේෂ | 18,708,299 | ශේෂ තහවුරු කිරීමේ ලිපි |
| (උ) | 2007 වර්ෂයේදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවා තිබු මූලික ගාස්තු | 366,017 | අදාල ඉඩම් පවරාගත් බවට සාක්ෂි |
| (ඌ) | මණ්ඩලයට ලද රක්ෂණ වන්දි | 2,803,498 | විස්තරාත්මක උපලේඛන |
| | | --------------- | |
| | | 853,374,401 | |
| | | ======== | |

(එ) කිරි ව්‍යාපෘතියට අදාල ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 750 ප්‍රකාරව ඉන්වෙන්ට්‍රියක් පවත්වා ගනු නොලබන අතර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීමද හේතුවෙන් වසා දමන ලද අලෙවිසැල් 109 ක පැවති ස්ථාවර වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කිරීමට කිසිදු තොරතුරක් නොමැති විය.









## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රධාන කාර්යාලය, ගොවිපල 31 ක් හා ව්‍යාපෘති 2 ක් යටතේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.312,348,946 ක් වූ වෙළඳ හා අනෙකුත් ණයහිමි ශේෂ තුළ අවුරුදු 1 ට වැඩි ණයහිමියෝ රු. 139,737,712 ක් වූ අතර ඉන් රු. 117,995,249 ක් අවුරුදු 5 ඉක්මවූ ණයහිමියන් විය. එය මුළු ණය හිමියන්ගෙන් සියයට 45 ක් වී තිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාලය, ගොවිපල 31 ක්, ප්‍රාදේශීය කාර්යාලය හා ව්‍යාපෘති 5 ක් යටතේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.182,645,183 ක් වූ වෙළඳ හා අනෙකුත් ණයගැති ශේෂ තුළ අවුරුදු 1 ට වැඩි ණයගැති ශේෂය රු.91,993,920 ක් වූ අතර, එයින් රු.29,028,265 ක් අවුරුදු 5 ඉක්මවූ ණයගැතියන් විය. එය මුළු ණය ගැතියන්ගෙන් සියයට 16 ක් විය.

(ඇ) මහවැලි පශු සම්පත් සමාගමෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට අය විය යුතු ණය ශේෂය රු.8,489,772 ක් ලෙස දක්වා තිබුණද අදාළ සමාගම විසින් එම ණය මුදල රු.1,720,418 ක් පමණක් වන බවට තහවුරු කර තිබුණි.

(ඈ) අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත් බව දක්වා, කිසිදු සේවා සැපයීමක් හෝ භාණ්ඩ සැපයීමක් නොලැබ හා අදාල ගිවිසුමකට හෝ ඇතුලත් නොවී 2011 නොවැම්බර් 02 දින රු.2,957,521 ක් රාජ්‍ය ආයතනයක් නොවන වැවිලි නිවාස භාර අරමුදල සඳහා ණය මුදලක් ලෙස ලබාදී තිබූ අතර, එම මුදල 2017 ජනවාරි 24 දින දක්වාම නැවත අයකර නොගෙන සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය තුල වෙළඳ සහ අනෙකුත් ණයගැතියන් යටතේ දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන කාර්යාලය හා ගොවිපල ගිණුම් තුළ ගෙවිය යුතු හා ලැබිය යුතු එකතු කිරීමේ අගය මත බදු ලෙස පිළිවෙලින් රු. 8,208,076 ක් හා රු. 8,918,808 ක් දක්වා තිබුණද ඒවා නිරවුල් කිරීමට හෝ අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඊ) මණ්ඩලය විසින් 2003 වර්ෂයේදී ගොවීන්ගේ භාරකාර අරමුදලින් ලබාගෙන තිබූ රු.102,662,750 ක් වූ ණය මුදල වර්ෂ 11 ක් තිස්සේ නිරවුල් කිරීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට මුළු පොලිය රු.87,757,178 ක් සමග ගෙවිය යුතු සම්පූර්ණ මුදල රු.181,369,878 ක් වී තිබුණි.

(උ) සත්ව ආහාර සැපයීම වෙනුවෙන් පෞද්ගලික සමාගමක් වෙත ගෙවිය යුතු වසර 12 කට වඩා පැරණි රු. 26,746,567 ක හා වසර 5 කට වඩා පැරණි රු. 279,450 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිරවුල් කර නොතිබුණි.

(ඌ) කාර්ය මණ්ඩල ණයහිමි ශේෂ තුළ ඇතුලත් ගොවිපල 9 කට අදාල කළමනාකරුවන් හට ගෙවිය යුතු වසරකට වඩා පැරණි කොමිස් මුදල් රු. 386,101 ක් හා ගොවිපල 17 කට අදාළ වසර 2කට වඩා පැරණි වැටුප් රු.247,304 ක් ද නිරවුල් කිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(එ) වෙළඳ හා අනෙකුත් ණයගැතියන් තුළ ඇතුළත් මැරුණු ආනයනික ගවයින් 69 දෙනෙකු සඳහා 2014 මැයි 13 දින සිට ලැබිය යුතු රක්ෂණ වන්දි රු. 19,253,926 ක් 2016 නොවැම්බර් මස 07 වැනිදා දක්වාම අයකර ගෙන නොතිබුණි.

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

ඩයගම ගොවිපලට වසර 02 කට අධික කාලයක සිට කිරි ව්‍යාපෘතියෙන් අයවිය යුතු එකතුව රු.900,451 ක ණය ශේෂයක් හා 2015 වර්ෂය තුලදී කාගිල්ස් ආයතනයට කිරි විකිණීම නිසා අයවිය යුතු රු.1,030,080 ක් 2015 ඔක්තොබර් 09 දිනැති අංක පීඑෆ්ඩී/ආර්ඊඩී/2015/08 පොදු (1) දරන මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛයට පටහැනිව වර්ෂයේ කිරි ආදායම් ගිණුමෙන් කපා හැර තිබුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ (අ) වගන්තිය | (i) | චක්‍රලේඛයට පටහැනිව රු.25,000 සීමාව ඉක්මවා සමාලෝචිත වර්ෂයේ රු.100,000 ක් ලෙස සුළු මුදල් අග්‍රිම ලබාදී තිබුණි. |







| | | |
|---|---|---|
| | (ii) | චක්‍රලේඛය පරිදි අදාල කාර්යය අවසන් කර දින 10 ක් ඇතුලත අතුරු අග්‍රිම පියවිය යුතු වුවත්, අවස්ථා 40 කදී එකතුව රු. 797,901 ක් වූ අග්‍රිම සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන යහපාලනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.6 ඡේදය | | එක් එක් කාර්තුව අවසන් වී දින 30 ක් ඉක්මයාමට පෙර කාර්තුමය කාර්යසාධන වාර්තා රේඛීය අමාත්‍යාංශයට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.37,736,808 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.60,257,972 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.22,521,164 කින් පිරිහී තිබුණි. දල ලාභය රු.38,451,365 කින් වැඩි වී තිබුණද පරිපාලන වියදම හා මූල්‍ය වියදම් පිළිවෙලින් රු.12,631,008 ක් හා රු.32,982,824 කින් වැඩිවීම හා වෙනත් ආදායම් රු. 10,750,334 කින් අඩු වීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. තවද ප්‍රාග්ධන ප්‍රදාන රු.21,860,805 ක් අයහාර ප්‍රදාන ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය එම ප්‍රමාණයෙන් අධිගණනය කර තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩව ලාභයක් ලබා තිබුණි. එසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා ආදායම් බදු නැවත ගැලපීමේදී 2011 වර්ෂයේදී රු.307,380,090 ක් වූ මණ්ඩලයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.229,911,575 ක් දක්වා අඩුවී තිබුණි.

### 3.2 මණ්ඩලයට එරෙහිව හෝ මණ්ඩලය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විකුණුම් ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් පැහැරහැරීම සම්බන්ධයෙන් රු.2,093,175 ක වන්දි ඉල්ලා හා මරදවිල ඉඩමක අයිතිය ලබාගැනීම සඳහා බාහිර පාර්ශව 2 කට එරෙහිව මණ්ඩලය විසින් නඩු දෙකක් පවරා තිබුණි. තවද බාහිර පාර්ශව විසින් අනවසරයෙන් වගා කරන ඉඩම් හා ගල්කොරි දෙකක් නැවත ලබා ගැනීමට එරෙහිව ගොනු කල නඩු 4 ක් ද මණ්ඩලයේ සේවකයින් 05 දෙනෙකු විසින් සේවය අත්හිටුවීමට විරුද්ධව මණ්ඩලයට එරෙහිව ගොනු කල නඩු 04 ක් ද සමාලෝචිත වර්ෂය අවසානයට විභාග වෙමින් පැවතුණි.

(ආ) පෞද්ගලික ආයතනයක් වෙත විකිණීම සඳහා ලබාදී තිබුණු බඩ ඉරිඟු සඳහා මණ්ඩලයට මුදල් නොගෙවීම නිසා අයවියයුතු රු.11,947,220 ක් අයකර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව විසින් පිස්කල් ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර තිබූ නමුත් 2016 ජුනි 30 දින වන විටද එම මුදල් අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තිය හා 1975 පෙබරවාරි 14 දිනැති අංක 151 දරන ගැසට් පත්‍රයට අනුව මණ්ඩලය විසින් ඉටු කළ යුතු කාර්යයන් පහත දැක්වේ.

- සාධාරණ මිලට මස් පිණිස සතුන් මිලට ගැනීම සඳහා මධ්‍යස්ථාන පිහිටුවීම.
- සතුන්ගේ කුණප සැපයීම පිණිස, ප්‍රාදේශීය ඝාතනාගාර පිහිටුවීම, ඒ දක්වා ප්‍රවාහනය කිරීම සහ හඳුනා ගැනීම පිණිස මුද්‍රා තබන ලද කුණප ඝාතනාගාරවල සිට බලයලත් වෙළඳුන් වෙත ප්‍රවාහනය කිරීම.
- මස් සහ මාංශ නිෂ්පාදනය සකස් කිරීම සහ අලෙවි කිරීම, අලෙවි කිරීමේ බලපත්‍ර නිකුත් කිරීම සහ ඒ කාර්යයන් විධිමත් කිරීම හා අතුරු නිෂ්පාදනයන්ගෙන් උපරිම ප්‍රයෝජනය ගැනීමට වග බලා ගැනීම.









- වෙළඳාම සඳහා බලයලත් වෙළඳුන්ට බෙදා හැරීම පිණිස වෙළඳාමට සුදුසු පරිදි කැබලි කළ ඉස්තරම් මස්, පැකට්වල ඇහිරීමෙන් සහ මිළ ගණන් ලකුණු කිරීමෙන් පිළියෙල කිරීම.
- සතුන් ඇති කිරීමට අවශ්‍ය (රේනස් ද ඇතුළුව) බෝකරන සතුන්, ඖෂධ, තැවිම් ආකල, යන්ත්‍ර සහ උපකරණ වැනි දේවල් ආනයනය කිරීම හා සැපයීම.
- මණ්ඩලයේ සාමාන්‍ය ව්‍යාපාරයට අනුයාතව මණ්ඩලය විසින් වැඩදායී ලෙස පවත්වා ගෙන යා හැකි යයි මණ්ඩලය අදහස් කරන සත්ව පාලන ගොවිපළවල් හා වෙනත් ව්‍යාපාර ආරම්භ කිරීම සහ පවත්වා ගෙන යාම.

මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන වාර්තාවට අනුව මණ්ඩලයේ අරමුණුගත කාර්යයන් ඉටුකිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ගොවිපල 17 ක හා ව්‍යාපෘති 05 කට අදාල ක්‍රියාකාරකම් 34 ක් සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබුණු අතර ගොවිපල 21 කට හා ව්‍යාපෘති 07 කට අදාලව ක්‍රියාකාරකම් 52 ක ප්‍රගතිය සියයට 2 ත් සියයට 49 ත් අතර, අඩු අගයන් ගෙන තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් ගොවිපොල 30 කට හා ව්‍යාපෘති 10කට අදාල ක්‍රියාකාරකම් 195ක් සම්බන්ධයෙන් කිසිම තොරතුරක් වාර්ෂික කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි.

### 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

මණ්ඩලය මගින් ක්‍රියාත්මක වෙලාඩ් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් වෙලාඩ් රූරල් එක්ස්පෝටඩ් පුද්ගලික සමාගම සමග ඇතිකරගත් 2010 අගෝස්තු 19 දිනැති ගිවිසුම අනුව 1 වන අදියර යටතේ 2011 වර්ෂයේදී රු.1,655,141,576 ක් හා 2014 ජුලි 24 දිනැති ගිවිසුම අනුව 11 වන අදියර යටතේ 2015 වර්ෂයේදී රු.2,654,764,898 ක් ලෙස එකතුව රු.4,309,906,474 ක ණය ලබාගෙන තිබුණි. ණය ආපසු ගෙවීමේදී 2015 වර්ෂය දක්වා එකතුව රු.52,956,140 ක පොළී මහා

භාණ්ඩාගාරයට ගෙවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ නමුත්, 2014 වර්ෂයේදී රු.12,000,000 ක් හා සමාලෝචිත වර්ෂයේදී රු. 9,000,000 ක් පමණක් ආපසු ගෙවා තිබුණි.

(ආ) වෙලාඩ් ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ කිරි ගවයන් ආනයනය කිරීම වෙනුවෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී රු. 2,654,764,898 ක් වැයකර තිබූ අතර, ඊට අදාලව සැපයුම් හා සේවාවන් සඳහා සුරක්ෂණ සහතික හා ගුණත්වය සම්බන්ධයෙන් තහවුරුවක් විගණනයේදී නිරීක්ෂණය නොවීය.

(ඇ) ඉහත ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේ ජූලි 13 හා ඔක්තෝබර් 12 යන දෙදින තුළදී රු 1,082,807,545 කට ආනයනය කරන ලද ගවයන් 2,495 දෙනෙකු රක්ෂණය නොකිරීම හේතුවෙන් 2016 මැයි 30 දින වන විට රු.57,720,803 ක ආනයනික වටිනාකමක් ඇති ගවයන් 133 දෙනෙකු මියයාම හේතුවෙන් එම වටිනාකමින් රජයට අලාභයක් සිදුවී තිබුණි.

(ඇ) 2013 ජුනි 20 දිනැති වෙලාඩ් ව්‍යාපෘති ප්‍රාරම්භක රැස්වීම් වාර්තාව අනුව, ශ්‍රී ලංකාව තුළ සිදුකරනු ලබන ඉදිකිරීම් ලංකාවේ සම්මත මිල රේටයන් හා සැසඳීමේදී මිල අධික බව සිවිල් ඉංජිනේරු මහතා විසින් දන්වා ඇතත් ඒ සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ප්‍රමාණවත් අවධානය යොමුකර නොතිබුණි. ඒ බව ඉදිකිරීම් හා මිලදීගැනීම් වලට අදාළව පිළියෙල කර ඇති පිරිවිතරයන් ගේ අසම්පූර්ණත්වය හා එම කාර්යයන්ගේ ගුණත්වය ඉතා පහල මට්ටමකට පැවතීම අනුව නිරීක්ෂණය විය. තවද ඉදිකිරීම් හා සේවාවන් සැපයීම සඳහා ගෙවා තිබූ රු.552,833,123 ක ගෙවීම් තහවුරු කිරීමට අදාළව තොරතුරු හා ලිපි ලේඛන, කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් පහත කරුණු වැඩිදුරටත් නිරීක්ෂණය කෙරේ.

(i) ව්‍යාපෘති ඇස්තමේන්තුවට අනුව පළල දක්වා නොතිබුණු දිග කිලෝමීටර් 5 ක බොරළු සහිත මාර්ගයක් සැකසීම සඳහා එජඩො 90,125.43 කට සමාන රු.12,251,651 ක් වෙන්කර තිබුණි. සම්මත රේටයන් අනුව ඉදිකර තිබූ මාර්ගයෙහි පළල මීටර් 3 ක් හා දිග කිලෝමීටර් 4.9 ක් වූ අතර ඒ අනුව ඝන මීටර් 4410 ක් සඳහා පිරිවැය රු.1,450,228 ක් විය. නමුත් ඒ සඳහා රු.12,037,342 ක් ගෙවීම හේතුවෙන් රු.10,587,114 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ii) ගොඩනැගිලි/ මඩු අළුත්වැඩියා කිරීම සඳහා පිරිවිතරයෙහි කිසිදු විස්තරයක් සඳහන් නොවූ අතර ඒ සඳහා එජඩො 1,114,888.89 ක් වෙන්කර තිබුණි. ගව පැටවුන් සඳහා 1'' x 2'' ලී (කල් පැවතිය නොහැකි) භාවිතයෙන් සාදන ලද කුඩු





600 ක් සෑදීම, කැඩුණු ඇස්බැස්ටෝ තහඩු වෙනුවෙන් අළුත් තහඩු නැවත ඇතිරීම, විදුලි පංකා කිහිපයක් සවිකිරීම හා කොන්ක්‍රීට් බංකරයන් සැකසීම පමණක් සිදුකර ඒ සඳහා රු.146,161,872 ක් එම සමාගමට ගෙවා තිබුණි.

(iii) මණ්ඩලය සතු වාහනවලින් අයකරන රේටයන් අනුව, හම්බන්තොට වරායේ සිට රිදියගම ගොවිපලට කිලෝමීටර් 38 ක දුරක් කිරි ගවයින් 2500 ක් ප්‍රවාහනය කිරීම සඳහා වැයවන සාමාන්‍ය පිරිවැය රු.570,000 ක් වුවද ඒ සඳහා එජඩො 260,555 කට සමාන රු.35,419,847 ක් ඇස්තමේන්තු කර තිබුණි. කිරි ගවයින් 2495 ක් මණ්ඩලය සතු රථ මගින් ප්‍රවාහනයට වැය කල යුතු මුදල රු.568,860 ක් වුවත් ඒ සඳහා රු.33,417,187 ක් ලෙස අධික ගෙවීමක් සිදු කර තිබුණි.

(iv) මෙම ව්‍යාපෘතිය යටතේ මානව සම්පත් සංවර්ධනය සඳහා එජඩො 100,000 ක් වෙන්කර තිබූ අතර 2015 දෙසැම්බර් 31 දින වන විට එජඩො 95,000 කට සමාන රු. 13,193,449 ක් මණ්ඩලය විසින් වෙලාඩ් රූරල් එක්ස්පෝට්ඩ් පුද්ගලික සමාගමට ප්‍රතිපූරණය කර තිබුණි. එම වියදමට සාපේක්ෂව ලබාදී ඇති පුහුණු හා විදේශ ගමන් සඳහා දැරූ වියදම් සත්‍ය වශයෙන් දැරූ බවට තහවුරු කර ගැනීමකින් තොරව මුදල් ප්‍රතිපූර්ණය කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(v) ව්‍යාපෘතියේ පිරිවිතරයට අනුව වගා ළිං 6ක් සඳහා එජඩො 31267 ක් වෙන්කර තිබූ නමුත් එක් වගා ළිඳක් හා නළ ළිං 2ක් පමණක් නිමකර තිබුණි. ඒ අනුව එජඩො 15,633 ක් පමණක් ගෙවිය යුතු වුවද එජඩො 29,703 කට සමාන රු.4,110,523 ක් ප්‍රතිපූරණය කිරීම හේතුවෙන් එජඩො 14,070 කට සමාන රු.1,947,147 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා වෙලාඩ් රූරල් එක්ස්පෝට්ඩ් පුද්ගලික සමාගම අතර ඇතිකර ගෙන තිබූ ගිවිසුම අනුව ආනයනය කරනු ලබන කිරි ගවයන් මාස 2 ත් මාස 6 ත් අතර ගැබ් ගත් සතුන් විය යුතුය. එහෙත් ආනයනය කරන ලද සතුන් 2500 න් 142 ක් ගැබ් නොගත් සතුන් වූ අතර මින් 79 ක් මිලදී ගෙන මාස 06 ක් ගතවී එනම් විගණිත දිනය වන 2016 මැයි 30 දින තෙක්ම ගැබ් ගෙන නොමැති බව දක්වා තිබුණි. ඒ අනුව එම සතුන් සඳහා දැරූ පිරිවැය වන රු.34,285,289 ක් නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය.

(ඊ) පළමු වර ගැබ්ගැනීමෙන් පසු කිරි ලබා දීම දින 25 ත් දින 190 ත් අතර නැවතී ඇති (සාමාන්‍ය කිරි ලබා දෙන කාලය දින 300 කි) එළ ගවයින් දෙවන වර ගැබ්ගැන්වීමේ ක්‍රියාවලියේදී සාමාන්‍ය කෘතිම සිංචන ක්‍රියාවලිය සාර්ථක විය යුතු වාර 1ත් 2ත් වුවද එම සීමාව ඉක්මවා කෘතිම සිංචනය වාර 4 ත් 8ත් අතර සිදුකර තිබියදීත් 2016 ජූලි 03 දින වන විට ගැබ්ගෙන නොමැති ආනයනික ගවයින් සංඛ්‍යාව 260 ක් බව නිරීක්ෂණය විය. මෙය ආනයනික ගවයින්ගෙන් සියයට 10 ක් ඉක්මවා තිබූ අතර ඒ අනුව එම සතුන් සඳහා වැය කල මුදලට ප්‍රතිලාභයක් නොමැති බව නිරීක්ෂණය විය.

(උ) ඒක පුද්ගල කිරි පරිභෝජනය වැඩි කිරීමේ අරමුණින් 2012 වර්ෂයේදී පළමුවන අදියර යටතේ ආනයනය කරන ලද කිරි ගවයින් 2000 ක් සාර්ථකව දේශීය පරිසරයට අනුගත වී ඇති බැව් දක්වා දෙවන අදියර යටතේ කිරි ගවයින් 2500 ක් සමාලෝචිත වර්ෂයේදී ආනයනය කර තිබුණි. කිරි ගවයින් ආනයනයට අදාලව සිදුකල ශක්‍යතා අධ්‍යයන වාර්තාව අනුව ආනයනික එක් කිරි ගවයකුගෙන් දිනකට අපේක්ෂිත කිරි ප්‍රමාණයේ සාමාන්‍යය, ලීටර් 20 ක් ලෙස තක්සේරු කර තිබුණි. නමුත් 2016 දෙසැම්බර් මාසය වන විට දිනකට ලබාගන්නා සාමාන්‍ය කිරි ප්‍රමාණය පළමුවන අදියරේ 2012 වර්ෂයේ ආනයනය කල සතුන් ගෙන් ලීටර 11 ක් හා දෙවන අදියරේ 2015 වර්ෂයේ ආනයනය කල සතුන් ගෙන් ලීටර 12 ක් පමණි. ඒ අනුව මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත කිරි නිෂ්පාදනය සිදුනොවන බව නිරීක්ෂණය විය.

## 4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පොල් සංවර්ධන අධිකාරිය මගින් පවත්වනු ලබන පොල් වෙන්දේසි වලදී අධිකාරිය මගින් නිකුත්කර ඇති නීති මාලාවන්ට අනුව කටයුතු නොකිරීම හේතුවෙන් පොල් අලෙවිය සඳහා වූ තැරැව්කරුවන්ගෙන් අය විය යුතු ණය රු.19,382,257ක ශේෂයන් අයකර නොගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පොල් අලෙවිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය විය යුතු රු. 19,382,256 ක ණයගැති ශේෂය තුල අවුරුදු 3ට වැඩි 5 ට අඩු රු. 2,690,396 ක හඳුනා නොගත් ශේෂයන් වූ අතර රු.5,821,542 ක් අයකර ගැනීම සඳහා පමණක් නීතිමය පියවර ගෙන තිබුණි. වසර 05 ක් ඉක්මවූ රු.4,719,346 ක ශේෂය අයකර ගැනීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.







(ii) ඉහත දක්වා ඇති නීති මාලාවේ 24 වගන්තිය අනුව ගණනය කර ගිණුම්ගත කර තිබූ රු. 4,524,254 ක් වූ දඩ මුදල වසර 04 ත් වසර 10 ත් අතර කාලයක සිට අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කර නොතිබූනු අතර එම තැරැව්කරුවන් සඳහා මණ්ඩලය විසින් දිගින් දිගටම පොල් තොග ලබා දී තිබුණි.

(ආ) කිරි ව්‍යාපෘතියට අදාලව අලෙවිසැල් ආරම්භ කිරීමට ප්‍රථම ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබීම හේතුවෙන් 2002 වර්ෂයේදී ආරම්භ කර තිබූ අලෙවිසැල් 115කින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ක්‍රියාත්මකව පවතින අලෙවි සැල් සංඛ්‍යාව 43 ක් විය. අලෙවිසැල් 21 කින් සමාලෝචිත වර්ෂය තුළ රු. 2,832,709 ක අලාභ ලබා තිබුණි.

(ඇ) 1992 වර්ෂයේ සිට ප්‍රයෝජනයට ගනු ලබන රිදියගම ගොවිපල පවත්වාගෙන යනු ලබන ඉඩමේ හිමිකම, මණ්ඩලයට පවරා ගැනීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

(ඈ) අඹේවෙල ගොවිපල වෙනුවෙන් 1992 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරයෙන් ලබා ගෙන තිබුණු රු.50,000,000 ක පොළී රහිත ණය මුදල 2001 ඔක්තෝබර් 03 දින ගොවිපල පෞද්ගලීකරණයේදී නිරවුල් කර නොතිබුණු අතර, ණය මුදල පියවීම සඳහා 2016 අගෝස්තු 31 දින දක්වා ම ඉදිරි වැඩපිළිවෙලක් සකස්කර නොතිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

කන්තලේ උක් වගා භූමියේ අක්කර 1,000 ක ඉඩමේ බඩ ඉරිගු ව්‍යාපෘතියක් වෙනුවෙන් නැගෙනහිර නවෝදය යටතේ චක්‍රීය අරමුදලක් ඇති කිරීමට 2007 ජූනි 28 දින මණ්ඩලය වෙත රු.මිලියන 37.55 ක් ලබා දී තිබුණි. 2011 සැප්තැම්බර් 11 දින වන විට එම ව්‍යාපෘතිය අසාර්ථක වීම හේතුවෙන් එම චක්‍රීය අරමුදලේ පැවති රු.17,549,342 ක ශේෂය 2007 ජූනි 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයට ලබා දිය යුතු වුවත්, එසේ කටයුතු නොකොට එම ශේෂයෙන් රු.13,295,637 ක් ස්ථාවර තැන්පතු යටතේ තැන්පත් කර තිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

විගණනය විසින් 2012 වර්ෂයේ සිට පෙන්වාදී ඇති ගොවිපලවල පිහිටි මණ්ඩලයට අයත් නිවාස 45 ක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පවතින බව සමාලෝචිත වර්ෂය අවසානයේදී නිරීක්ෂණය විය.

## 4.6 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/ දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම

1974 හා 1992 යන වර්ෂවල සිට පවත්වාගෙන යන ගොවිපල 24 කට අයත් ඉඩම්වල අයිතිය විධිමත් පරිදි පවරා ගැනීමකින් තොරව මණ්ඩලය විසින් රු. 174,695,645 ක් වටිනා ගොඩනැගිලි හා රු. 667,853,151ක් වටිනා ව්‍යුහයන් ඉදිකර තිබුණි.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

2007 අගෝස්තු 24 දිනැති අංක 9 / 2007 (1) ඩී දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (i) හා (iv) ඡේදයට අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව හා 2007 නොවැම්බර් මස නිකුත් කල උපදේශන සේවා ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී වයස අවුරුදු 60 ඉක්මවූ නිලධාරීන් 4 දෙනෙකු ඇතුලුව 5 දෙනෙකු උපදේශකයින් ලෙස කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගෙන තිබුණි. මෙසේ පත් කරගෙන තිබූ උපදේශකයින් අතරින් පශු වෛද්‍ය උපදේශකවරයා හැර සෙසු උපදේශකවරුන් හට සේවා කොන්දේසි (Terms of reference) ලබා දී නොතිබුණි. එසේම උපදේශකවරුන්ගේ කාර්යසාධන වාර්තා හා පැමිණීම් පිළිබඳ වාර්තා සනාථ කරගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ රු. 1,305,665 ක් දීමනා ලෙස ගෙවා තිබුණි.

## 4.8 වෙළඳපල දායකත්වය

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළ රටෙහි සමස්ත කිරි නිෂ්පාදනය ලීටර 374,443,200 ක් වූ අතර එයින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කිරි නිෂ්පාදනය ලීටර 11,040,015 ක් පමණක් විය. ඒ අනුව කිරි නිෂ්පාදනය සඳහා වූ මණ්ඩලයේ දායකත්වය සියයට 3 ක් පමණක් විය.







## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත 2016 සැප්තැම්බර් 06 දින ඉදිරිපත් කර තිබුණි.

### 5.2 සංයුක්ත සැලැස්ම

2003 ජූනි 2 දිනැති අංක පීඊඞී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය හා 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.3 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5(2) ඡේදය ප්‍රකාරව සංයුක්ත සැලැස්ම පදනම් කරගෙන ඉදිරි මුදල් වර්ෂයේ ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුළත් කර සමස්ත ආයතනයට ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය හා අනෙකුත් ව්‍යාපෘති 4 හි ක්‍රියාකාරකම් ඇතුලත් කිරීමකින් තොරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි.

### 5.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

කැළෑ එළිපෙහෙලි කිරීමට අදාලව ඇස්තමේන්තු සකස් කර විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබූ අතර අවස්ථා 3 කදී අක්කර 460 ක භූමියක් එළිපෙහෙලි කිරීමට මිල ගණන් කැඳවීමකින් තොරව අක්කරයකට රු.2,000 සිට රු.16,750 ක් දක්වා වූ මිල ගණන් යටතේ විනිවිදභාවයෙන් තොරව කොන්ත්‍රාත් ලබා දී තිබුණි.

## 5.5 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදේශ බැංකු ණය මත ක්‍රියාත්මක වෙලාඬ එළගව ව්‍යාපෘතිය මගින් 2013 වර්ෂයේදී වැය කර මැණික් පාළම ගොවිපල යටතේ ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කරන ලද රු 80,604,253 ක් 2014 වර්ෂයේදී අයභාර වියදමක් ලෙස සමුච්චිත ආදායමට කපාහැර තිබුණි. මෙම වියදම අය භාර වියදමක් ලෙස ලියා හැරීමට හේතුන් සහ එම වියදම තහවුරු කිරීමට අදාල කිසිදු සාක්ෂියක් විගණනයට 2016 දෙසැම්බර් 20 දක්වාම ඉදිරිපත් නොවීය.

(ආ) මණ්ඩලයට අයත් ගොවිපලවල තිබෙන නිවාස 70ක සිටින අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයා වෙත යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගොවිපල විකුණුම් පාලනය | (i) රිදියගම ගොවිපලේ බවුසර මගින් කිරි නිකුත් කිරීමේදී මුරකරුට පරීක්ෂා කළ හැකි වන පරිදි නිකුත් නියෝගයෙහි පිටපතක් මුරකරු වෙත ඉදිරිපත් නොකිරීම හා ඔහු වෙත ලබා දී ඇති පිටපත් පරීක්ෂා කළ බවට තහවුරු නොකීරීම. |
| | | (ii) නිකුත් කිරීමේ නියෝගයන් අනුක්‍රමික අංක අනුව හා නිසි අධිකාරි බලයකින් තොරව නිකුත් කිරීම. |
| | | (iii) කිරි බවුසර්වල යොදා ඇති මුද්‍රාවේ අංකය නිකුත් කිරීමේ නියෝගයේ සඳහන් නොකිරීම. |
| | | (iv) කිරි විකුණුම් සඳහා බිල්පත් නිකුත් කිරීම වෙනුවට මිලදී ගත් ආයතනය වෙත ලැබුණු කිරි ප්‍රමාණය අනුව ඔවුන් විසින් පිළියෙල කරනු ලබන බිල්පතට අනුව ගොවිපලේ විකුණුම් සටහන් කොට මුදල් ලබා ගැනීම. |
| (ආ) | ගොවිපල තොග පාලනය | විධිමත් ලිඛිත අනුමැතියකින් තොරව ඖෂධ තොග නිකුත් කිරීම. |
| (ඇ) | ගොවිපල ගිණුම් පාලනය | (i) ගොවිපල ගිණුම් සමග ජර්නල් වවුචර් ඉදිරිපත් කර නොතිබීම. |
| | | (ii) ගොවිපලවල ගනුදෙනු ගිණුම්ගත කිරීම හා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ඒකාකාරී ගිණුම් ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබීම. |
| | | (iii) බැංකු සැසඳුම් නිවැරදිව පිළියෙල කර නොතිබීම. |
| | | (iv) ගොවිපල මූල්‍ය ප්‍රකාශයන්හි අයිතම හා අදාල ශේෂ පිරික්සුමේ ශේෂ අතර එකඟ නොවීම් (වෙනස්කම්) පැවතීම. |
| (ඈ) | ව්‍යාපෘති විකුණුම් පාලනය | කිරි ව්‍යාපෘතිය යටතේ අලෙවි කිරීමට නියමිත කිරි සම්බන්ධව ඇණවුම් කිරීම, නිකුත් කිරීමේ නියෝග පිළියෙල කිරීම, භාණ්ඩ ලබා ගැනීම, බැහැරට ගෙනයෑම් තුණ්ඩු පිළියෙල කිරීම ආදි සියළු කටයුතු එක් නිලධාරියකු විසින් සිදු කිරීම. |







AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති



# 2015 වසර සඳහා

# මානව සම්පත් ක්‍රියාකාරකම්

## 2015 වර්ෂයේ මානව සම්පත් අංශයෙන් සිදු කරන ලද ක්‍රියාකාරකම්

### ■ නව බඳවාගැනීම 2015

පශු වෛද්‍යවරුන්, සහකාර කළමනාකාර (කිරි ව්‍යාපෘතිය), සහකාර කළමනාකාරිණී (සැපයුම්) යන තනතුරු සඳහා 2015 වසරේ නිලධාරීන් බඳවා ගෙන ඇත.

| | | |
|---|---|---|
| පශු වෛද්‍ය | - | 06 |
| සහකාර කළමනාකාර(කිරි ව්‍යාපෘතිය) | - | 01 |
| සහකාර කළමනාකාරිණී(සැපයුම්) | - | 01 |

චෙක්රෝල්/අභ්‍යාසලාභී පදනම මත සේවයේ නිරත වූ කළමනාකරණ සහකාර, සහකාර වතු අධිකාරී, ක්ෂේත්‍ර / පශු සහකාර, රියදුරු, අලෙවි සහායක, කාර්යාල සහායක සේවක මහත්ම/මහත්මීන් 13 දෙනෙකු ස්ථිර සේවයට අනුයක්ත කිරීම.

| | | |
|---|---|---|
| කළමනාකරණ සහකාර | - | 02 |
| සහකාර වතු අධිකාරී | - | 03 |
| ක්ෂේත්‍ර / පශු සහකාර | - | 02 |
| රියදුරු | - | 04 |
| අලෙවි සහායක | - | 01 |
| කාර්යාල සහායක | - | 01 |

### ■ කාර්යක්ෂමතා කඩඉම් විභාග 2015

සේවය ස්ථිර කිරීම සඳහා හා අන්තර් ශ්‍රේණි උසස්වීම් ලබා දීමට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම.

### ■ සුබසාධන කටයුතු 2015

1. 2015 අප්‍රේල් මස 02 වන දින බුදු මැදුර ස්ථාපනය කිරීම සහ ධර්ම දේශණයක් පැවැත්වීම.
2. 2015/12/28 කිරිබත්ගොඩ ක්ලැරියන් හෝටලයේ වාර්ෂික සුහද හමුවක් පැවැත්වීම.
3. ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
4. 2015/06/03 පොසොන් පොහොය නිමිත්තෙන් ප්‍රධාන කාර්යාලීය පරිශ්‍රයේ දන්සැලක් සංවිධානය කිරීම.





| | පුහුණුව / වැඩමුළුව | දිනය | සහභාගීවූවන් |
|---|---|---|---|
| 1 | රජයේ දේපල හානි | 12 පෙබරවාරි 2015 | 5 |
| 2 | මූලික ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 31 මාර්තු 2015 | 1 |
| 3 | රාජ්‍ය දේපල රක්‍ෂණය | 20 මාර්තු 2015 | 1 |
| 4 | ආසියානු ප්‍රධාන විගණන විධායක නායකත්ව සමුලුව | 01 ජූනි 2015 | 2 |
| 5 | විනය ක්‍රියාපටිපාටිය | 10 ජූනි 2015 | 2 |
| 6 | ධනාත්මක චින්තනය | 16/17 ජූනි 2015 | 2 |
| 7 | ඵලදායිතා සංවර්ධනය | 29/30 ජූනි 2015 | 4 |
| 8 | ප්‍රවාහන කළමණාකරනය | 22 ජූලි 2015 | 1 |
| 9 | කාර්යාල උපකරණ කළමණාකරනය | 14/15 සැප්තැම්බර් 2015 | 2 |
| 10 | මූල්‍ය වාර්තා (අවසන් ගිණුම්) | 29 සැප්තැම්බර් 2015 | 5 |
| 11 | ටෙන්ඩර් පටිපාටිය/ලංසු ඉදිරිපත් කිරීම/ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 20 ඔක්තොබර් 2015 | 46 (සියළුම ගොවිපළ) |
| 12 | කාර්යාල පරිපාලනය හා ගොනු පද්ධතිය | | 53 (සියළුම ගොවිපළ) |
| 13 | කාර්යාල පරිපාලනය හා ගොනු පද්ධතිය | 11 නොවැම්බර් 2015 | 70 (සියළුම ගොවිපළ) |
| 14 | ටෙන්ඩර් පටිපාටිය/ලංසු ඉදිරිපත් කිරීම/ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 19 දෙසැම්බර් 2015 | 46 (සියළුම ගොවිපළ) |

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

தேசிய கால்நடை வள அபிவிருத்தி சபை

National Livestock Development Board



නො: 40, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05

இல. 40, நாவல வீதி, நாராஹேன்பிட்டி, கொழும்பு 5,

No: 40, Nawala Road, Narahenpita, Colombo 05

PRINTEC - 0112 815 816